# වාර්ෂික වාර්තාව
# 2013

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

**ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය**

<u>අන්තර්ගතය</u> <u>පිටුඅංක</u>


අ. පොදු

| | |
|---|---|
| අපගේ දැක්ම, අපගේ මෙහෙවර, අපගේ පරමාර්ථ | 3-4 |
| සාමාන්‍යාධිකාරිගේ ප්‍රකාශය | 5-6 |
| සංස්ථාපිත තොරතුරු | 7 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 8 |
| සංස්ථාපිත කළමණාකරණය | 9 |
| අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම් | 10-12 |

ආ. සංස්ථාපිත පාලනය

| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | 13 |
| විගණන හා කළමණාකරණ කමිටුව | 13 |
| අභ්‍යන්තර පාලනය | 13 |
| විධායක කළමණාකරණය | 14 |
| අවදානම් කළමණාකරණය | 14 |
| පාරිසරික ගැටළු | 15 |

ඇ. මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

| | |
|---|---|
| නිවාස සංවර්ධනය | 16-21 |
| දේපළ කළමණාකරණ හා අලෙවිය | 21-22 |
| ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් | 23-33 |
| මානව සම්පත් කළමණාකරණය | 33-39 |
| නීති | 39-40 |
| සැලසුම් හා ප්‍රගති | 40-41 |

ඈ. මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

| | |
|---|---|
| ණය අයකිරීම් ක්‍රියාකාරකම් 2013 - ග්‍රාමීය නිවාස | 41-43 |
| නාගරික නිවාස සාප්පු/ණය වාරික සහ කුලී අයකිරීම් 2013 ක්‍රියාකාරිත්වය | 44 |
| තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය | 45-48 |
| තොරතුරු තාක්ෂණය | 48-50 |
| ඕෂන්වීව් ඩිවලොප්මන්ට් සමාගම | 50-51 |

ඉ. මූල්‍යමය ප්‍රකාශන

| | |
|---|---|
| මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය | 52 |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 53 |
| ගිණුම් ප්‍රතිපත්ති | 54-58 |
| මූල්‍යමය ප්‍රකාශනවලට සටහන් | 59-86 |

| | |
|---|---|
| ඊ. දිස්ත්‍රික් කාර්යාල තොරතුරු | **87-89** |
| උ. විගණකාධිපති වාර්තාව | **90-103** |

## (අ) පොදු

## හැඳින්වීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මගින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු කරගෙනයාම සඳහා ස්ථාපිත කර ඇත.

මෙම අධිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ නාගරික කාර්යාල 02 ක් මගින් දිවයින පුරා කටයුතු කරගෙන යනු ලැබේ.

## අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුරක්ෂිත නිවසක් හිමිකර දීම.

## අපගේ මෙහෙවර

ශ්‍රී ලංකා ජනතාවගේ විශේෂයෙන්ම නිවසක් සතුකර ගැනීමට මාර්ගයක් නොමැති අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ජාතික වශයෙන් උනන්දු කරවීම, පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම, එමඟින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපතක් කරලීම හා ආර්ථික සමෘද්ධිය ලඟා කරදීම සඳහා කටයුතු කිරීම.

## අරමුණු

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත අනුව අපගේ අරමුණුවන්නේ

- මහල් නිවාස, නිවාස හෝ වෙනත් වාසස්ථාන හෝ ගොඩනැගිලි ඉදිකිරීමෙහිලා කෙළින්ම නියුක්තවීම.
- නිවාස හිඟය අඩුකිරීම පිණිස නිවාස සංවර්ධන යෝජනා ක්‍රම පිහිටුවීමට සැලැස්මවල් සකස් කිරීම.
- මුඩුක්කු හා පැල්පත් සහිත ප්‍රදේශවලින් එම මුඩුක්කු සහ පැල්පත් ඉවත්කිරීමේ සහ ඒ ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීමේ කටයුතු සැලැස්වීම.
- නිවාස සංවර්ධනයට රුකුල්දීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවක් ක්‍රියාවේ යෙදවීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනය සඳහා යම් තැනැත්තකුට ඉඩම් ලබාදීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවකට සමානවන යම් ක්‍රියාකාරකමක නියුක්ත තැනැත්තන්ට මුදල් හෝ වෙනත් පහසුකම් සැපයීම.
- නිවාස සංවර්ධනයෙහි සියළු අංශවලට අදාළවන ක්‍රියාකාරකම්වල නිරතවීම, ඒවාට අනුබලදීම සහ ඒ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ
- ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකරවිය හැකි වෙනත් සියළු ක්‍රියා කිරීම.

## අපගේ පරමාර්ථ

- අඩු ආදායම්ලාභී පවුල්වලට ණය / ආධාර ලබාදීම තුලින් නව නිවසක් ඉදිකරගැනීමට හා ප්‍රමිතියෙන් තොර වාසස්ථාන වැඩිදියුණු කරගැනීමට උපකාර කිරීම.
- මධ්‍යම ආදායම්ලාභීන් සඳහා දැරිය හැකි මිලකට පෞද්ගලික අංශය සමඟ හවුල්කාරිත්වය තුළින් නිවාස සැපයීම.
- නාගරික නිවාස ක්‍රම නවීකරණ සහ පුනස්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මුළු දිවයිනම ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභීන්හට නිවාස ඉදිකිරීම් සඳහා උපදේශන සේවාලබාදීම.
- නිවාස හා සම්බන්ධිත යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවලදී බාහිර ආයතනවලට අවශ්‍ය උපදේශන සේවා සැපයීම.
- පිරිමැසුම්දායක ඉදිකිරීම් තාක්ෂණය ව්‍යාප්ත කිරීම සහ රැකියා ආශ්‍රිත පුහුණුවීම් මඟින් පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීම.
- පදිංචිකරුවන්ගේ දේපල අයිතිය තහවුරු කිරීම.
- සංවර්ධනයට සම්බන්ධ සියළුම අංශවල කටයුතු ක්‍රියාත්මක කිරීම,වැඩි දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- ඉහත අරමුණු යම් ප්‍රමාණයක් හෝ සියල්ලම සපුරා ගැනීමට අවශ්‍ය අයුරින් හා සුදුසු පරිදි කටයුතු කිරීම.

## සාමාන්‍යාධිකාරීගේ ප්‍රකාශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය රටේ පැවති නිවාස අවශ්‍යතාවය කඩිනමින් සපුරාලීම සඳහා 1979 අප්‍රේල් මස 01 වන දින 1979 අංක 17 දරණ පනත මඟින් ස්ථාපිත කරන ලදී. මෙම වකවානුවේ නිවාස ලක්ෂයක් ඉදිකිරීමේ ජාතික ඉලක්කය නිවාස අධිකාරිය වෙත පැවරුණි. ඉන්පසු නිවාස දස ලක්ෂය, පහලොස් ලක්ෂය ආදී වැඩ සටහන් මෙහෙයවීමෙන් මේ රටේ ජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටයුතු කරන ලදී.

2010 වර්ෂයේ නව රජය බලයට පත්වීමත් සමඟ නිවාස සංවර්ධන අධිකාරියේ කාර්ය භාරය වඩාත් සැලසුම්සහගතව ඉදිරියට ගෙනයාමට කටයුතු කරන ලදී. විශේෂයෙන්ම ගරු ඉදිකිරීම්, ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ මෙම අධිකාරිය සීඝ්‍ර වර්ධනයක් කරා මෙහෙයවීමට අවස්ථාවක් ලැබී ඇත.

2010 වර්ෂය තුල නිවාස සංවර්ධන අධිකාරියේ අනාගත සැලසුම් සකස් කර 2011 වර්ෂයේ සිට එම සැලසුම් ක්‍රියාවට නංවන ලදී. 2011 වර්ෂය තුල නිවාස 26,277 ක් සංවර්ධනය කරමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එතෙක් ඉතිහාසයේ වැඩි මුදලක් ආයෝජනය කල වසරක් ලෙසට පත්වෙමින් රු.මි.3402.84 ක් නිවාස සංවර්ධනය සඳහා ආයෝජනය කරන ලදී. 2012 වසර තුල මෙම සංවර්ධන කටයුතු තවදුරටත් වර්ධනය කරගනිමින් නිවාස 30630 ක් සංවර්ධනය කර රු.මි. 6208 ක් ආයෝජනය කරන ලදී. 2013 වසර තුල මෙම වැඩ සටහන සාර්ථකව පවත්වාගෙන යමින් නිවාස 19148 ක් සංවර්ධනය සඳහා රු.මි. 6370.0 ක් ආයෝජනය කරන ලදී. මෙම සුවිශේෂී ආයෝජනයන් මඟින් ජනතාවගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදීමට හැකිවිය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නැවත ඔසවා තැබීමට වර්තමාන ඉහල කළමනාකාරිත්වය කටයුතු කල අතර, ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් ඒ සඳහා දායකවීමට හැකිවීම පිළිබඳව මා නිහතමානීව සතුටු වෙමි.

සේවා සපයන ආයතනයක් වශයෙන් අධිකාරිය මුහුණ දුන් ප්‍රධාන අභියෝගය වූයේ නිවාස සංවර්ධනය සඳහා අවශ්‍ය අරමුදල් ඌණතාවයයි. 2011 වර්ෂයේ සිට මෙම තත්ත්වය වෙනස් කරමින් මූල්‍ය කළමනාකරණය කාර්යක්ෂම කිරීම හා විවිධ මූලාශ්‍ර මඟින් ආයෝජන වර්ධනය කරගනිමින් වත්කම් ඉහල නැංවීමට කටයුතු කරන ලදී. ඒ අනුව 2010 වර්ෂයේ රු.මි. 10291.0 ක් වූ මුළු වත්කම් වටිනාකම 2011 වර්ෂයේදී රු.මි. 12421.0 ක් ද 2012 වර්ෂයේදී රු.මි.14608.0 ක් ද 2013 වර්ෂයේදී රු.මි.17869 ක් ද වශයෙන් වර්ධනය කර ගැනීමට හැකිවිය.

2010 වර්ෂයේදී ලද ආදායම රු.මි. 455.709 ක් වු අතර, 2011 වසරේදී රු.මි.786.0 ක්ද, 2012 රු.මි. 1431 ක්ද, 2013 වර්ෂයේදී රු.මි. 1940.0 ක්ද වශයෙන් වර්ධනය කරගැනීමට හැකිවීම අපගත් උත්සාහයේ ප්‍රතිඵලයකි.

අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය වන ණය අයකිරීම් කාර්යක්ෂම කිරීම තුල ද්‍රවශීලතාවය රැකගැනීමටත්, අක්‍රීය ණය ශේෂය අඩුකර ගැනීමටත් හැකිවීමෙන් අප කෙරෙහි තැබූ විශ්වාසය තවදුරටත් තහවුරු විය.

මානව සම්පත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වටිනාම සම්පතයි යන්න මාගේ හැඟීමයි. අප අධිකාරියේ සභාපතිතුමා ඇතුළු කළමනාකාරිත්වයේ විශේෂ අවධානය මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා යොමු වී ඇත. ඕනෑම ආයතනයක හෝ සංවිධානයක පැවැත්ම හා කාර්ය සාධනය රඳා පවතින්නේ එහි සේවකයින්ගේ ශක්තිය හා කාර්යක්ෂමතාවය මත යන්න අපගේ විශ්වාසයයි. ඒ අනුව 2010 වර්ෂය ආරම්භයේ සිටම සේවක පුහුණු වැඩ සටහන් වාර්ෂිකව පවත්වමින් නිරන්තර වෘත්තීය සංවර්ධන අවස්ථා ලබාදීම මඟින් මානව සම්පත් සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ 2000 ක් පමණ වන සේවක ප්‍රජාව අවුරුදු ගණනාවක් තුල තමන්ට හිමි උසස්වීම් නොලැබ මහත් පීඩනයකින් සිටි අතර, අප්‍රමාදව සම්මුඛ පරීක්ෂණ පවත්වා විශාල සංඛ්‍යාවකට උසස්වීම් ලබාදීමටද, පහළ තනතුරුවල සිටි උපාධිධාරීන් සඳහා උසස්වීම් ලබාදීම තුලින් නිසි තනතුරුවල පිහිටුවීමටද කටයුතු කරන ලදී. ආපදා ණය යෝජනා ක්‍රමය යලි ක්‍රියාත්මක කිරීම, කාර්මික නිලධාරින් හා අනිකුත් සේවක ප්‍රජාවගේ අවශ්‍යතා මත යතුරු පැදි ලබාදීම, තාක්ෂණ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම, ප්‍රසූත නිවාඩු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අනුකූලව ලබාදීම, විශේෂ දායකත්වයන් හා රාජකාරි කටයුතු සඳහා ලබා දෙන ලද දායකත්ව ඇගයීම් සඳහා විශේෂ වැඩ පිළිවෙලක් හඳුන්වාදීම සේවක සුභ සාධක සංගමයේ කටයුතු විධිමත් කරමින් ඵලදායිතාවය වැඩි කිරීම, සේවක ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කල ප්‍රධාන වැඩසටහන්වේ.

අධිකාරිය සතු ගොඩනැගිලි නොමැති දිස්ත්‍රික් කාර්යාල සඳහා කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම මෙම කාලපරිච්ඡේදය තුල භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා ගත් ප්‍රධාන ක්‍රියාමාර්ගයයි. මුලතිව්,මඩකලපුව,කිලිනොච්චිය, මාතර යන දිස්ත්‍රික් කාර්යාල සඳහා නව ගොඩනැගිලි ඉදිකරනලදී. මහනුවර දිස්ත්‍රික් කාර්යාලය පවත්වාගෙන යන මහලේකම් කාර්යාල සංකීර්ණය නවීකරණය කර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ගතවූ වර්ෂය තුල සිදු කල තවත් කාර්යයකි. අධිකාරියේ රාජකාරි කටයුතු සඳහා සේවකයින්ගේ නවාතැන් සඳහා යොදාගන්නා සංචාරක බංගලා නවීකරණය කර අවශ්‍ය උපකරණ ලබා දී අංගසම්පූර්ණ කරන ලදී. වසර ගණනාවක් තුල වාහන සංචිතය සඳහා නව වාහන එකතු කිරීමක් සිදුවී නොතිබුණි. එහෙත් 2012 වසරේ රාජ්‍ය භාණ්ඩාගාරය මැදිහත්වීම මත කැබ්රථ 18 ක් වාහන සංචිතයට එකතු කරමින් එම වාහන ග්‍රාමීය නිවාස වැඩ සටහන ශක්තිමත් කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත කිරීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි.

2014 වසර ජයග්‍රාහී වසරක් බවට පත් කර ගනිමින් එහි ප්‍රතිලාභ සේවක ප්‍රජාවට අත්කර දීමටත්, අප හමුවේ ඇති ජනතාවගේ නිවාස ගැටළුව විසඳීමේ අභියෝගයට සාර්ථකව මුහුණදීමටත් අදිටන් කර ගනිමු.

බ්‍රිගේඩියර් මහින්ද මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
සාමාන්‍යාධිකාරි
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

## සංස්ථාපිත තොරතුරු

| | |
|---|---|
| නම: | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| නෛතික භාවය: | 1979 අංක 17 දරණ පණත |
| සංස්ථාපිත වර්ෂය: | 1979 |
| ලියාපදිංචි කාර්යාලය: | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මහ ලේකම් කාර්යාලය<br>නො. 34, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත<br>කොළඹ 02 |
| දුරකථන අංක: | 2421606, 2431707, 2430410, 2431722<br>2421748, 2380874 |
| ෆැක්ස්: | 2434892 |
| විද්‍යුත් තැපැල: | dgmf@nhda.lk |
| වෙබ් අඩවිය: | www.nhda.lk |
| විගණකවරු: | විගණකාධිපති<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| උපදේශන නීතිඥවරු: | නීතිපති<br>නීතිපති දෙපාර්තමේන්තුව<br>හල්ස්ඩෝෆ්<br>කොළඹ 12. |
| බැංකුකරුවෝ: | ලංකා බැංකුව<br>ආයතනික ශාඛාව<br>ඇව්ලන් චතුරශ්‍රය<br>කොළඹ 01.<br>මහජන බැංකුව<br>මුලස්ථාන ශාඛාව<br>සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත<br>කොළඹ 02. |

## අධ්‍යක්ෂ මණ්ඩලය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩලය අමාත්‍යතුමා විසින් පත්කරන ලද සාමාජිකයන් 6 දෙනෙකුගෙන් සහ මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ලෙස තවත් සාමාජිකයෙක්ගෙන් සමන්විත වන අතර පත් කරනු ලැබූ සාමාජිකයන්ගෙන් එක් අයෙක් සභාපති ලෙස අමාත්‍යතුමා විසින් පත්කරනු ලැබේ.

| නම හා ලිපිනය | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|
| 1. එස් ඒ ජයන්ත සමරවීර මහතා<br>මාවල දකුණ<br>වාද්දුව | සභාපති | ජාතික නිවාස<br>සංවර්ධන<br>අධිකාරිය |
| 2. ඒ ඩබ් දයානන්ද මහතා<br>නො.639/3/ඒ,<br>ගුණවර්ධන මාවත,<br>බංගලාව හන්දිය,<br>පිටකෝට්ටේ<br>කෝට්ටේ | උප සභාපති | ජාතික නිවාස<br>සංවර්ධන<br>අධිකාරිය |
| 3. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා<br>ධර්මෝදය මාවත<br>පොතුවිල්පාර<br>මොණරාගල | ක්‍රියාකාරි අධ්‍යක්ෂ | ජාතික නිවාස<br>සංවර්ධන<br>අධිකාරිය |
| 4. වරුණි අප්සරා වල්පිට මහත්මිය<br>නො.121/17<br>බේස්ලයින් මාවත<br>කොළඹ 08 | සාමාජික | ජාතික ක්‍රමසම්පාදන<br>දෙපාර්මේන්තුව<br>පළමු මහල, මහලේකම්<br>කාර්යාලය, කොළඹ 01 |
| 5. වෛද්‍ය වසන්ත බණ්ඩාර මහතා<br>අංක 2/270, කොළඹ පාර<br>කුරුණෑගල | සාමාජික | ඉදිකිරීම්, ඉංජිනේරු<br>සේවා, නිවාස හා පොදු<br>පහසුකම් අමාත්‍යාංශය |
| 6. නීතිඥ රාජා ගුණරත්න මහතා<br>නො.150/05<br>හයිලෙවල් පාර<br>මහරගම | සාමාජික | නිවාස කොමසාරිස් -<br>ඉදිකිරීම්, ඉංජිනේරු<br>සේවා, නිවාස හා පොදු<br>පහසුකම් අමාත්‍යාංශය |
| 7. ඩබ් ඒ රංජිත් විල්වලආරච්චි මහතා<br>නො.15<br>4 වන පටුමග<br>රාජගිරිය | සාමාජික | ඉදිකිරීම්, ඉංජිනේරු<br>සේවා, නිවාස හා පොදු<br>පහසුකම් අමාත්‍යාංශය |

## සංස්ථාපිත කළමණාකරණය

**බ්‍රිගේඩියර් මහින්ද මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
සාමාන්‍යාධිකාරි

**ගාමිණී පන්නිලවිතාන මහතා**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සම්බන්ධීකරණ)

**එම් එස් වීරසිංහ මහත්මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)

**ර් ඒ ඩී එස් එදිරිසිංහ මහතා**
වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)

**ඩබ් ඒ ඩී සරත් කුමාර මහතා**
වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (දේපල කළමණාකරණ හා අලෙවි)

**ලලිත් එදිරිසිංහ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් කළමනාකරණ හා පාලන)

**පී එම් එස් කේ පතිරාජ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නිවාස සංවර්ධන)
(2013.08.21 දින දක්වා)

**කේ ඒ ජානක මහතා**
වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නිවාස සංවර්ධන)
(2013.08.27 දින සිට)

**කේ ඩබ් ඒ ධර්ම ශ්‍රී කාරියවසම් මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තොරතුරු හා ප්‍රචාරක)

**ඩබ් ධනචන්ද්‍ර මහතා**
සහකාර සාමාන්‍යාධිකාරි (සැලසුම් හා ප්‍රගති)

**ඒ කේ පුෂ්පා රෝහිණී මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරි (නීති)

**පී එම් ආර් මාරසිංහ මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක

**මනුජ කරුණාරත්න මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
(2013.06.10 දින දක්වා)

**නීතිඥ ධනුෂ්ක මාලින්ද ජයලත් මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
(2013.06.11 දින සිට)

## අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම්

අපගේ අරමුණු ඉටුකරගැනීම සඳහා මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 1. ණය හා ආධාර වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

අඩු ආදායම්ලාභීන් සඳහා සහනදායී පදනමට ණය පහසුකම් ලබාදීම.

රාජ්‍ය හා පෞද්ගලික අංශය හා ස්ථාවර ආදායම් ලබන පවුල් සඳහා ජනසෙවණ උපහාර ණය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.

අඩු ආදායම්ලාභීන් සඳහා ණය ආධාර නිවාස ව්‍යාපෘති ඉදිකිරීම.

දිළිඳු පවුල් සඳහා නිවාස ඉදිකිරීමට මූල්‍ය ආධාර ලබාදිම.

නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති සඳහා ණය හා ආධාර ලබාදීම.

### 2. රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශය හවුල්ව නිවාස ඉදිකිරීම වර්ධනය කිරීම

යෝග්‍ය භූමි හඳුනා ගැනීම.

කැමති පාර්ශවයන් කැඳවීම.

සුදුසු සංවර්ධකයින් සමඟ සාකච්ඡා කිරීම සහ යෝජනා ලබා ගැනීම.

යෝජනා ඇගයීම සහ සංවර්ධකයින් තෝරා ගැනීම.

ව්‍යාපෘති සැලසුම් නිර්මාණය කිරීම.

අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

ඒකාබද්ධ සමාගම් ඇතිකිරීම.

ක්‍රියාත්මක කිරීම, පාලනය කිරීම සහ තත්වය සහතික කිරීම.

අලෙවිකරණය සහ නිවාස විකුණුම්

කළමණාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.

### 3. නිවාස ඉදිකිරීම් හා සහාය සේවා සැපයීම

නිවාස යෝග්‍යතා අධ්‍යයනය කිරීම

ප්‍රජාව දැනුවත් කිරීම සහ සංවිධානය කිරීම

ප්‍රජා සංවර්ධන සංවිධාන නිර්මාණය කිරීම.

නිවාස ඉදිකිරීම් සඳහා අවශ්‍ය තාක්ෂණ සහාය ලබාදීම.

අඩු පිරිවැය ඉදිකිරීම් තාක්ෂණ ක්‍රමයන් ගැන තොරතුරු ව්‍යාප්ත කිරීම.

අවශ්‍යතාවය මත මූල්‍යමය සහාය සැපයීම.

ඉදිකිරීම්වල තත්වය / අනුකූලතාවය සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීම.

යටිතල පහසුකම් ඇතිකිරීම / සම්බන්ධතාවය පැවැත්වීම.

### 4. නාගරික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම (නිවාස ව්‍යාපෘති)

යෝග්‍ය ස්ථාන හඳුනා ගැනීම.

මැනුම් කටයුතු සිදුකිරීම.

මූල්‍යමය හැකියා මට්ටම් තීරණය කිරීම.

සැලසුම් පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

කළමණාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.

අයිතිය පැවරීම

## 5. නගමු පුරවර(මහල් නිවාස ප්‍රතිසංස්කරණය)වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

පැරණි මහල් නිවාස ක්‍රමවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

මහල් නිවාස අළුත්වැඩියා කිරීම.

මහල් නිවාසවල සිටින ජනතාවගේ අධ්‍යාත්මික ගුණධර්ම වැඩි දියුණු කර අලංකාර ජනාවාසයක් බවට පත්කිරීම සඳහා ක්‍රිඩා පිටි, ශාරීරික යෝගත්‍යා මධ්‍යස්ථාන, උද්‍යාන අලංකාරකරණය, බුදුමැදුරු අළුතින් ඉදිකිරීම.

## 6. ඉඩම් කට්ටි ලබාදීම

යෝග්‍ය භූමි හඳුනා ගැනීම.

යෝග්‍යතා අධ්‍යයනය කිරීම.

කැබැලි සැලසුම් පිලියෙල කිරීම

අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

ඉඩම්ලාභීන් හඳුනාගැනීම සහ තෝරා ගැනීම.

අවශ්‍යවේනම් ණය දෙන ආයතන සමඟ සම්බන්ධතාවය ඇතිකරගැනීම.

තෝරාගත් ඉඩම්ලාභීන්ට ඉඩම් කට්ටි පැවරීම.

## 7. ණය අයකිරීම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

ණය හා කුලී ආදායම් ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කීරිම්.

වාර්ෂික ඉලක්ක ලබාදීම, ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම, ඊට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

මාසික ප්‍රගති සමාලෝචනය කිරීමට හා ඒවායේ දූර්වලතා හඳුනාගෙන පිලියම් යෙදීම.

අයකිරීම් නියෝජිතයන් හා අයකිරීම් නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

ආදායම් ප්‍රවර්ධන වැඩ සටහන තුල දක්වන දායකත්වය ඇගයීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## 8. නිවාස සම්බන්ධ උපදේශන සේවා

දිස්ත්‍රික් නිවාස උපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.

යෝග්‍යතා වාර්තා සකස්කිරීම.

අවශ්‍ය අවස්ථාවේ දී සැලසුම් සැපයීම.

ප්‍රමාණ/ද්‍රව්‍ය ලැයිස්තු/පිරිවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීම.

සැලසුම් සඳහා අනුමැතියක් ලබාගැනීම.

ඉදිකිරීම් අධීක්ෂණය සහ තත්ව සහතිකවීම.

ඉදිකිරීම් දත්ත බැංකුවක් පවත්වාගෙන යාම.

## 9. අඩුපිරිවැය ඉදිකිරීම් තාක්‍ෂණික ක්‍රම ප්‍රචලිත කිරීම

අදාල පෞද්ගලික හා රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධතාව පැවැත්වීම සහ

තොරතුරු ද්‍රව්‍ය සාම්පල ආදිය රැස්කිරීම.

උපදේශක මධ්‍යස්ථාන මගින් නව තාක්ෂණික ක්‍රම හා ද්‍රව්‍ය හඳුන්වාදීම.

## 10. නිවාස ක්‍රමවල පොදු ප්‍රදේශ, එහි යටිතල පහසුකම් සහ සේවාවන් සහිතව පළාත් අධිකාරියට පැවරීම.

පොදු ප්‍රදේශ / විවෘත ස්ථානවල මායිම් සලකුණු කිරීම.
මිනින්දෝරු සැලැස්මවල් පිළියෙල කිරීම.
පලාත් අධිකාරියෙන් එකඟතාවය ලබාගැනීම.
ඔප්පුවක් මගින් දේපල පැවරීම.
නිවාස හිමියන්ට දැනුම්දීම.

## 11. කුසලතා වර්ධනය සඳහා පුහුණුව

වෘත්තීය ආයතන සහ නියෝජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කර පුහුණු සැසි සංවිධානය කිරීම.
වෘත්තීය පුහුණු අවස්ථා සැකසීම.
මූලික උපකරණ සහාය සැපයීම.
ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම.
වාසිදායි රැකියා සඳහා උපකාරවීමට දත්ත බැංකුවක් තුල පවත්වාගෙන යාම.
කුසලතා ඇති පුද්ගලයන්ගේ තොරතුරු නාමාවලියක් පවත්වාගෙන යාම.

## 12. නිවාස තොග සම්බන්ධව දත්ත පවත්වාගෙන යාම

ග්‍රාම නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධිකරණය සහ දත්ත රැස් කිරීම.
ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උපදේශන මධ්‍යස්ථාන සමඟ සම්බන්ධීකරණය සහ දත්ත ඒකරාශි කිරීම.
පලාත් අධිකාරි සමඟ සම්බන්ධීකරණය සහ දත්ත රැස්කිරීම.
දිස්ත්‍රික් නිවාස කමිටුව වෙත දත්ත ඉදිරිපත් කිරීම.
කමිටුව බාරගත් දත්ත පෙල ගැස්වීම.
දත්ත, අර්ධ වාර්ෂිකව දත්ත බැංකුව වෙත ඉදිරිපත් කිරීම.
අනාගත සැලසුම් සඳහා දත්ත භාවිතයට ගැනීම.

## සංස්ථාපිත පාලනය

ආයතනික පාලනයේ උසස් මට්ටම දක්වා ගමන් කිරීම සඳහා දැඩි නොනවතින කැපවීමක් අප සතුව ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය ආදි ආයතන මගින් යෝජනා කරන ලද සුදුසුම කටයුතු අනුගමනය කිරීමට සැමවිට උත්සාහ කරන අතර අපව වර්ගීකරණයට ලක්කර ඇති අප අමාත්‍යාංශය මගින් ලබාදෙන ලද නිර්ණායකයන් ට අනුකූලව කටයුතු කරයි.

## අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මාසයකම රැස්වේ. අයවැයට සාපේක්ෂව ප්‍රගතිය සෑම මසකම එමගින් සමාලෝචනය කරයි. විචලනයන් හඳුනාගෙන ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා සුදුසු ප්‍රතිකර්ම යොදයි. වසර තුළ රැස්වීම් වාර 25 ක් පවත්වන ලදී.

## විගණන සහ කලමණාකරණ කමිටුව

සාමාන්‍යාධිකාරිවරයා සහ විධායක නොවන අධ්‍යක්ෂවරු 4 දෙනෙකුගෙන් විගණන සහ කළමණාකරණ කමිටුව සමන්විතවේ.

2013 වර්ෂයේ පහත නම් සඳහන් නිලධාරීන් විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන් ලෙස සේවය කලහ.

| | | |
|---|---|---|
| 1. ඩබ් ඒ වල්පිට මහත්මිය | - | සභාපති |
| 2. ඒ ඩබ් දයානන්ද මහතා | - | සාමාජික |
| 3. නීතිඥ රාජා ගුණරත්න මහතා | - | සාමාජික |
| 4. ආර් එස් සමරක්කොඩි මහතා | - | සාමාජික |
| 5. ඊ කේ කේ එස් එදිරිසිංහ මහතා | - | සාමාජික |

විගණන සහ කළමණාකරණ කමිටුව මගින් ගිණුම් හා මූල්‍ය කළමණාකරණ ක්‍රමයේ මනා පැවැත්ම සහතික කෙරෙන අතර ගිණුම් ප්‍රමිතීන්ට අදාල නීති රීති අනුව අභ්‍යන්තර පාලනයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ.

2013 වසර තුළ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වාර 08 ක් පවත්වා ඇත.

## මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම

ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සභාපති,උප සභාපති,ක්‍රියාකාරී අධ්‍යක්ෂ,සාමාන්‍යාධිකාරි, සියළුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරුන් හා දිස්ත්‍රික් කළමනාකරුවන්ගේ සහභාගිත්වයෙන් මාසිකව ආයතනයේ කටයුතු පිළිබඳව ප්‍රගතිය සමාලෝචනය කරනු ලබයි. 2013 වර්ෂය තුල ප්‍රගති සමාලෝචන රැස්වීම් 10 ක් පවත්වා ඇත.

## අභ්‍යන්තර පාලනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම ආයතනයේ වත්කම්වල සුරක්ෂිතභාවය සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ උපදේශනයන් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම ක්‍රමෝපායන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය සතු වගකීමකි.

ඒ හා සමානව අධ්‍යක්ෂක මණ්ඩලය මනාව සැකසුණු මාසික වාර්තා කරන ක්‍රමයක් තුලින් අභ්‍යන්තර පාලනය සහතික කරන අතර වත්කම් හා බැරකම් අතර සමබරතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගනු ලැබේ.

සතිපතා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කලමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන අතර සියළුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කොට්ඨාශවල කටයුතු පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. මිල කමිටු, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු, දේපළ අනුකමිටු හා අභියාචනා කමිටු පත් කිරීම සඳහා ද පියවර ගෙන ඇත.

## විධායක කළමනාකරණය

ප්‍රධාන කාර්යාලයේ සෑම අංශයකම ප්‍රධානත්වය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු දරණ අතර, දිස්ත්‍රික් කාර්යාල 25 ක් සමඟ නගර කාර්යාල 02 ක වගකීම ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු/දිස්ත්‍රික් කළමනාකරු සතුවේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් සහ ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරුවන්/දිස්ත්‍රික් කළමනාකරුවන් සාමාන්‍යාධිකාරි වෙත වාර්තා කළ යුතු අතර, ප්‍රධාන විධායක නිලධාරිවන සාමාන්‍යාධිකාරි විසින් සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය.

## අවදානම් කලමනාකරණය

විශාල සේවාදායකයන් සමූහයකට සියලුම පහසුකම් සහිත නිවාස පහසුකම් සපයන සහ දිවයින පුරා ව්‍යාප්ත වූ ප්‍රාදේශීය කාර්යාල 25 කින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එහි විවිධ හවුලකාරයින්ගේ අවශ්‍යතා රැක ගැනීම සඳහා මුල්‍යමය සහ මුල්‍යමය නොවන අවදානම් රාශියකට මුහුණ දීමට සිදුවන අතර, එය පූර්ව කළමනාකරණය කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියළුම ව්‍යාපාරික අරමුණු ලඟාකර ගැනීමට, එහි සංස්ථාපිත කළමණාකාරිත්වය උපදෙස් මත ප්‍රතිපත්තීන්, ක්‍රියාමාර්ග සහ අවදානම් කළමනාකරණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුවහයන් ගොඩනැගීම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරයි. එමගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියළුම ව්‍යාපාරික අරමුණු ලඟාකර ගැනීම සිදුකරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආපදාවට ලක්වීම කෙරෙහි බලපාන ක්‍රියාදාමයන් සහ පාලනය කළහැකි පද්ධතීන්වල දුර්වලතා හඳුනාගැනීම සඳහා අවදානම් කළමණාකරණය ක්‍රියාදාමය අධිකාරියේ විගණන අංශය සමඟ සම්බන්ධ වී කටයුතු කරයි. කාර්යක්ෂමතාවය සහ පාලනමය තත්ත්වයේ ප්‍රමාණාත්මතාවය පිළිබඳව ස්වාධින අදහස් කාලානුරූපීව කළමනාකරණය වෙත පළකිරීම විගණන අංශය මගින් සිදුකරනු ලැබේ.

## ද්‍රවශීලී අවදානම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගිවිසුම් සඳහා වූ බැඳීම් නියමිත කාලය තුළ දී ඉටුකිරීමට නොහැකිවූවිට මෙම අවදානමට ගොදුරුවේ. ඒවාහි කාලය ඉකුත් අවස්ථාවලදී මුල්‍යමය වගකීම් ඉෂ්ට කිරීම සඳහා අරමුදල් තිබීම සහ අවශ්‍යතා පැනනැගුණ අවස්ථාවල දී ඒවායෙහි ප්‍රයෝජන ලබාගැනීම සඳහා අවශ්‍ය මුල්‍යමය ප්‍රතිපාදන තිබෙන බව තහවුරු කිරීම මෙහි ඇතුලත් වේ.

සැලසුම්කරණය සඳහා මගපෙන්වීම, ක්‍රමවත් අවශ්‍යතාවන්ට අනුව කටයුතු කිරීම් ගිවිසුම් බැඳීම් සහ වර්ධන අපේක්ෂාවන් සඳහා මුහුණදීමට අවශ්‍ය ප්‍රමාණවත් ද්‍රවශීලි බවක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුවන බව තහවුරු කිරීම ආදී ප්‍රධාන කරුණු අධ්‍යක්ෂක මණ්ඩලයට සහ සංස්ථාපිත කළමනාකරණයේ සාමාජිකයන් වෙත කළමනාකරණය සඳහා පවරා දී ඇත.

ජ්‍යෙෂ්ඨ කලමනාකාරිත්වය එය සතු ප්‍රධාන අරමුණු ලඟාකර ගැනීම සඳහා,

- මුදල් ඉපයීම සම්බන්ධ විකල්ප මාර්ග ප්‍රමාණවත් ලෙස තහවුරු කිරීම.
- පවත්නා ණය ආයෝජන සහ මුදල් ඉපයීමේ ක්‍රියාමාර්ග කාලානුරූපී ව නැවත සලකා බැලීම.
- පවතින මිළ ගණන් සමාලෝචනයට ලක් කරන අතරම, තරඟකරුවන්ගේ මිළ ගණන් විශ්ලේෂණයක් සිදු කිරීම.

- සංස්ථාපිත නිර්ණායකයන්ට අනුකූලව ද්‍රවශීලී අනුපාත සඳහා මඟ පෙන්වීම. ප්‍රධානයන්, අභ්‍යන්තර උපයන අරමුදල් හා මුදල් බවට පත්කළ හැකි කෙටිකාලීන ආයෝජන පාලනය කිරීම තුළින් ද්‍රවශීලිතාවය පවත්වාගෙන යාම දෛනිකව කරනු ලැබේ.

## වෙළෙඳපොළ අවදානම

මිළ සංවේදී වත්කම් හා බැරකම් පවත්වාගෙන යෑමේ දී පැනනගින පාඩුවන් හා සම්බන්ධව මෙම අවදානම ප්‍රධාන වශයෙන් පොලී අනුපාතයන්ගේ වෙනස්වීම සහ කාලයත් සමඟ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිළ දෝලනය වීම හේතුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත මෙය බලපානු ලැබේ.

නිවසක් අවශ්‍ය සෑම පුද්ගලයෙකුටම නිවසක් සතු කිරීමට රජය මගින් ලබා දෙන මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙළෙඳ පොල අවදානමට මුහුණදීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සිදුවේ.

සංස්ථාපිත කළමණාකරණ අරමුණු ලඟාකර ගැනීමට දායකව කටයුතු කරන අනෙකුත් ප්‍රධාන හවුල්කාර ආයතනයන්ගේ අවශ්‍යතාවයන් සහ සේවාදායකයන්ගේ මුදලට සරිලන සේවාවක් සඳහා වටිනාකමක් සපයා දෙමින් නිවාස වෙළෙඳ පොළට එල්ල වී ඇති තර්ජනයන් උපරිමයෙන් පාලනය කරගැනීම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිදු කරනු ලැබේ.

## මෙහෙයුම් අවදානම

බාහිර තරගකාරි බලවේගයන්ට මුහුණදීමට අපහසු හෝ ක්‍රියාකාරකම්වලට බාධාවන් පමුණුවන අභ්‍යන්තර දුර්වලතා නිසා ප්‍රමාණවත් නොවන හෝ අභ්‍යන්තර ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මෙම අවදානම් ඇතිවේ.

සංවිධානය තුළ යහපත් සහ මනා ලෙස පාලනය කරන ලද ක්‍රියාකාරි පරිසරයක් ලබාදීම සඳහා සැකසුණු ව්‍යුහයන් සහ පුළුල් ප්‍රතිපත්තීන් සහිත පද්ධතියක් අවදානම් පාලනය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවත්වාගෙන යනු ලැබේ.

එලදායී ක්‍රියාකාරි අවදානම් කලමනාකරණය සඳහා විශේෂ පියවර කීපයක් ගෙන ඇත.

- තොරතුරුවල සුරක්ෂිතභාවය ආරක්ෂාකරමින් සියළුම දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් කාලානුරූප දත්ත එකතුවන් වාර්තාකරණය සහ පිළියෙල කිරීම.
- තොරතුරු ආරක්ෂාකිරීමේ ප්‍රතිපත්තීන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- නිවාස වැඩසටහන් නිරතුරුවම සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම.
- ණය නැවත අයකිරීමේ වැඩ සටහන්වල ක්‍රියාකාරිත්වය

මෙහෙයුම් අවදානම පාලනය කිරීම මධ්‍යම කලමණාකරණයේ ප්‍රධානම වගකීම වේ. පාලිත පරිසරයන්හි අනන්‍යභාවය පවත්වාගැනීම සඳහා මුදල්, විගණන හා අනිකුත් සහායක සේවා අංශ මගින් මහඟු කාර්යයක් ඉටුකරයි.

වටිනා දේපල ප්‍රමාණයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව ඇති හෙයින් යෝග්‍ය උපක්‍රම භාවිතා කිරීම සහ නිරන්තර සමාලෝචනය සහ කාර්යය මණ්ඩලයේ කැපවීම මගින් තරඟකාරී පරිසරයතුල දී සාර්ථකත්වය ලඟාකර ගැනීම අපේක්ෂා කළ හැකිය.

## පාරිසරික ගැටලු

ගොඩනැගිලි ඉදිකිරීම පරිසර පද්ධතිය කෙරෙහි කිහිප ආකාරයකින් බලපානු ලැබේ. මෙම බලපෑම සහාධිපත්‍ය ගොඩනැගිලි සහ නිවාස ක්‍රමවල වඩාත් පැහැදිලිව දක්නට ලැබේ. පරිසර සංරක්ෂණ සංවර්ධන ක්‍රියාදාමයේ වැදගත් අංගයක් ලෙස විදහා දැක්විය හැක.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජනතාවට සුරක්ෂිත සහ යහපත් පරිසරයක් සපයා දෙනු ලැබේ. ඒ අතරම පානීය ජලය, ප්‍රමාණවත් පිවිසුම් මාර්ග, අඛණ්ඩ විදුලි සැපයුම, වැසි ජලය සහ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධති, ඝන අපද්‍රව්‍ය බැහැරකිරීම වැනි යටිතල පහසුකම් ද සපයනු ලැබේ.

සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරියේ නීතිරීති මගින් සහාධිපත්‍ය දේපලවල පදිංචිකරුවන්ට වඩා යහපත් පරිසරයක් සහතික කෙරේ.

## (ඇ) මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

## නිවාස සංවර්ධනය

## 2013 - වසර නිවාස වැඩසටහන

මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුකූලව ජනසෙවන නිවාස දස ලක්ෂයේ නිවාස හා ජනාවාස සංවර්ධන මෙහෙයුම යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශවල ජීවත් වන නිවාස ගැටළුවට මුහුණපා සිටින දරු පවුල් වෙනුවෙන් නිවාස පහසුකම් සපයාදීමේ අරමුණ ඇතිව 2013 වසර තුලදී ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් පිළිබඳව කරුණු දැක්වීමේ දී පහත සඳහන් වැඩ සටහන් පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

- විරුගම්මාන වැඩසටහන
- විසිරි නිවාස වැඩසටහන
- ජනසෙවන උපහාර වැඩසටහන
- සසුනෙන් සෙවන ආධාර වැඩ සටහන
- ජන සෙවන විශේෂ ආධාර වැඩසටහන
- දැයට කිරුළ වැඩසටහන
- නැවත පදිංචි කිරීමේ වැඩ සටහන
    - (i) ඉන්දියානු ආධාර නිවාස වැඩ සටහන
    - (ii) ජාතික ඉතිරි කිරීමේ බැංකු ණය අරමුදල් යටතේ ක්‍රියාත්මක නිවාස වැඩ සටහන
- වැලිඔය නිවාස වැඩ සටහන
- ආදිවාසී නිවාස වැඩසටහන
- සහසවිය නිවාස වැඩ සටහන

## විරු ගම්මාන වැඩසටහන

මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුකූලව ගරු ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගේ මගපෙන්වීම මත ක්‍රියාත්මක ජනසෙවන නිවාස දස ලක්ෂයේ නිවාස හා ජනාවාස සංවර්ධන මෙහෙයුම යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස අපේක්ෂිත විවිධ ජනකොටස් සඳහා මූලික යටිතල පහසුකම් සහිත නිවාස ව්‍යාපෘති මෙම වැඩසටහන තුලින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙමගින් දිස්ත්‍රික්ක තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘති ආරම්භ කොට ව්‍යාපෘති ඉදිකිරීම් හා පොදු පහසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිය පිහිටි ප්‍රදේශයේ මියගිය හෝ දැනට සේවය කරන ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ රණවිරුවකු නමින් ගම්මානය නම්කර විවෘත කිරීමට කටයුතු කරනු ලැබේ. මෙසේ සිදු කරනු ලබන්නේ වසර 30 ක් පුරා පැවති කුරිරු ත්‍රස්තවාදය නිමා කිරීමට රණවිරුවන් විසින් ලබාදුන් දායකත්වයට ඔවුනට සිදුකරනු ලබන උපහාරයක් වශයෙනි.

මෙම වර්ෂය තුලදී දිස්ත්‍රික්ක 10 ක ව්‍යාපෘති 19 ක වැඩ ආරම්භ කල අතර, නිවාස 701 ක් වෙනුවෙන් රු.මිලියන 90.185 ක් වැය කර ඇත. ඉතිරි මුදල් 2014 වර්ෂයේ පළමු කාර්තුව තුල වියදම් කර අවිච්ඡේද නිම කිරීමට නියමිතය. 2013 වසර ආරම්භ වන විට අවිච්ඡේද වැඩ සටහන තුල නිම කිරීමට තිබූ නිවාස 1875 ක් වෙනුවෙන් රු.මිලියන 147.902 ක් වැය කර නිවාස 1040 ක් නිමි නිවාස බවට පත්කර ඇත.

## විසිරි නිවාස වැඩසටහන

මහින්ද චින්තන ජාතික වැඩසටහන යටතේ දිවයින පුරා විසිරී සිටින නිවාස අහිමි සෑම පවුලක් සඳහාම නිවසක් ඉදිකර ගැනීමට අවස්ථාව සලසාදීම අරමුණ ඇතිව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිර්ණායකයන්ට අනුකූලව සමස්ථ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ප්‍රජාවගේ දායකත්වයද ඇතිව අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සහාය ලබාදීම මෙම වැඩසටහන තුලින් සිදු කරනු ලැබේ.

නිවාස අවශ්‍යතාවය පවතින නිවාසලාභීන්ට නව නිවාස ඉදිකිරීම හා පවත්නා නිවාස වැඩිදියුණු කර ගැනීම වෙනුවෙන් නිවාස ණය නිකුත් කිරීම මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ. දැඩි නිවාස අවශ්‍යතාවයකින් යුත් නිවසක් ඉදිකර ගැනීමට ද්‍රව්‍ය හෝ මුදල් රැස්කර ගෙන ඇති පුද්ගලයන් මෙම වැඩසටහන යටතේ ප්‍රමුඛත්වය ලබාදේ. මෙම වැඩසටහන තුලින් 2013 වර්ෂය අවසන් වන විට නිවාස ඒකක 3767 ක් ඉදිකිරීමට දායකත්වය ලබාදී ඇති අතර, ඒ වෙනුවෙන් රු.මි. 378.006 ක් වැයකර ඇත. අවිච්ඡේද වැඩ සටහන සඳහා නිවාස 10,303 ක් වැඩ නිම කිරීමට තිබූ අතර, ඒ සඳහා රු.මිලියන 611.244 ක් වැය කර නිවාස 7778 ක් නිම කර ඇත. ඉතිරිය 2014 වර්ෂයේ පළමු කාර්තුව තුල නිම කිරීමට නියමිතය.

## ජනසෙවණ උපහාර වැඩසටහන

රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින් ඇතුළු මධ්‍ය ආදායම්ලාභීන්ගේ නිවාස අවශ්‍යතාවයන් ඉටු කිරීමෙහිලා ප්‍රවේශයක් ලෙස වාණිජ බැංකු සහාය කරගෙන නිවාස ණය නිකුත් කිරිම මෙම වැඩසටහනේ මූලික අරමුණයි.

මෙහිදී රජයේ හා අර්ධ රාජ්‍ය ආයතනවල මෙන්ම ස්ථිර පෞද්ගලික අංශයේ සේවකයින් වෙත අවම ලියකියවිලි ඉදිරිපත් කිරීම තුලින් පුද්ගල ඇප මත රු. 500,000/- ක් උපරිමයක් දක්වා වූ ණය මුදලක් ලබාදේ. මේ යටතේ නව නිවසක් ඉදිකිරීමට හා පවත්නා නිවාස වැඩි දියුණු වෙනුවෙන් නිවාස ණය නිකුත් කරනු ලබන අතර, මහල් නිවාස වැඩි දියුණු කිරීම සඳහා ද ණය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ජනසෙවන උපහාර වැඩසටහන යටතේ 2013 වර්ෂය තුලදී පවුල් 11014 ක් වෙත නිවාස ඉදිකර ගැනීම සඳහා ණය ලබාදීමට කටයුතු කර ඇති අතර, ඒ වෙනුවෙන් වැය කළ මුදල රු.මි. 2490.028 කි. 2012 අවිච්ඡේද වැඩ සටහන සඳහා නිවාස ඒකක 5958 ක් වෙනුවෙන් 2013 වසර තුල වැය කල මුදල රු.මිලියන 820.001 ක් වන අතර නිමකල නිවාස සංඛ්‍යාව 5801 කි.

## සසුනෙන් සෙවණ වැඩසටහන

ගමෙන් පන්සලට පන්සලෙන් ගමට යන තේමාව සාක්ෂාත් කර ගැනීම අරමුණු කොට 2600 සම්බුද්ධ ජයන්ති සංවත්සරය නිමිති කොට හා එය සමරනු වස් ශ්‍රී ලංකාව තුල ඇති 10250 ක් පමණ වූ පන්සල් හා පුදබිම් ආශ්‍රිතව ජීවත් වන ඉතා දිළිඳු පවුල් ඉලක්ක කොට එක් පන්සලක් වෙනුවෙන් එක් දිළිඳු පවුලකට නිවසක් තනාදීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මෙම වැඩසටහන යටතේ දිවයින පුරා ඇති පන්සල් 10210 ක් ආවරණය වන සේ නිවාස 10000 ක් ඉදිකිරීමට යෝජිත අතර, පළමු අදියර වශයෙන් 2013 වර්ෂය තුලදී පවුල් 493 කට නිවාස ඉදිකර ගැනීම සඳහා සහාය ලබාදීමට කටයුතු කර ඇත. මේ වෙනුවෙන් රු.මි. 27.359 ක් වැය කර ඇත.

පසුගිය වසරවලින් 2013 වසරට ඉදිරියට ගෙන ආ අවිච්ඡේද නිවාස 459 වන අතර 2013 වසර තුල 354 ක් නිම කර ඇත. ඒ සඳහා වැය කල මුදල රු.මි. 17.514 කි.

නිවාස ණය මුදලක් ලබාගෙන ආපසු ගෙවීමට හැකියාවක් නැති එහෙත් නිවසක අවශ්‍යතාවය ඇති එසේම නිවසක් තනා ගැනීමේ උනන්දුව ඇති ඉතා දිළිඳු පවුල් මේ සඳහා තෝරා ගනු ලැබේ. එය දායක

සභාවේ පූර්ණ අධීක්ෂණය යටතේ අදාල ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මැදිහත්වීම මත සිදු කරනු ලැබේ. නිවසක් තනා ගැනීමට අවශ්‍යතාවය ඇති ඉඩමක් හිමි පවුලක්වීම අනිවාර්යය වේ. පවුල තෝරා ගැනීමේ අවසන් නිර්දේශය අදාල පවුල අයත් වන පන්සලේ නායක ස්වාමීන් වහන්සේ ඇතුළු දායක සභාව විසින් ලබාදිය යුතුය. මෙහිදී නිවසක් ඉදිකර ගැනීම සඳහා මූලික සූදානමක් ඇති පවුල් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් රු- 100,000/- ක ආධාර මුදලක් ලබාදේ. ඉතිරි ඉදිකිරීම් පිරිවැය දායක සභාවේ මැදිහත්වීමෙන් ප්‍රදේශයේ දානපතියන්ගේ හා ස්වේච්ඡා සංවිධාන මගින් ලබා ගැනීමට කටයුතු කළයුතු වේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස සැලසුමක් ලබාදෙන අතර, ඉදිකිරීම් තාක්ෂණික සහාය ලබාදේ.

- නිවාස ඉදිකරන ප්‍රදේශය ආශ්‍රිතව ඉදිකිරීම් කිරීමට යෝග්‍ය තාක්ෂණික ක්‍රමවේද නිවාස අධිකාරිය විසින් ලබාදෙන අතර, ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු ක්‍රමවත්ව සිදු කරනු ලැබේ.
- දායක කමිටුව ගම්වාසීන් හා ප්‍රතිලාභී පවුල විසින් පුහුණු හා නුපුහුණු තාක්ෂණික සහාය ලබාගත යුතුය.

## ජන සෙවණ විශේෂ ආධාර වැඩසටහන

නිවාස ණය මුදලක් ලබාගෙන ආපසු ගෙවීමේ හැකියාවක් නොමැති නමුත් නිවසක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය ඇති දිළිඳු දරු පවුල් වෙනුවෙන් ස්ථිරසාර නිවසක් ඉදිකරදීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ එක් පවුලක් වෙනුවෙන් උපරිමය රුපියල් ලක්ෂයක ආධාර මුදලක් ප්‍රදානය කිරීම සිදු කර ඇත. මෙම වැඩසටහන තුලින් 2013 වර්ෂයේ පවුල් 267 ක් වෙනුවෙන් නිවාස ඉදිකිරීමට රු.මිලියන 14.76 ක් ආධාර ලෙස ලබා දී ඇත. මින් නිවාස 249 ක් 2013 වසර තුල නිම කර ඇත.

## දැයට කිරුළ වැඩසටහන

දැයට කිරුළ 2013 ප්‍රදර්ශනයට හා සංවර්ධන වැඩසටහන අම්පාර දිස්ත්‍රික්කය කේන්ද්‍රගත කොටගෙන ක්‍රියාත්මක කරනු ලබන අතර, එයට සමගාමීව ත්‍රිකුණාමලය, පොලොන්නරුව හා මඩකලපුව යන දිස්ත්‍රික්කවලද මෙම වැඩ සටහන ක්‍රියාත්මක කොට ඇත.

දැයට කිරුළ 2013 ප්‍රදර්ශණය හා සංවර්ධන වැඩ සටහන තුල අඩු ආදායම්ලාභී දරු පවුල් සඳහා නිවාස සංවර්ධන වැඩසටහන හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි. මේ යටතේ නිවාස වැඩිදියුණු කර ගැනීමට හා අළුතින් නිවසක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය ඇති පවුල් වෙනුවෙන් නිවාස ඉදිකර දීම හා වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙන්ම ජනාවාස ආරම්භ කිරීම ද මේ තුලින් සිදුකර ඇත.

දැයට කිරුළ වැඩ සටහන ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක 04 හි නිවාස වැඩ සටහන්වල ප්‍රගතිය විරුගම්මාන ව්‍යාපෘති ප්‍රගතිය, විසිරි ණය නිකුත් කිරීමේ ප්‍රගතිය, උපහාර නිවාස ණය වැඩ සටහන් ප්‍රගතිය හා අනෙකුත් ආධාර වැඩ සටහන් ප්‍රගති තුලද ඇතුලත්ව ඇත. මෙයට අමතරව දැයට කිරුළ වැඩ සටහන යටතේ මඩකලපු දිස්ත්‍රික්කයේ නිවාස 658 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 66.463 ක් වැය කිරීමට ඇස්තමේන්තුගත කර තිබූ අතර, නිවාස ඉදිකිරීම් ප්‍රගතිය අනුව රු.මිලියන 33.34 ක් වැය කර ඇත.

අනුරාධපුර පැවති දැයටකිරුළ අවිච්ඡේද වැඩ සටහනේ නිවාස 245 ක් සඳහා රු.මිලියන 8.975 ක් වැය කර ඇත.

## නැවත පදිංචි කිරීමේ නිවාස වැඩසටහන

### (i) ඉන්දියානු ආධාර නිවාස වැඩසටහන

මෙම නිවාස වැඩ සටහන යටතේ නිවාස 6000 ක් වව්නියා මන්නාරම දිස්ත්‍රික්කවල පමණක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මින් නිවාස 1495 ක ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර, ඒ සඳහා 2013 වසර තුල වැය කර ඇති මුදල රු.මි.704.25 කි.

### (ii) ජාතික ඉතිරි කිරීම් බැංකු ණය යටතේ ක්‍රියාත්මක නිවාස වැඩසටහන

නිවාස ඒකක 129 ක් සඳහා රු.මි.36.015 ක් වැය කර ඇත.

## වැලිඔය II අදියර නිවාස වැඩ සටහන

මෙම නිවාස වැඩ සටහන යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ නිවාස 364 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 60.050 ක් වැය කර ඇත.

වැලි ඔය I අදියර අවිච්ඡේද නිවාස වැඩ සටහන වෙනුවෙන් 2013 වසර තුල නිවාස 494 ක් වෙනුවෙන් රු.මිලියන 64.8 ක් වැය කර ඇත.

## ආදිවාසි නිවාස වැඩසටහන

මෙම වැඩ සටහන යටතේ බදුල්ල දිස්ත්‍රික්කයෙ මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස 25 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 2.5 ක් ඇස්තමේන්තු ගත කර ඇති අතර, ඉදිකිරීම් ප්‍රගතිය අනුව එමනිවාස 25 වෙනුවෙන් රු.මිලියන 1.632 ක් වැය කර ඇති අතර, 2014 වසර තුලදී ඉතිරි මුදල් වැය කර අවිච්ඡේද නිම කිරීමට නියමිතය.

## සහසවිය නිවාස වැඩසටහන

මෙම වැඩ සටහන බාහිර අරමුදල් උපයෝගී කරගෙන ක්‍රියාත්මක කරන අතර, විමධ්‍යගත අරමුදලින් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අරමුදල් සම්පාදනයෙන් නිවාස 763 ක් සඳහා රු.මි. 39.413 ක් වැය කර ඇති අතර, නිවාස 124 ක් නිම කර ඇත.

## උපහාර ණය වැඩසටහන

2013 වසරේ රාජ්‍ය බැංකු හරහා ප්‍රතිලාභී පවුල් 16000 ක් වෙනුවෙන් ණයලබාදීමට රු.මි.5000 ක් ලබාගැනීමට ඉලක්කගත කර තිබුණද රාජ්‍ය බැංකු වෙතින් පහත පරිදි මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට එකඟ වී ඇත.

| | |
|---|---|
| ▪ මහජන බැංකුව | රු.මි. 1200 |
| ▪ ලංකා බැංකුව | රු.මි. 1200 |
| ▪ ජාතික ඉතිරිකිරීමේ බැංකුව | රු.මි. 1200 |
| ▪ රාජ්‍ය උකස් ආයෝජන බැංකුව | රු.මි. 150 |
| ▪ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | රු.මි. 500 |
| **සමස්ථ දායකත්වය** | **රු.මි.4250** |

ඒ අනුව මෙම වැඩසටහන තුලින් ප්‍රතිලාභී පවුල් 14159 ක් සඳහා ණය මුදල් ලබාදීමට කටයුතු කර ඇත.

# ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජනසෙවණ නිවාස වැඩසටහන
## 2013.12.31 දිනට ප්‍රගතිය

| ජනසෙවණ නිවාස වැඩ සටහන | වාර්ෂික ඉලක්කය | | | | | | | | ලගාවීම් | | | | | | | | | මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල් (රු.මි.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | භෞතික | මූල්‍යමය (රු.මි.) | | | | | | | භෞතික (ඒකක ගණන) | | වියදම් | | | | | | | |
| | (ඒකක ගණන) | එකතුව | ඒකාබද්ධ අරමුදල් | ආයතනික එකතුකිරීම් | දේපළ | සෙවණ | බාහිර | උපහාර | වැඩ ආරම්භ කිරීම | නිමකළ ඒකක | එකතුව | ඒකාබද්ධ අරමුදල් | ආයතනික එකතුකිරීම් | දේපළ | සෙවණ | බාහිර | උපහාර | |
| **ග්‍රාමීය හා අර්ධ නාගරික වැඩ සටහන** | | | | | | | | | | | | | | | | | | |
| 1 ජනසෙවන විරු ගම්මාන | | | | | | | | | | | | | | | | | | |
| 1.1 සාමාන්‍ය | 2,593 | 517.100 | | 449.100 | 63.000 | | 5.000 | | 529 | 19 | 51.370 | 44.325 | 6.490 | | 0.555 | - | - | |
| 1.2 උපහාර | 875 | 273.440 | | | | | | 273.440 | 172 | 16 | 38.815 | - | - | - | - | - | 38.815 | |
| 2 ජනසෙවණ විසිරි නිවාස | 13,266 | 1987.900 | 600.000 | 550.900 | 837.000 | | | | 3767 | 1034 | 378.006 | 358.084 | 15.367 | 4.555 | - | - | - | 600.000 |
| 3 ජනසෙවන උපහාර | | | | | | | | | | | | | | | | | | |
| 3.1 විසිරි | 15,125 | 4726.560 | | | | | | 4726.560 | 11014 | 2310 | 2490.028 | - | - | - | - | - | 2490.028 | |
| 3.2 මෙහෙයුම් පිරිවැය | | 26.000 | 26.000 | | | | | | | | 23.922 | 23.922 | | | | | | 23.922 |
| 4 ජනසෙවන ආධාර වැඩ සටහන | | | | | | | | | | | | | | | | | | 142.746 |
| 4.1 සසුනෙන් සෙවණ | 1,000 | 100.000 | | | | 100.000 | | | 493 | 77 | 27.359 | | | | 27.359 | | | |
| 4.2 විසිරි ආධාර | | | | | | | | | 36 | 18 | 3.260 | | | | 3.260 | | | |
| 4.3 විශේෂ ආධාර - ප්‍රධාන කාර්යාලය | | | | | | | | | 231 | 231 | 11.500 | | | | 11.500 | | | |
| 5 **සහශ්‍ර ලංකා නිවාස වැඩ සටහන** | | | | | | | | | | | | | | | | | | |
| 5.1 සාජු ඉදිකිරීම | 20 | 150.000 | | | | | 150.000 | | | | | | | | | | | |
| 5.2 පුනස්ථාපන නිවාස | 40 | 100.000 | | | | | 100.000 | | | | | | | | | | | |
| 5.3 රාජ්‍ය/පෞද්ගලික දායකත්වය (ව්‍යාපෘති 14 - | 3,200 | | | | | | | | 61 | | | | | | | | | |
| ටෙන්ඩර් ඇගයුම් රු.මි.24.318) | 1,000 | 100.000 | | | | | 100.000 | | 766 | 127 | 39.673 | | | | | 39.673 | | |
| 6 **සහසවිය වැඩ සටහන** | | | | | | | | | | | | | | | | | | |
| 6.1 වැලිඔය විශේෂ වැඩ සටහන - අදියර 2 | | | | | | | | | 364 | | 60.050 | | | | | 60.050 | | |
| 7 **නැවත පදිංචි කිරීමේ වැඩ සටහන** | | | | | | | | | | | | | | | | | | |
| 7.1 ජාතික ඉතිරිකිරීමේ බැංකුව (ජා.ඉ.බැ) | 50 | 15.000 | | | | | 15.000 | | 129 | 98 | 36.015 | | | | | 36.015 | | |
| 7.2 ඉන්දියානු ආධාර | 3,000 | 1650.000 | | | | | 1650.000 | | 1495 | 841 | 704.250 | | | | | 704.250 | | |
| **උප එකතුව** | **40,169** | **9646.000** | **626.000** | **1000.000** | **900.000** | **100.000** | **2020.000** | **5000.000** | **19,057** | **4,771** | **3864.248** | **426.331** | **21.857** | **4.555** | **42.674** | **839.988** | **2528.843** | **766.668** |
| **නිවාස සම්බන්ධ ක්‍රියාකාරකම්** | | | | | | | | | | | | | | | | | | |
| 8 **සෙවණ බිම්සවිය වැඩසටහන** | | | | | | | | | | | | | | | | | | |
| - ඉඩම් කැබලි බෙදාහැරීම | 500 | | | | | | | | | 277 | | | | | | | | |
| - දේපළ හිමිකම් සහතික කිරීම (ඔප්පු නිකුත් කිරීම) | 3,000 | | | | | | | | | 2581 | | | | | | | | |
| 9 **නගමු පුරවර වැඩ සටහන (ව්‍යාපෘති)** | 7,147 | 1000.000 | 1000.000 | | | | | | | 5833 | 610.913 | 599.469 | 11.444 | | | | | 600.000 |
| 10 **ඉඩම් වන්දි ලබාදීම** | | 50.000 | 50.000 | | | | | | | | 49.778 | 49.778 | | | | | | 50.000 |
| **උප එකතුව** | **10,647** | **1050.000** | **1050.000** | | | | | | | **8,691** | **660.691** | **649.247** | **11.444** | | | | | **650.000** |
| 11 **අවිච්ඡේද වැඩසටහන** | | | | | | | | | | | | | | | | | | |
| 11.1 ජනසෙවන විරුගම්මාන | 1,875 | 181.050 | | | 181.050 | | | | 104 | 1040 | 147.902 | 32.578 | 13.793 | 78.953 | 0.035 | | 22.543 | |
| 11.2 ජනසෙවන විසිරි | 10,306 | 803.430 | | | 803.430 | | | | | 7778 | 611.244 | 164.955 | 446.289 | | | | | |
| 11.3 ජනසෙවන උපහාර | 5,951 | 901.900 | | | | | | 901.900 | | 5801 | 820.001 | | | | | | 820.001 | |
| 11.4 ජන සෙවන සසුනෙන් සෙවණ (ආධාර) | 459 | 23.100 | | | | 23.100 | | | | 354 | 17.514 | | | | 17.514 | | | |
| 11.5 සෙවණ විසිරි (ආධාර) | 15 | 0.450 | | | | 0.450 | | | | 15 | 0.450 | | | | 0.450 | | | |
| 11.6 නැවත පදිංචි කිරීම | 507 | 71.490 | | | | | 71.490 | | | 289 | 57.205 | | | | | 57.205 | | |
| 11.7 දැයට කිරුළ නිවාස වැඩ සටහන | 245 | 14.740 | | | 14.740 | | | | | 118 | 8.975 | | | 8.975 | | | | |
| 11.8 බාහිර අරමුදල් | 249 | 12.580 | | | | | 12.580 | | | 138 | 8.162 | | | | | 8.162 | | |
| 11.9 ගංවතුර ආධාර නිවාස වැඩ සටහන | 344 | 10.720 | | | | | 10.720 | | | 255 | 6.490 | | | | | 6.490 | | |
| 11.10 වැලිඔය විශේෂ වැඩ සටහන | 494 | 56.580 | | | | | 56.580 | | | 453 | 64.800 | | | | | 64.800 | | |
| 11.11 වතු නිවාස | 481 | 47.270 | | | | | 47.270 | | | 54 | 13.504 | | | | | 13.504 | | |
| **උප එකතුව** | **20,926** | **2123.310** | | | **999.220** | **23.550** | **198.640** | **901.900** | **104** | **16,295** | **1756.247** | **197.533** | **460.082** | **87.928** | **17.999** | **150.161** | **842.544** | |
| 12 **සහශ්‍ර ලංකා වැඩ සටහන - අවිච්ඡේද** | | | | | | | | | | | | | | | | | | |
| 12.1 සාජු ඉදිකිරීම | 89 | 235.000 | | | 235.000 | | | | | | 59.705 | | | 59.705 | | | | |
| 12.2 පුනස්ථාපන නිවාස | 36 | 47.720 | | | 47.720 | | | | | 36 | 36.934 | | | 36.934 | | | | |
| **මුළු එකතුව** | **71,867** | **13,102.030** | **1,676.000** | **1,000.000** | **2,181.940** | **123.550** | **2,218.640** | **5,901.900** | **19,161** | **29,793** | **6,377.824** | **1,273.111** | **493.383** | **189.122** | **60.673** | **990.148** | **3,371.387** | **1,416.668** |

<u>2011 සිට 2012 වසර දක්වා බැංකු වෙතින් ලැබූ මූල්‍ය ප්‍රතිපාදන</u>

- මහජන බැංකුව රු.මි. 1500
- ලංකා බැංකුව රු.මි. 1550
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව රු.මි. 1560
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව රු.මි. 350
- රාජ්‍ය උකස් ආයෝජන බැංකුව රු.මි. 220
- නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව රු.මි. 250

මෙම වැඩසටහන තුලින් ප්‍රතිලාභී පවුල් 16172 ක් සඳහා ණය ලබාදීමට කටයුතු කර ඇත

<u>උතුරු පලාතේ නැවත පදිංචි කිරීමේ වැඩ සටහන</u>

උතුරු පළාතේ නැවත පදිංචිකිරීමේ වැඩසටහන සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ රු.මි.345 ක මූල්‍ය ප්‍රතිපාදන මගින් නිවාස ඒකක 995 ක් ඉදිකිරීම් සඳහා ණය පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.

## දේපළ කළමනාකරණය

(1) 2013 වර්ෂයේ නිවාස හා ඉඩම් වෙනුවෙන් ඔප්පු ලබාදීම සඳහා ලිපිගොනු 2740 ක් ලැබී ඇති අතර, (8.1 අනුමැතිය ද ලබාගැනීමෙන් අනතුරුව) ඒ අතුරින් ඔප්පු 2581 නිකුත් කර ඇත.

2013 වර්ෂය සඳහා ඔප්පු ලබාදිම සඳහා ලබා දි ඇති ඉලක්ක සපුරා ගැනීම 91%කි.

(2) 2013 වර්ෂයේදී පොදු දේපළ පළාත් ආයතන වෙත බැහැර කිරීම සඳහා ගාල්ල, පොලොන්නරුව, මහනුවර, සහ මාතලේ දිස්ත්‍රික්කවලට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලබා ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් කලමනාකරුවන් දැනුවත් කර ඇත.

| දිස්ත්‍රික්කය | ඉඩම් කැබලි සංඛ්‍යාව | දිස්ත්‍රික්කය | ඉඩම් කැබලි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. ගාල්ල | 01 | 3. මහනුවර | 54 |
| 2. පොලොන්නරුව | 01 | 4. මාතලේ | 01 |

සහාධිපත්‍ය දේපළ සම්බන්ධව කාලීනව පැන නැගී ඇති ගැටළු නිරාකරණය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග සහ ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් තීන්දු ලබාගැනීමට දේපළ කලමනාකරණ අංශය සම්පූර්ණ කාලය යොදවනු ලබයි. ඒ අනුව බැහැර කිරීම් සම්බන්ධව ගැටළු නිරාකරණය කර ඔප්පු ලබාදිමට කටයුතු කර ඇත.

## ඉඩම් පැවරුම් හා අලෙවි අංශය

01. ඉඩම් පවරා ගැනීම හා අලෙවි අංශයේ කාර්යභාරය

1. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාසඅරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ කටයුතු
11. නිවාස අරමුණු සඳහා ඉඩම් අලෙවි කිරීම සහ වෙනත් අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් බදු පදනමින් බැහැර කිරීම හා යාබද ඉඩම් අලෙවි කිරීම සහ අනවසරකරුවන් නියමානුකුල කිරීම.

02. 2013 ඉලක්ක හා වැඩ සටහන

1. පවරා ගැනීම් අවසන් නොවූ ඉඩම්වල පවරාගැනීම් කටයුතු අවසන් කරගැනීම.
11. ඉඩම් සමීක්ෂණය මගින් හඳුනාගත් හිස් ඉඩම් කැබලි අයදුම්කරුවන් වෙත අලෙවි කිරීම.
111 හඳුනාගත් යාබද ඉඩම් කැබලි අලෙවි කිරීම.
1v. හඳුනාගත් අනවසරකරුවන් පවතින චක්‍රලේඛ අනුව නියමානුකුල කිරීම.
v. නිවාස අලෙවිය

03. ඉලක්ක සපුරා ගැනීම

- රජයේ ඉඩම් 05 ක හා පෞද්ගලික ඉඩම් 03 ක පැවරුම් කටයුතු අවසන් කිරීමට හැකිවිය. භාණ්ඩාගාර මුල්‍ය ප්‍රතිපාදන රුපියල් මිලියන 50 ක් ලැබුණු අතර, පහත 05 හි සඳහන් පෞද්ගලික ඉඩම් සඳහා වන්දි හා පොලී කොටස් වශයෙන් ගෙවන ලද අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් 11 ක සම්පූර්ණ වන්දි මුදල් ගෙවීමටත් කටයුතු කර ඇත.
- ඉඩම් සමීක්ෂණය මගින් හඳුනාගත් හිස් ඉඩම් කැබලි 250 ක් වර්ෂය තුලදී අලෙවි කිරීමට කටයුතු කරන ලද අතර, ඒවායේ වටිනාකම රුපියල් මිලියන 332.98 කි.
- තවද, හඳුනාගත් අනවසරකරුවන් 800 කින් 190 දෙනෙකු නියමානුකුල කිරීමට හැකි වූ අතර, එමගින් අයවිය යුතු මුදල රු. 115,563,387/- ක් වේ. තවද, යාබද ඉඩම් කැබලි 370 කින් 89 ක් අලෙවි කිරීමට හැකි වූ අතර, ආදායම රු. 31,427,909/- කි.
- වර්ෂය තුල අලෙවි කල නිවාස ගණන 34 ක් වන අතර, එහි විටිනාකම රුපියල් 22,429,500 කි.

04.ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවූ බාධක

පුද්ගලික ඉඩම් 45 ක වන්දි හා පොලී වශයෙන් රු.122,217,286.71 ක් 2013.01.01 දිනට ගෙවීමට තිබූ අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් 23 ක් සඳහා රු.30,619,156.31 ක මුදලක් එදිනට ගෙවිය යුතුව තිබිනි. තවත් පෞද්ගලික ඉඩම් 9 ක් සඳහා රු.20,737,385.67 ක් වන්දි හා පොලී වශයෙන් වර්ෂය තුල දී ගෙවීමට ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. තවද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් 2 ක් සඳහා රු. 877.236/- ක මුදලක් ගෙවන ලෙස ඉල්ලා ඇත.

2013 වර්ෂය තුල ලැබුනු භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් රු. 32,955,211.27 ක මුදලක් වැය කර පෞද්ගලික ඉඩම් සඳහා වන්දි හා පොලී මුදල් ගෙවීමට කටයුතු කර ඇති අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් 18 ක් සඳහා රු.16,997,258.50 ක් වැය කර සම්පූර්ණ වටිනාකම ගෙවා අවසන් කරන ලදී. තවද රු.4,614,400/- මුදලක් වැයකර පෞද්ගලික ඉඩමක් මිලදී ගැනීමටද මෙම වර්ෂය තුල කටයුතු කර ඇත. තවද, සමහරක් ඉඩම් සඳහා වන්දි ගෙවීමට ප්‍රථමයෙන් මෙම ඉඩම් සම්බන්ධයෙන් පැන නැගී ඇති නීතිමය ගැටළු නිරාකරණය විය යුතු බැවින්, දන්වා ඇති වන්දි මුදල් ගෙවීමට හැකියාවක් නොතිබූ අතර, ඉඩම් වන්දි ගෙවීමේ දී කොටස් වශයෙන් ගෙවීම් කර ඇති අතර, සම්පූර්ණ මුදල් ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණවත් වී නොමැත. මේ අතර, 2011 වර්ෂයේ සිට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සම්පූර්ණ වටිනාකම ගෙවන ලද ඉඩම් සඳහා තවමත් ගැසට් නිවේදන පල කිරීමට එම කොමිෂන් සභාව කටයුතු නොකිරීම හේතුවෙන් පැවරුම් කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත.

05. වර්ෂය තුල ලබාගත් ජයග්‍රහණ

- පවරා ගත් ඉඩම් ගණන

| රජය | පුද්ගලික | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | වෙනත් ආයතන | ඉඩම් මිලදී ගැනීම |
|---|---|---|---|---|
| 07 | 03 | - | - | 01 |

- අනවසර නියමානුකල කිරීම - 190 කි.
- හිස් ඉඩම් අලෙවිය - කැබලි 250 කි.
- නිවාස අලෙවිය - 34 කි.

## ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය පහත අංශවලින් සමන්විතව 2013 වර්ෂයේදී ජනාවාස සංවර්ධනය සඳහා දායකවිය.

1. ඉංජිනේරු අංශය
2. වාස්තු විද්‍යා අංශය
3. ප්‍රමාණ සමීක්ෂණ අංශය
4. සැලසුම් අංශය
5. විදුලි අංශය
6. නඩත්තු අංශය

පහත සඳහන් වැඩ සටහන් මගින් සියළු ජනකොටස්වල නිවාස අරමුණු හා ඒ සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට හැකියාව ලැබුණි.

## මහල් නිවාස ප්‍රතිසංස්කරණය (නගමු පුරවර)

පැරණි මහල් නිවාස ක්‍රම හා ඒවායේ සියළුම යටිතල පහසුකම් නවීකරණය කර නිවැසියන්ට හිතකර ජනාවාසයක් බවට පත්කිරීම, කළමනාකරණ සංස්ථා ස්ථාපිත කර නිවාස ක්‍රම නඩත්තු කිරීමේ වගකීම නිවැසියන්ට භාරදීම හා පොදු පහසුකම් නඩත්තු කටයුතු අදාල පළාත් පලන ආයතනවලට නීත්‍යානුකූලව භාරදීම නගමු පුරවර වැඩ සටහනේ ප්‍රධාන අරමුණවේ.

2013 වසර තුල නගමු පුරවර ව්‍යාපෘති 25 ක් ආරම්භ කිරීමට සැලසුම් කල අතර ප්‍රසම්පාදන කටයුතු අවසන් කළද, ව්‍යාපෘති 22 ක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට හැකිවිය.

කොළඹ නාගරික බල ප්‍රදේශයේ ව්‍යාපෘතිවල ටෙන්ඩර් සඳහා ඉල්ලුම අඩු වූ බැවින් 2013 ජූලි මස 23 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා කොළඹ නාගරික බල ප්‍රදේශ ව්‍යාපෘති 17 ප්‍රතිසංස්කරණය කිරීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරන ලදී.

**<u>මහල් නිවාස ප්‍රතිසංස්කරණ ප්‍රගතිය - 2013</u>**

| අනු අංකය | ව්‍යාපෘතිය | නිවාස ගණන | කොන්ත්‍රාත් මුදල (වැට් සහිත) රු.මි. | 2013.12.31 දිනට ප්‍රගතිය | | වෙනත් |
|---|---|---|---|---|---|---|
| | | | | භෞතික | මූල්‍ය | |
| 01 | ගුරු නගර් - යාපනය | 160 | 100.0 | 90% | 53.4 | |
| 02 | සොයිසාපුර අදියර II | 960 | 102.00 | 65.0% | | |
| 03 | මිහිඳු මාවත නිවාස යෝජනා ක්‍රමය | 125 | 23.5 | 20% | 4.69 | |
| 04 | ආරාමය පෙදෙස නිවාස යෝජනා ක්‍රමය | 96 | 18.5 | 18% | 3.50 | |
| 05 | ගුණසිංහපුර නිවාස යෝජනා ක්‍රමය | 536 | 133.5 | 10% | 26.7 | |
| 06 | ආදුරුප්පු වීදිය නිවාස යෝජනා ක්‍රමය | 108 | 23.0 | 23% | 4.57 | |
| 07 | අබ්දුල් හමීඩ් නිවාස යෝජනා ක්‍රමය | 95 | 13.5 | 10% | 2.70 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 08 | ආමර් වීදිය නිවාස යෝජනා ක්‍රමය | 810 | 33.0 | 10% | 6.49 | |
| 09 | සමඟිපුර නිවාස යෝජනා ක්‍රමය | 244 | 110.5 | 18% | 21.96 | |
| 10 | සාමපුර නිවාස යෝජනා ක්‍රමය | 136 | 46.5 | 15% | 9.30 | |
| 11 | සිරිධම්ම මාවත නිවාස යෝජනා ක්‍රමය | 72 | 13.5 | 15% | 2.62 | |
| 12 | සංඝරාජ මාවත නිවාස යෝජනා ක්‍රමය අදියර 1 හා 2 | 255 | 85.5 | | 17.06 | මෙම ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරඇත. අත්තිකාරම් මුදල් ගෙවාඇත. |
| 13 | මොහිදීන් මස්ජිඩ් නිවාස යෝජනා ක්‍රමය | 16 | 3.5 | | 0.63 | |
| 14 | සූරියමල්පුර නිවාස යෝජනා ක්‍රමය | 68 | 8.5 | | 1.70 | |
| 15 | සුචරිත මාවත නිවාස යෝජනා ක්‍රමය | 32 | 14.0 | | 2.78 | |
| 16 | බ්ලූමැන්ඩල් නිවාස යෝජනා ක්‍රමය | 392 | 60.0 | | 12.00 | |
| 17 | පල්ලියවත්ත නිවාස යෝජනා ක්‍රමය | 72 | 11.0 | | 2.15 | |
| 18 | කාකදූපත නිවාස යෝජනා ක්‍රමයේ ප්‍රජාශාලාව මළනාලිකා,කාණු පද්ධතිය හා ළමා උද්‍යානය ප්‍රතිසංස්කරණය | 353 | 5.0<br>5.0 | | - | |
| 19 | සිරිමාපුර නිවාස යෝජනා ක්‍රමය | 80 | 13.0 | | 2.60 | |
| 20 | ජයවඩනගම - (පොකුණ අපවිත්‍ර කරන මනුවලවල් ප්‍රතිසංස්කරණය කිරීම) | 705 | 5.0 | | | ජාතික ජල සම්පාදන මණ්ඩලයට මුදල් ගෙවා ප්‍රසම්පාදන කටයුතු නිමකර ඇත. |
| 21 | රාහුලපුර මළනාලිකා පද්ධති ප්‍රතිසංස්කරණය | 100 | 2.54 | 25% | | |
| 22 | එගොඩඋයන නිවාස යෝජනා ක්‍රමය | 64 | 18.55 | 10% | | |
| 23 | නුපෙවෙල මළනාලිකා පද්ධති ප්‍රතිසංස්කරණය | 201 | 15.5 | | | ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. |
| 24 | රද්දොළගම ප්‍රේක්ෂකාගාරය | - | 4.0 | | | ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 25 | මාලිගාවත්ත අදියර II | 1520 | 80.00 | 100% | | |
| 26 | සහස්‍රපුර හා සිංහපුර | 731 | 75.0 | | | |
| | **එකතුව** | **7931** | **1023.59** | | | |

**සහස්‍රපුර හා සිංහපුර** නිවාස ව්‍යාපෘති ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රතිපාදන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරනු ලැබීය.

ඉතිරි නිවාස ව්‍යාපෘති ජනවාරි මස ආරම්භ කිරීමට නියමිතය. නූපෙවෙල මළ නාලිකා පද්ධති ප්‍රසම්පාදන කටයතු නිමකර කොන්ත්‍රාත් ලබාදීමට කටයුතු යොදා ඇත.

වසර තිහ හතලිහක් පැරණි විශාල මහල් නිවාස ක්‍රම වන මාළිගාවත්ත සහ සොයිසාපුර නිවාස ක්‍රමවල ප්‍රතිසංස්කරණ ඒවායේ ඇති සංකීර්ණභාවය සහ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ ගැටළුකාරී තත්වය නිසාම වැඩ නිම කිරීමට බලාපොරොත්තු වූවාට වැඩි කාලයක් ගතවිය. ඒ නිසාම 2011 සිට අදියර කිහිපයක් යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට සිදු වි ඇත.

## මාලිගාවත්ත

නිවාස 1520 කින් සමන්විත වන අතර අක්කර 46 ක් පුරා විහිදී ඇති මාලිගාවත්ත නිවාස ක්‍රමයේ අදියර I ප්‍රතිසංස්කරණ කටයුතු 2012 ජූලි 25 දිනට අවසන් වූ අතර, අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණයට ද ලක්විය.

මාලිගාවත්ත - එදා | අද









එහි II අදියර ප්‍රතිසංස්කරණය 2013,12.31 දිනට සම්පූර්ණයෙන් නිම කර ඇත. මාලිගාවත්ත නිවාස ක්‍රමයේ ගොඩනැගිලි හා සියළු යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලි.356.0 ක් (වැට් සහිතව) වැය වි ඇත. ප්‍රධාන වශයෙන් ගොඩනැගිලි අළුත්වැඩියාව, කිලෝමීටර් 3.4 මාර්ග කාපට් කිරීම, කාණු පද්ධති, මළනාලිකා පද්ධති, ජල කුළුණ හා පොදු ගොඩනැගිලි ආදිය ප්‍රතිසංස්කරණයට ඇතුලත් වූ අතර, මහල් නිවාසවල සිටින ජනතවගේ අධ්‍යාත්මික ගුණධර්ම වැඩිදියුණු කර අලංකාර ජනාවාසයක් බවට පත් කිරීම සඳහා ක්‍රිඩා පිටි, උද්‍යාන අලංකරණය හා බුදු මැදුරක් අළුතින් ඉදිකිරීම ද සිදුකරන ලදී.

## සොයිසාපුර

සොයිසාපුර නිවාස ක්‍රමයේ අදියර I ප්‍රතිසංස්කරණය රු.මි.100.0 ක වියදමින් අවසන් කර 2012.10.07 අතිගරු ජනාධිපතිතුමා අතින් ජනතා අයිතියට පත් කරන ලදී.

නිවාස 1920 කින් සමන්විත සොයිසාපුර නිවාස 462 ක් අදියර I යටතේ ප්‍රතිසංස්කරණය කරන ලදී. ඉතා පැරණි මහල් නිවාස වන A,B,C.R,S,M & N සහ C3,B34 යන මහල් නිවාස ද ළමා උයන, කිලෝමීටර් 1 1/2 ක් මාර්ගය කාපට් කිරීම, ප්‍රජා ශාලාව, පුස්තකාලය, ක්‍රීඩාගාර, මළනාලිකා පද්ධති,කාණු පද්ධති ද සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කරන ලදී. අලංකාර බුදු මැදුරක් ද ඉදිකර ඇති අතර 2013 ලෝක ජනාවාස දින උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් සොයිසාපුර නිවාස ක්‍රමයේ පැවැත්වීම ද විශේෂත්වයකි.

### සොයිසාපුර අදියර I

එදා



අද







සොයිසාපුර අදියර II යටතේ නිවාස 960 කට අයත් සියළු ප්‍රතිසංස්කරණ වැඩ 2014 අප්‍රේල් 30 දිනට අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, 2013 දෙසැම්බර් 31 දිනට 65% ක ප්‍රගතියක් ලබා ඇත. අදියර II ප්‍රතිසංස්කරණය යටතේ මාර්ගය කි.මී.1.5 ක්, මළනාලිකා පද්ධතිය, පොදු කාණු පද්ධති හා ගොඩනැගිලි නවීකරණය කිරීම සිදුවේ.

<u>සොයිසාපුර අදියර</u> II

<u>එදා</u> <u>අද</u>





ගුරුනගර් - යාපනය - යුද්ධයෙන් දැඩිලෙස හානියට පත් වූ ගුරුනගර් නිවාස ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය වන අයුරු පහත දැක්වේ.

<u>එදා</u> <u>අද</u>




<u>සමගිපුර නිවාස ව්‍යාපෘතිය</u>

<u>එදා</u> <u>අද</u>




## එගොඩඋයන නිවාස ව්‍යාපෘතිය

එදා　　　　　　　　　　　　　　　　　අද





## නිවාස ක්‍රමවල මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

ජයවඩනගම පොකුණට අපවිත්‍ර ගලා එන මනුවලවල් 07 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට රු.මි. 4.3 ගෙවා ඇත. අදාල ප්‍රතිසංස්කරණ ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

ජයවඩනගම පොදු මළනාලිකා පද්ධතියට සම්බන්ධ කර නැති නිවාසවල මනුවලවල් /මළනාලිකා ප්‍රතිසංස්කරණය රු.මි.8.0 ක වියදමින් සිදුකරඇත. පොම්ප මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කටයුතු ආරම්භ කර ඇත.

## දිස්ත්‍රික් කාර්යාල ප්‍රතිසංස්කරණය කිරීම

- මාතර දිස්ත්‍රික් කාර්යාලයේ පළමු මහල ඉදිකිරීම 2012.07.22 දින ආරම්භ කර 2013.05.02 දින අවසන් කල අතර වියදම් වූ මුදල රු.මි.16.5 කි.





මහනුවර මහලේකම් ගොඩනැගිල්ල නවීකරණය කිරීම 2013.02.01 දින ආරම්භ කර 2013.12.31 දිනට ප්‍රගතිය 88% කි. ඉදිකිරීම් අවසන් කර ඇත. 2014.01.31 දිනට අවසන් කිරීමට නියමිතය.

එදා | අද





## කොළඹ අවට නිවාස ක්‍රමවල හදිසි අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු

කොළඹ නාගරික සීමාබද ප්‍රදේශවල වසර 10 කට වඩා වැඩි කලකට පෙර ඉදිකිරීම් කරන ලද බොහෝ නිවාස ක්‍රමවල සේවා සැපයීම ජාතික ජලසම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය සහ කොළඹ මහ නගර සභාව මඟින් සිදු කරනු ලැබේ. නිවාස විකුණා හෝ එසේ නැතිනම් කුලී පදනම මත පැවතියද එම නිවාස තුළ ජලනල පද්ධති, මළ ප්‍රවාහන පද්ධති සහ මනුවලවල් පොම්පාගාර නඩත්තු කටයුතු ද මේ දක්වා ඉටු කරනු ලබන්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟිනි. ජල සැපයුම් පද්ධති සම්බන්ධයෙන් නිතර නිතර පැමිණිලි ලැබෙන හෙයින්, හදිසි අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතුවල ඍජුව සම්බන්ධ විය හැකි පරිදි අළුත්වැඩියා සහ නඩත්තු ඒකකයන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තුල පිහිටුවා එය දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මකව පවතී. මෙම ඒකකය මඟින් මාසයකට සිදුකෙරෙන හදිසි අළුත්වැඩියාවන් සංඛ්‍යාව 100 ඉක්මවනු ලබන අතර ඒ සඳහා වැයවන මුදල රු.මි.1.30 කි. තවද, මළ ප්‍රවාහන පද්ධති සහ මළ පොම්පාගාර හා කැළිකසල බැහැර කිරීම කොන්ත්‍රාත්කරුවන් යොදා සිදුකරනු ලබයි. මේ සඳහා 2013 වසර තුල රු.මි.3.91 වැය කර ඇත.

නිවාස 248 කින් යුත් මුල්ලේරියාව නිවාස ක්‍රමයේ මළ පිරිපහදු පද්ධතිය නඩත්තු කටයුතු සහ අළුත්වැඩියා වියදම රු.මි.0.42 කි.

## "සහශ්‍ර ලංකා" වැඩ සටහන යටතේ නිවාස සංවර්ධන ව්‍යාපෘති

"සහශ්‍ර ලංකා" වැඩ සටහන යටතේ 117 ඇල්විටිගල අදියර නිවාස ව්‍යාපෘතිය 2013.01.31 අවසන් කර ඇත. නිවාස 04 කින් සමන්විත නිවසක වර්ගඵලය වර්ගඅඩි 1300 කි. සෑම නිවසකටම රථගාල් ලබා දී ඇත.





- ලුවිසාවත්ත නිවාස ව්‍යාපෘතියේ නව නිවාස 30 ක් 2013 ජූලි 23 ආරම්භ කර ඇත. 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය 43% කි. මේ සඳහා වියදම රු.මි. 76කි.
- අඩක් නිමකල ඉතිරි නිවාස 36 වැඩ 2012.07.11 දින ආරම්භ කර 2013,12.31 ට 56% ක ප්‍රගතියක් ලබා ඇත. කොන්ත්‍රාත් මිල රු.මි.72 කි. මේවන විට නිවාස 33 ක් විකුණා මූලික අත්තිකාරම් මුදල් ලබා ඇත.
- කුරුණෑගල දිස්ත්‍රික්කයේ වෙලන්ගොල්ල නිවාස ක්‍රමයේ ඉදිකිරීම් 2012 ජනවාරි මස 12 දින ආරම්භ කරන ලදී. වර්ග අඩි 1900 ක් සහ වර්ග අඩි 2200 පමණ වූ දෙමහල් නිවාස වර්ග දෙකකින් සමන්විත මෙම නිවාස ක්‍රමයේ මුළු නිවාස ගණන 23 කි. 95% නිවාස නිම කර ඇත. මේ සඳහා වියදම රු.මි.163 කි.



**TYPE -A**



**TYPE -C**

## පුනස්ථාපන ව්‍යාපෘති

පුනස්ථාපන ව්‍යාපෘති යටතේ සොයිසාපුර අදියර I සහ සුලෝහිතපුර II අදියර ආරම්භ කර ඇත.

සුලෝහිතපුර II අදියර යටතේ නිවාස 16 කින් යුත් සිව්මහල් ගොඩනැගිල්ලක් රු.මි.25 ක වියදමින් ඉදි කර ඇත. 2013.01.31 වන විට 100% ප්‍රගතියක් ලබා ඇත.

## සුලෝහිතපුර අදියර II

එදා



අද



සොයිසාපුර නිවාස ව්‍යාපෘතිය අදියර I 2012.08.23 ආරම්භ කර ඇති අතර 2013.10.07 දින අවසන් කර ඇත. සොයිසාපුර මහල් නිවාස සංකීර්ණය මහල් නිවාස ගොඩනැගිලි 05 කින් හා සියළු යටිතල පහසුකම්වලින් සමන්විත වේ. එක් ගොඩනැගිල්ලක ඇති නිවාස ගණන 20 කි. මේ අනුව මෙම ව්‍යාපෘතියේ මුළු නිවාස ගණන 100 කි. මේ සඳහා ඇස්තමේන්තුගත වියදම (වැට් සහිත) රු.මි.45 කි.

සොයිසාපුර නිවාස ව්‍යාපෘතිය අදියර II අළුත්වැඩියා සඳහා 2013.10.07 දින කැබිනට් අනුමැතිය ඉල්ලා ඇත. ඒ සඳහා 2013.11.11 දින අනුමැතිය ලැබුණි.

එදා





අද



## "ජන සෙවණ සහස්‍ර ලංකා" වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන දේශීය/විදේශීය ආයෝජන නිවාස ව්‍යාපෘති

ජාතික නිවාස හා ජනවාස සංවර්ධන මෙහෙයුම යටතේ ක්‍රියාත්මක "ජනසෙවණ සහස්‍රලංකා" නිවාස වැඩ සටහන, මෙතෙක් ක්‍රියාත්මක වූ නිවාස වැඩ සටහන් තුල සුවිශේෂී තැනක් හිමි කරගනී. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම්වල රාජ්‍ය හා පෞද්ගලික අංශය ඒකාබද්ධව ක්‍රියාත්මක මෙම වැඩසටහන සඳහා දේශීය මෙන්ම විදේශීය ආයෝජකයින් අරමුදල් යොදවා නිවාස ව්‍යාපෘති ඉදිකරනු ලැබේ. සියළු ව්‍යාපෘති කැබිනට් අනුමැතිය ලබා ක්‍රියාත්මක වේ.

නිවාස ව්‍යාපෘතියට අයත් ඉඩමේ වර්තමාන තක්සේරු වටිනාකම සහ ව්‍යාපෘතියේ ලාභයෙන් 10% ක ප්‍රමාණයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ප්‍රතිලාභ වශයෙන් ලැබේ. නිවාස විකිණීම ආයෝජකයා විසින් ඉටුකරනු ලබන අතර, ගැණුම්කරුවන්ට තමන් ආයෝජනය කරන මුදල් වල සුරක්ෂිතභාවය තහවුරුවන ආකාරයට ව්‍යාපෘති සැලසුම් කර ඇත.

ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රගතිය 25% ක මට්ටමකට ලඟා වූ පසු ආයෝජකයාට මුදල් ලබාගත හැකි වන පරිදි එස්ක්‍රෝ ගිණුමක් මගින් අරමුදල් එක්රැස් කරනු ලැබේ. 2013.12.31 දිනට ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය පහතින් දක්වා ඇත.

- විදේශීය ආයෝජන ව්‍යාපෘති යටතේ කිරුලපන මිහිඳුපුර ව්‍යාපෘති සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීමට හැකිවිය. මිහිඳුපුර ව්‍යාපෘතිය නිවාස 560 කින් සමන්විත වන අතර එහි සියළු යටිතල පහසුකම්වලින් සමන්විතවේ. ඉදිකිරීම වියදම රු.බිලියන 6.3 කි. සංවර්ධන බලපත්‍රය ලබාගැනීම සඳහා අවශය ලියකියවිලි නාගරික සංවර්ධන අධිකාරියට භාර දී 2014 වර්ෂය මුල ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිතය.

- ගම්පහ දිස්ත්‍රික්කයේ යක්කල වැරැල්ලවත්ත සහ ලංකා ලෝහ ඉඩම සඳහා නිවාස 864 ක්ද හෝමාගම මවුන්ට් ක්ලිපර්ඩ් ව්‍යාපෘති මහල් නිවාස 1064 ක් සැලසුම් කර කැබිනට් අනුමැතිය

ලබා 2013.01.10 ගිවිසුම් අත්සන් කර ලදී. විදේශීය ආයෝජක සමාගම ගිවිසුම් ප්‍රකාර මූල්‍ය බැඳුම්කර ලබාදීමට අපොහොසත් වූ බැවින් රු.මි.51.97 ක් හා රු.මි. 55.8 ක් පිළිවෙලින් යක්කල හා හෝමාගම ව්‍යාපෘති සඳහා දඩ අයකර ගන්නා ලදී.

- රජයේ නීතිපති දෙපාර්තමේන්තු නීතිඥ සංගමයේ ඉල්ලීම පරිදි මහල් නිවාස 20 කින් යුත් නිවාස 80 කින් සමන්විත ගොඩනැගිල්ල නාරාහේන්පිට ඉඩමක ඉදිකිරීමට සැලසුම් කර ඇත. කැබිනට් අනුමැතිය ලබා 2014 මුල් කාර්තුවේ වැඩ ආරම්භ කිරීමට නියමිතය. මූල්‍ය ප්‍රතිපාදන නීතිඥ සංගමය රාජ්‍ය බැංකුවක් හරහා ලබාදීම නියමිතය.

## 1. යක්කල - සියනෑ නේචර් පාර්ක් නිවාස ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර, දේශීය ආයෝජකයකු තෝරාගෙන ඇත. නිවාස ඒකක 40 කින් සමන්විත මෙහි ඉඩම එළිපෙහෙළි කර සැලසුම් සකස් කර ඉදිකිරීම් ආරම්භ කර ඇත. ව්‍යාපෘතිය සඳහා මුළු වියදම රු.මි.158.80 කි. එක නිවසක විකුණුම් මිල රු.මි.4.3 ක් වන අතර නිවසක් වර්ග අඩි 884 කින් සමන්විතවේ.

## 2. මහනුවර - පල්ලේකැලේ රිජන්සි පාර්ක් නිවාස ව්‍යාපෘතිය

මහනුවර පල්ලේකැලේ ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති මෙම ව්‍යාපෘතිය සඳහාද කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර, දේශීය ආයෝජකයකු තෝරාගෙන ඇත. නිවාස ඒකක 21 කින් හා කඩසාප්පු 28 කින් සමන්විතවේ. නිවසක් වර්ග අඩි 1000 බැගින් නිවාස 18 ද වර්ග අඩි 1940 බැගින් නිවාස 03 ක් ද වේ. නිවසක විකුණුම් මිල රු.මි.8.5 ක් හා මි.14.5 කි.

ඉඩම එළිපෙහෙළි කර සැලසුම් සකස් කර ඉදිකිරීම් ආරම්භ කර ඇත. ව්‍යාපෘතිය සඳහා මුළු වියදම රු.මි.240 කි.

## 3. කොළඹ- කවිරත්න පෙදෙස නිවාස ව්‍යාපෘතිය

කැබිනට් අනුමැතිය ලැබී ඇති මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා විදේශීය ආයෝජක සමාගමක් තෝරාගෙන ඇත. නිවාස ඒකක 28 කින් සමන්විත මෙහි ව්‍යාපෘති වියදම රු.මි.805.6 කි.

## 4. කොළඹ-රනාල ජල්තර නිවාස ව්‍යාපෘතිය

අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමුකර ඇති මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් දේශීය ආයෝජකයකු තෝරාගෙන ඇත.නිවාස ඒකක 150 කින් සමන්විත වන අතර ව්‍යාපෘති වියදම රු.මි.855.66 කි.

## 5. කොළඹ - සයිමන්ඩේල්වත්ත නිවාස ව්‍යාපෘතිය

විදේශීය ආයෝජකයකු සමඟ මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇත. නිවාස ඒකක 192 කින් සමන්විත වන අතර ව්‍යාපෘති වියදම රු.මි.1329.65 කි.

## 6. මහනුවර - හන්තාන රෙසිඩන්සීස් නිවාස ව්‍යාපෘතිය

දේශීය ආයෝජකයකු මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතර, නිවාස ඒකක 126 කි. ව්‍යාපෘතියේ මුළු වියදම රු.මි.1459.5 කි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

## 7. මහනුවර - හන්තාන දුනුමඩලාව විලාස් නිවාස ව්‍යාපෘතිය

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති මෙම ව්‍යාපෘතියේ නිවාස ඒකක 19 කි. ව්‍යාපෘතියේ මුළු වියදම රු.මි.188.0 කි.

## 8. රත්නපුර - ගල්කඩුවවත්ත නිවාස ව්‍යාපෘතිය

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. නිවාස ඒකක 130 කි. ව්‍යාපෘතිය සඳහා මුළු වියදම රු.මි.932.0 කි.

## මානව සම්පත් කළමණාකරණ

## ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සැලැස්ම

ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සභාපති, උප සභාපති, සාමාන්‍යාධිකාරි, ක්‍රියාකාරි අධ්‍යක්ෂ හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කොට්ඨාශ 09ක් යටතේ වෙන්කර ඇත. මීට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25ක් හා කොළඹ නගර කාර්යාල 03 ක් හා කල්මුණේ උප කාර්යාලයක් ද පිහිටුවා ඇත.

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය පහත සඳහන් අංශවලින් සමන්විතවේ.

1. මානව සම්පත් අංශය
2. පාලන අංශය
3. විනය අංශය
4. ප්‍රවාහන අංශය
5. සැපයුම් අංශය
6. පුහුණු අංශය
7. මාණ්ඩලික නිවාස අංශය
8. ආරක්ෂක අංශය

# ස්ථිර කාර්ය මණ්ඩල සංයුතිය 2013.12.31 දිනට

| අනු අංකය | මට්ටම | වැටුප් කාණ්ඩය | සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | අනුමත | භෞතික සේවක සංඛ්‍යාව | | | |
| | | | | ස්ථිර | කොන්ත්‍රාත් | දෛනික | එකතුව |
| 1 | ජ්‍යෙෂ්ඨ | HM 2 - 1 | 1 | 1 | | | 1 |
| 2 | ජ්‍යෙෂ්ඨ | HM 1 - 3 | 6 | 5 | | | 5 |
| 3 | ජ්‍යෙෂ්ඨ | HM 1 - 1 | 10 | 9 | 1 | | 10 |
| 4 | ජ්‍යෙෂ්ඨ | MM 1 - 1 | 97 | 87 | 3 | | 90 |
| 5 | තෘතීය | JM 1 - 1 | 143 | 127 | 2 | | 129 |
| 6 | ද්විතීය | MA 5 - 2 | 16 | 153 | | | 153 |
| 7 | ද්විතීය | MA 2 - 2 | 352 | 408 | 13 | 6 | 427 |
| 8 | ද්විතීය | MA 1 - 2 | 545 | 677 | 4 | 341 | 1022 |
| 9 | ප්‍රාථමික | PL 3 | 75 | 162 | 4 | 13 | 179 |
| 10 | ප්‍රාථමික | PL 2 | 25 | 20 | 1 | 10 | 31 |
| 11 | ප්‍රාථමික | PL 1 | 105 | 140 | 14 | 106 | 260 |
| එකතුව | | | **1375** | **1789** | 42 | 476 | 2307 |

**සාරාංශය**

| මට්ටම | අනුමත | සිටින |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 114 | 106 |
| තෘතීය | 143 | 129 |
| ද්විතීය | 913 | 1602 |
| ප්‍රාථමික | 205 | 470 |
| එකතුව | **1375** | **2307** |

# 2013.12.31 දිනට තාවකාලික කාර්ය මණ්ඩලය

| අනු අංකය | මට්ටම | වැටුප් කාණ්ඩය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | කොන්ත්‍රාත් (විශ්‍රාමිකයන් නැවත සේවයේ යෙදවීම) | කොන්ත්‍රාත් (ඉදුරාම බඳවා ගැනීම්) | දෛනික |
| 1 | ජ්‍යෙෂ්ඨ | HM 1 - 1 | | 1 | |
| 2 | ජ්‍යෙෂ්ඨ | MM 1 - 1 | 1 | 2 | 0 |
| 3 | තෘතීය | JM 1 - 1 | 1 | 1 | 0 |
| 4 | ද්විතීය | MA 2 - 2 | | 13 | 6 |
| 5 | ද්විතීය | MA 1 - 2 | | 4 | 341 |
| 6 | ප්‍රාථමික | PL 3 | | 4 | 13 |
| 7 | ප්‍රාථමික | PL 2 | | 1 | 10 |
| 8 | ප්‍රාථමික | PL 1 | 1 | 13 | 106 |
| එකතුව | | | **3** | **39** | **476** |

## පාලන අංශය

### 2013 වර්ෂයේ පාලන කොට්ඨාශයේ ඉටුකල කාර්යයන්

1. 2013 වර්ෂය වෙනුවෙන් සේවකයන් වෙත ප්‍රසාද දීමනා වශයෙන් රු.1000/-ක් හා දිරි දීමනා වශයෙන් රු.2000/- ක මුදලක් ගෙවන ලදී.
2. ඉකුත් වර්ෂය සඳහා ලබා නොගත් විවේක නිවාඩු සඳහා ගෙවීම් කිරීම.
3. බරපතල සැත්කම් යටතේ ගෙවීම් කිරීමේදී පිළිකා රෝගය සඳහා ගෙවීම් කිරීමට ඇතුලත් කර ඇති අතර අනිකුත් වෛද්‍ය ප්‍රතිලාභ ද සාමාන්‍ය ආකාරයෙන් ගෙවීම් කර ඇත.
4. ආපදා ණය, යැපීම් දීමනා ගෙවීම් කටයුතු හා දිස්ත්‍රික් කාර්යාලවල කුලී දීමනා ගෙවීම් කටයුතු කර ඇත.

## මාණ්ඩලික නිවාස ණය

2013 වර්ෂය සඳහා රු.මි.78.600 ක් මාණ්ඩලික නිවාස ණය සඳහා ප්‍රතිපාදන වශයෙන් ලැබුණි. ප්‍රධාන කාර්යාලය සඳහා රු.මි.20.000 ක් ද දිස්ත්‍රික් කාර්යාල සඳහා රු.මි. 58.600 ක් ද වශයෙනි.

එම ප්‍රතිපාදනවලින් පහත සඳහන් ආකාරයට නිවාස ණය මුදල් අනුමත කර ඇත.

| ශ්‍රේණිය රු. | ප්‍රධාන කාර්යාලය රු. | දිස්ත්‍රික් කාර්යාලය රු. | ගෙවා ඇති මුළු මුදල රු. |
|---|---|---|---|
| 1 - VI | 700,000.00 | 2,300,000.00 | 3,000,000.00 |
| VII – VII A | 1,617,940.00 | 1,522,482.11 | 3,140,422.11 |
| VIII – IX | 618,800.00 | 2,690,000.00 | 3,308,800.00 |
| X | 650,000.00 | - | 650,000.00 |
| | 3,586,740.00 | 6,512,482.11 | 10,099222.11 |

### විනය කටයුතු

සමස්ථ අධිකාරියේ විනය කටයුතු සම්බන්ධව රාජකාරි ඉටුකරනු ලබන්නේ විනය කටයුතු අංශයෙනි. 2013 වර්ෂය තුල විධිමත් විනය පරීක්ෂණ 23 ක් පැවති අතර, ඉන් පරීක්ෂණ 17 ක් අවසන් කර ඇත. එම අවසන් පරීක්ෂණ 17 න් 09 ක විනය නියෝග 2013 වර්ෂය තුලදී නිකුත් කර ඇත.

## ආරක්ෂක සේවා

### සම්පාදනය කල ඉලක්ක

I. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරක්ෂක අංශය ලෙස අධිකාරිය සතු චංචල / නිශ්චල දේපල හා මානව සම්පත් ආරක්ෂා කිරීම, ආයතනික කීර්තිනාමය හා සේවක විනය ආරක්ෂා කිරීම සඳහා පූර්ණ ශක්තිය හා ක්‍රමවේදයන් යොදා කටයුතු කරනු ලැබීය.

II. පසුගිය වසර තුල ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් නොපැවතියද අඛණ්ඩව ආරක්ෂක සේවා පෙර පැවති තත්ත්වයෙන්ම මේ දක්වා පවත්වාගෙන යාමට සිදුවිය.

III. 2013 ජනවාරි මස වනවිට ආරක්ෂක කාර්ය මණ්ඩලය 126 දක්වා අඩු වූ අතර, තත්වය එසේ තිබියදීත්, ආරක්ෂක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුවිය.

IV. ප්‍රධාන කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන සේවා ස්ථාන කීපයක් සඳහා ආරක්ෂක නිලධාරීන් විවිධ ක්‍රම උපායන් යොදා ආරක්ෂාව තහවුරු කර ගැනීමට සිදුවිය.

එසේ ආරක්ෂක නිලධාරීන් යෙදවූ සේවා ස්ථාන

I. ජල්තර රජයේ සේවක නිවාස ව්‍යාපෘතිය
II. මාලිගාවත්ත ලොකු හා කුඩා ප්‍රදීපා ශාලාමෝදර හා ගුණසිංහපුර ප්‍රදීපාශාලා නාරාහේන්පිට 117 වත්ත II අදියර නිවාස යෝජනා ක්‍රමය
III. සොයිසාපුර කලාප කාර්යාලය
IV. රත්මලාන වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් පවරාගත් ඉඩම
V. කොළඹ නගර උතුර කාර්යාලයට අයත් මුද්‍රා තබන ලද කඩ සාප්පු

## ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල

1. ප්‍රධාන කාර්යාලය ඇතුළුව නිවාස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි කාර්යාල සඳහා පැමිණෙන සියළුම වාහන හා පුද්ගලයින්, ගමන්මළු ආදිය පරීක්ෂාවට ලක්කිරීම හා අදාල අංශ වෙත යොමු කිරීම.

2. ආරක්ෂක නිලධාරීන් වෙත උපදෙස් පංති පැවැත්වීම, දිස්ත්‍රික් කාර්යාල හා සියළුම සේවා ස්ථාන සඳහා අවශ්‍ය රාජකාරි උපදෙස් ලිඛිතව නිකුත් කිරීම, එකී උපදෙස් සම්බන්ධව අංශ ප්‍රධානීන් හා දිස්ත්‍රික් කළමණාකරුවන් දැනුවත් කිරීම, ආරක්ෂක නිලධාරීන් සතු වගකීම් හා කාර්ය භාරය සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම.

3. සේවක/සේවිකාවන්ගේ රාජකාරියට පැමිණීම හා පිටවීම සම්බන්ධව සටහන් පවත්වාගෙනයාම හා වේලා සටහන් යන්ත්‍ර ආරක්ෂාව සඳහා පියවර ගැනීම.

4. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කීර්තිනාමයට හානිකර කටයුතු වැලැක්වීම හා වංචනික ක්‍රියා හා අලාභකිරීමේ චේතනාවෙන් කෙරෙන ක්‍රියාවන් සොයාබලා වාර්තා කිරීම හා විනය පවත්වාගෙන යාමට සහායවීම.

5. කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය මූලිකව පවත්වාගෙන යනු ලබන අධි ආරක්ෂිත කලාපයෙහි පිහිටි ආයතන, ආරක්ෂක කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා එහිදී ගනු ලබන තීරණ හා ලබාදෙන උපදෙස් පරිදි කටයුතු කිරීම, ඒ සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම.

6. පාලන අධිකාරියේ තීරණ මත සේවා ස්ථාන සඳහා ආරක්ෂක පිරිස් යෙදවීම අවම මට්ටමක පවත්වාගෙන යාම, අතිකාල අවම කරගැනීමට කටයුතු කිරීම හා ඒ තුලින් අධිකාරියේ මූල්‍ය තත්වය ආරක්ෂා කර ගැනිම.

7. නිවාස මහලේකම් ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා ගිණි අවි සන්නද්ධ ආරක්ෂක පිරිස් යෙදවීම.

8. අධිකරණ නියෝග ලබාගත් අනවසර පදිංචිකරුවන් ඉවත්කිරීමේ මෙහෙයුම් සඳහා ආරක්ෂක නිලධාරීන් සහභාගි කරවීම හා හිස් භුක්තිය බාරගන්නා ලද එකී නිවාසවලට නැවත ඇතුළුවීම වැලැක්විම සඳහා අවශ්‍ය ආරක්ෂක කටයුතු සංවිධානය කිරීම හා ක්‍රියාවට නැංවීම.

## විශේෂිත කරුණු

1. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරක්ෂක නිලධාරීන් සඳහා ජීව වෙඩි පුහුණු වැඩ සටහන් වැනි පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

2. ආරක්ෂක නිලධාරී පුහුණු පාඨමාලා මෙන්ම විනය ක්‍රියාපිළිවෙත් වැනි පුහුණු පාඨමාලා හැදෑරූ ආරක්ෂක නිලධාරීන් සාර්ථකව එම පාඨමාලා හදාරා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කීර්තිනාමය රැකගනිමින් සියළුම විෂයයන් සඳහා කුසලතා හිමිකර ගෙන ඇත.

## පුහුණු වැඩ සටහන් - 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

පුහුණු වැඩසටහන් සඳහා වෙන්කල මුදල - රු.**4,725,000.00**

| අනු අංකය | කාණ්ඩය | වැඩ සටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත මුදල (රු.) | වියදම් වූ මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| 1 | අභ්‍යන්තර පුහුණු වැඩ සටහන | 11 | 347 | 2,000,000.00 | 289,043.00 | 1,710,957.00 |
| 2 | බාහිර පුහුණු වැඩ සටහන - දේශීය | 26 | 75 | 1,000,000.00 | 286,110.00 | 713,890.00 |
| 3 | බාහිර පුහුණු වැඩ සටහන - විදේශීය | 2 | 4 | 1,725,000.00 | 1,231,657.00 | 493,343.00 |
| | | 39 | 427 | 4,725,000.00 | 1,806,810.00 | 2,918,190.00 |

## ස්වාභිමත පුහුණු වැඩ සටහන (ණය)

පුහුණු ණය සඳහා වෙන් කල මුදල - රු.**6,500,000.00**

ප්‍රධාන කාර්යාලය : රු. **2,000,000.00**

දිස්ත්‍රික් කාර්යාල : රු. **4,500,000.00**

| අනු අංකය | කාණ්ඩය | වැඩ සටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත මුදල (රු.) | වියදම් වූ මුදල (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| | ස්වාභිමත පුහුණු ණය - ප්‍රධාන කාර්යාලය | 12 | 15 | 2,000,000.00 | 342,500.00 | 1,657,500.00 |
| | ස්වාභිමත පුහුණු ණය - දිස්ත්‍රික් කර්යාල | | 67 | 4,500,000.00 | 925,000.00 | 3,575,000.00 |
| | එකතුව | 12 | 82 | 6,500,000.00 | 1,267,500.00 | 5,232,500.00 |

## ලබා දී ඇති අධ්‍යයන නිවාඩු

| අනු අංකය | පුහුණු වැඩ සටහන්/ වැඩමුළු/සම්මන්ත්‍රණ | විදේශ ශිෂ්‍යත්ව හා පුහුණු | ණය වැඩ සටහන | විභාග හා පාඨමාලා | එකතුව |
|---|---|---|---|---|---|
| **1** | **211** | **4** | **80** | **41** | **336** |

## ප්‍රවාහන අංශය

### සම්පාදනය කළ ඉලක්ක :

1. තාක්ෂණ නිලධාරීන් සහ අනෙකුත් සේවක පිරිස් 113 දෙනෙකු වෙත යතුරුපැදි ලබාදීම
2. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා නව ඩබල් කැබ්රථ 10 ක් සහ බස් රථ 02 ක් මිලදී ගැනීම.
3. රියදුරු / රියසහායක මහත්වරුන් වෙත නිළ ඇඳුම් ලබාදීම.
4. අධිකාරියේ ධාවනයෙන් ඉවත් කර ඇති වාහන අපහරණය කිරීම.
5. ප්‍රවාහන සංචිතයට අනුයුක්ත ගරාජයට අවශ්‍ය මෙවලම් ලබාගැනීම.
6. ප්‍රවාහන සංචිතයට අවශ්‍ය ශ්‍රම බලය ලබාගැනීම.

| | | |
|---|---|---|
| 1. | රියදුරු මහත්වරුන් | 10 |
| 11. | මෝටර් කාර්මික ශිල්පීන් | 02 |
| 111. | සහායක ශිල්පීන් | 02 |

7. ආයතනික ගරාජයේ කළහැකි සියළු අළුත්වැඩියාවන් සිදුකිරීම මත ප්‍රවාහන අංශය විෂයෙහි ආයතනික මුල්‍ය වැයවීම අවම කිරීම.
8. ආයතනික වාහන 09 ක් සම්පූර්ණ අළුත්වැඩියා කටයුතු කර ධාවනයට එක් කිරීමට කටයුතු සූදානම් කිරීම.

### ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල

1. තාක්ෂණ නිලධාරීන් සහ අනෙකුත් සේවක පිරිස් වෙත යතුරු පැදි ලබාදීම සඳහා 2012 වර්ෂයේ ගත් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සාර්ථක ලෙස සේවක පිරිස් 113 ක් වෙත තමන්ගේ අවශ්‍යතාවය මත පදනම වූ පිරිමි සහ කාන්තා යතුරුපැදි ලබාදීමට කටයුතු කරන ලදී.

එමඟින්,

I. සේවක පිරිස්වලට කල් බදු ක්‍රමවලදී විය හැකි අපහසුතාවලින් තොරව යතුරුපැදියක් ලබාගැනීමට හැකිවීම.

II. ආයතනික සමූහ රක්ෂණයට මෙම යතුරු පැදි ඇතුලත් කිරීම මත රක්ෂණ ගාස්තු සහ ආදායම් බලපත්‍ර ගාස්තු රු.10,000/- ට සීමාවීම මෙන්ම, රු.4,550/- ට වඩා අඩු වාරිකයක් මත වාරික 48 කින් අයකිරීමේ සහන පදනම මත මෙම යතුරු පැදි ලබාදීමට හැකිවීම.

III. යතුරු පැදි මිලදී ගැනීම සඳහා රු.21,011,754/- වැය කරන ලද අතර වාහන ලබාගත් පුද්ගලයන්ගෙන්, රු. 23,399,580.96 ක මුදලක් වසර 04 ක් තුලදී අයවේ. එමඟින් ආයතනයට රු.2,387,826.96 ක පොලී ආදායමක් හිමිවේ.

2. ආයතනික රාජකාරි සඳහා අවශ්‍ය බස් රථයක් මිලදී ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කර ඇත.

3. ඉන්ධන පරිභෝජනය ඵලදායීව ක්‍රියාකිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාල අතිරේකව ඉන්ධන ලබාගැනීමේ දී මාසික ඉදිරි වැඩ සටහන් සකස් කර, ධාවන දුර ප්‍රමාණය අනුව අතිරේක ඉන්ධන ලබාගැනීම සඳහා අවශ්‍ය දැනුම් දීම් සිදු කිරීම සහ ප්‍රධාන කාර්යාලීය ප්‍රවාහන සංචිතයට අනුයුක්ත වාහනවලට සෑම ඉන්ධන සපයන අවස්ථාවකදීම ධාවන සටහන් අනුව ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීමට කටයුතු කර ඇත.

4. රියදුරු, රියසහායක මහත්වරුන්ට නිල ඇඳුම් ලබාදිම

රියදුරු, රියසහායක මහත්වරුන් සමඟ සාකච්ඡා කර, ඔවුන්ගේ නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි වර්ග පිළිබඳවද තීරණයකට ඒමට ක්‍රියාකර ඇත. 2014 වර්ෂයේ දෙවන කාර්තුවේදී රියදුරු,

රියසහායක මහත්වරුන්ට නිල ඇඳුම් කට්ටල තුනක් ලබාදීම සඳහා කටයුතු සුදානම් කරමින් පවතී.

5. ධාවනයෙන් ඉවත්කරන ලද වාහන අපහරණය සඳහා සියළුම අනුමැතියන් ලබාගෙන ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරන ලදී. එහිදී අපහරණය සඳහා යෝජිත වාහන 13 කින් වාහන 05 ක් අපහරණය කරන ලද අතර, එමගින් රු.14,45,963.35 ක ආදායමක් උපයා ගනනා ලදී.

   එමෙන්ම ශේෂ වූ වාහන 08 නැවතද අපහරණය සඳහා අවශ්‍ය අනුමැතියක් ලබාගෙන තක්සේරු කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමුකර ඇත. එම අපහරණ කටයුතු 2014 මුල් කාර්තුව තුලදීම අවසන් කිරීමට කටයුතු සූදානම් කර ඇත.

6. ප්‍රවාහන අංශයට අනුයුක්ත ගරාජය සඳහා අත්‍යාවශ්‍යම මෙවලම් කිහිපයක් මිලදී ගත් අතර, එමගින් ගරාජයේ කාර්යක්ෂමතාවය වැඩිකිරීමට සහ ගරාජයේ සේවක පිරිසට දිරි දීමනා ගෙවීම මගින් වඩාත් කාර්යක්ෂම ඵලදායි සේවාවක් ලබාදීමට ක්‍රියාකර ඇත.

7. ප්‍රවාහන අංශයට අවශ්‍ය ශ්‍රම බලය ලබාගැනීම සඳහා ක්‍රියාකරන ලදී.

   එමගින්, නව රියදුරු මහත්වරුන් 10 ක් සේවයට බඳවා ගන්නා ලද අතර, පෞද්ගලික හේතූන් මත 05 දෙනකු ඉවත්ව ගොස්, මේවනවිට 25 දෙනෙකු සේවයේ යොදවා ඇත.

## නීති කොට්ඨාශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමේ දී අනෙකුත් අංශවලින් මෙන්ම නීති අංශයෙන් ද ඊට අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කරනු ලබයි.

- ඉඩම් හා නිවාස සඳහා සින්නක්කර ඔප්පු ලබාදිම.
- මහල් නිවාසවල ඔප්පු ලබාදිම සඳහා අවශ්‍ය වන සහාධිපත්‍ය ප්‍රකාශන සකස් කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාල දේපළ සම්බන්ධයෙන් පොදුවේ සමාජයට අගතියක් වන පැමිණිලිවලට අදාලව කටයුතු කිරීම.
- අවශ්‍ය අවස්ථාවලදී යම් යම් පුද්ගලයන්ට හා ආයතනවලට එරෙහි නීති කටයුතු කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් හා නිවාස අනවසරයෙන් භුක්ති විඳින අයට එරෙහිව නඩු පවරා නිරවුල් සන්තකය ලබාගැනීම.
- බාහිර පාර්ශවයන් හා මෙම අධිකාරිය අතර කටයුතුවලදී කොන්ත්‍රාත් ගිවිසුම් සකස් කිරීම හා අනෙකුත් ගිවිසුම් සකස් කිරීම.
- සියළුම දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ ආවරණය වන පරිදි අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.
- ණය හා කුලීවාරික නොගෙවන හිඟ ණය කුලී වාරික හිමියන්ට නීති මගින් කටයුතු කර අධිකාරියට අයවිය යුතු මුදල් ලබාගැනීම.
- නොතාරිස් ගාස්තු නීති නිවේදන හා නෙරපීමේ නියෝග ක්‍රියාත්මකවීම තුළින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අයකිරීම් සඳහා දායකත්වය ලබාදීම.

## ඔප්පු නිකුත් කිරීම

සම්පූර්ණ මුදල් ගෙවූ නිවාස ක්‍රමවල නිවාසලාභින් වෙත සින්නක්කර ඔප්පු පිරිනැමීමේ කාර්යය ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබන කාර්යයකි. මෙහි දී සහාධිපත්‍ය දේපල, සහාධිපත්‍ය නොවන දේපල හා ඉඩම් සඳහා ද සින්නක්කර ඔප්පු ලබා දේ.

2013 වර්ෂය සඳහා ඔප්පු නිකුත් කිරීමේ වාර්ෂික ඉලක්කය 3000 ක් වුවද ඔප්පු නිකුත් කිරීම සඳහා නීති අංශය වෙත ලැබුණ ලිපිගොනු සංඛ්‍යාව 2581 ක් පමණක් වන බැවින් එම ප්‍රමාණය එම වර්ෂය තුල නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

## ප්‍රධාන කාර්යාලය මඟින් මෙහෙයවනු ලබන නඩු

1. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනපනත්වලට අනුව හිඟ කුලී හිමියන්ට, අනවසර ඉදිකිරීම්කරුවන්ට සහ අනවසර පදිංචිකරුවන්ට එරෙහිව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවරනු ලබන නඩු හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට විරුද්ධව වෙනත් පාර්ශවයන් විසින් පවරනු ලබන නඩු කටයුතු මෙහෙයවීම.
2. නීති උපදෙස් ලබාදීම.
3. මානව හිමිකම් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
4. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු දේපල අයුතු අයුරින් පරිහරණය කරන්නන්ට එරෙහිව නීතිමය කටයුතුවලදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින් නීති අංශය සහාය ලබා දෙයි.

එහිදී 2013 වර්ෂය තුල ප්‍රධාන කාර්යාලය මඟින් මෙහෙය වන ලද නඩු පහත දැක්වේ.

| උසාවිය | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 11 |
| අභියාචනාධිකරණය | 27 |
| මහාධිකරණය | 13 |
| දිසා අධිකරණය | 43 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 35 |
| කම්කරු විනිශ්චය | 05 |

## සැළසුම් හා ප්‍රගති කොට්ඨාශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ 2013 වර්ෂය සඳහා නිවාස ඒකක 40160 ක් සංවර්ධනය කිරීම පැරණි නිවාස ක්‍රම අළුත්වැඩියා කිරීමත් මූලික කොටගෙන සැලසුම් සකස් කරන ලදී. ඒ අනුව වර්ෂයේ කාර්ය සාධනය පහත දැක්වේ.

| වැඩ සටහන | ඉලක්කය | | ප්‍රගතිය | | කාර්ය සාධනය | |
|---|---|---|---|---|---|---|
| | භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය රු.මි. |
| නිවාස සංවර්ධනය | 40169 | 9646.0 | 19161 | 3860.326 | 48% | 40% |
| ඉඩම් කට්ටි ලබාදීම | 500 | - | 277 | - | 55% | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඔප්පු ලබාදීම | 3000 | - | 2581 | - | 86% | - |
| නගමුපුරවර වැඩ සටහන | 7146 | 1000.0 | 5833 | 610.913 | 82% | 61% |
| ඉඩම් වන්දි ලබාදීම | - | 50.0 | - | 49.778 | - | 100% |
| අවිච්ඡේද වැඩ සටහන<br>1. නිවාස සංවර්ධනය | 21051 | 2406.03 | 16331 | 1852.886 | 78% | 77% |

2013 වසරේ නිවාස සංවර්ධන වැඩ සටහන සැලසුම් අනුව සතුටුදායක ප්‍රගතියක් අත්කර ගෙන නැත. ඊට බලපෑ හේතු වශයෙන් අරමුදල් ප්‍රමාණවත් නොවීම, ව්‍යාපෘති පිළිබඳව බලපාන ලද ඉඩම් සම්බන්ධ ගැටළු හා බැංකු අරමුදල් ලබාගැනීම ප්‍රමාදවීම ප්‍රධාන වේ.

ඉඩම් කට්ටි ලබාදීම බලාපොරොත්තු වූ ඉලක්කයෙන් 55% ක් විය. ඉඩම් කැබලි ලබාදීමෙන් අයකර ගන්නා මුදල් සංවර්ධන වැඩ සටහනකට යෙදවීමට සැලසුම් කර තිබූ නමුත්, එහි ප්‍රගතිය ප්‍රමාණවත් නොවීම අරමුදල් යෙදවීම කෙරේ දැඩි ලෙස බලපාන ලදී. කෙසේ වෙතත් වර්ෂය තුල නිවාස 19161 ක් සංවර්ධන කිරීම සඳහා දායකවීමටත් පෙර වර්ෂවල ආරම්භ කළ නිවාස ඒකක 16331 ක වැඩ නිමකිරීමටත් හැකිවිය.

## 2013 වර්ෂය තුල අත්කරගත් ජයග්‍රහණ

1. රු.මි.4250 ක මුදලක් රාජ්‍ය බැංකු 5 කින් නිවාස වැඩ සටහන සඳහා ලබාගැනීම.
2. නගමු පුරවර වැඩ සටහන යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද සොයිසාපුර නිවාස යෝජනා ක්‍රමයේ 1 අදියර ජනතා අයිතියට පත් කිරීමට හැකිවීම.
3. සෙවණ ලොතරැයි අලෙවි කටයුතු සඳහා ඍජු මැදිහත්වීමක් මඟින් රු.මි.142.7 ක මුදලක් සෙවණ අරමුදලට ලබාගැනීමට හැකිවීම.

## අයකිරීම් අංශය

## 2013 වසරේ ක්‍රියාකාරීත්වය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දී ඇති ණය හා කුළී ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශය තුලින් සිදු කෙරේ. එහිදී වාර්ෂික ඉලක්ක ලබාදීම, ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම, ඊට අදාල ප්‍රතිපත්ති තීරණ හා චක්‍රලේඛ නිකුත් කිරීම පුහුණු කටයුතු හා සතිපතා /මාසිකව ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ඒවායේ දුර්වලතා හඳුනා ගෙන අදාල පිළියම් යෙදීම හා අවශ්‍ය සහාය ලබාදීම සිදු කෙරේ.

### 1 ඉලක්ක සපුරා ගැනීම.

රු.මි

| | වාර්ෂික අයකිරීම් ඉලක්කය | සපුරා ගැනීම | ප්‍රතිශතය |
|---|---|---|---|
| නිවාස ණය වාරික | 2974.181 | 2199.306 | 74 |
| නිවාස කුළී (ග්‍රාමීය හා නාගරික) | 217.336 | 186.444 | 86 |
| එකතුව | 3191.517 | 2385.750 | 75 |

1.2 අයකිරීම් නියෝජිත හා දිස්ත්‍රික් කාර්යමණ්ඩල පුහුණු වැඩසටහන් දකුණු පළාත, උතුරු මැද පළාත, ඌව පළාත, මධ්‍යම පළාත, උතුර පළාත, වයඹ පළාත/ කෑගල්ල දිස්ත්‍රික්කය සමග හා නැගෙනහිර පළාත - දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී.

1.3 ආදායම් ප්‍රවර්ධන වැඩසටහන තුල දක්වන දායකත්වය ඇගයීම සඳහා සේවක ප්‍රණාම උළෙලේදී හොඳම අයකිරීම් නියෝජිතයින් තිදෙනා හා හොඳම දිස්ත්‍රික් කාර්යාල සඳහා කුසලාන ලබා දීම මගින් ඇගයීමක් කර ඇත.

1.4 අයකිරීම් නියෝජිත ප්‍රගතිය මාසිකව භෞතික හා මූල්‍ය වශයෙන් ප්‍රගති සමාලෝචනය කිරීම.

1.5 අයකිරීම් නියෝජිතයින් මාර්ගස්ථ හා විශ්වාස ඇප යන දෙආකාරයෙන් රක්ෂණය කිරීම් කටයුතු සිදු කිරීම.

1.6 ආදායම් මෙහෙයුම් කමිටු සෑම දිස්ත්‍රික්කයක් තුලම මාසිකව පැවැත්වීම හා ඒ තුලින් මෙම වැඩසටහන පිළිබඳ පසු විපරම් කිරීම.

1.7 නිවාස ණය ලබා ගත් රජයේ සේවකයින් සිටින ප්‍රධාන රාජ්‍ය ආයතන සම්බන්ධිකරණය කර අදාල වාරික වැටුපෙන් අයකර ගෙන්වා ගැනීම හා දිස්ත්‍රික් කාර්යාල වෙත අදාල මුදල් ප්‍රේෂණය කරවීම.

## නාගරික නිවාස සාප්පු / වාරික සහ කුලී අයකිරීම්

**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය**
**ආදයම් ප්‍රවර්ධන වැඩසටහන (නිවාස ණය හා කුළී)**

2013 රු.මි

| අනු අංකය | දිස්ත්‍රික්කය | වාර්ෂික ඉලක්කය | ළඟාවීම | % |
|---|---|---|---|---|
| 1 | කොළඹ නගර (උතුර) | 29.350 | 32.756 | 112 |
| 2 | කොළඹ නගර (දකුණ) | 30.066 | 31.213 | 104 |
| 3 | කොළඹ දිස්ත්‍රික් | 80.715 | 75.362 | 93 |
| 4 | ගම්පහ | 78.850 | 73.553 | 93 |
| 5 | කලුතර | 151.001 | 135.113 | 89 |
| 6 | මහනුවර | 62.171 | 55.299 | 89 |
| 7 | මාතලේ | 66.147 | 58.395 | 88 |
| 8 | නුවරඑළිය | 132.661 | 115.412 | 87 |
| 9 | ගාල්ල | 135.654 | 112.646 | 83 |
| 10 | මාතර | 111.186 | 92.086 | 83 |
| 11 | හම්බන්තොට | 77.133 | 62.131 | 81 |
| 12 | කුරුණෑගල | 48.536 | 39.044 | 80 |
| 13 | පුත්තලම | 54.004 | 43.244 | 80 |
| 14 | අනුරාධපුරය | 33.596 | 26.234 | 78 |
| 15 | පොළොන්නරුව | 83.901 | 65.145 | 78 |
| 16 | බදුල්ල | 111.531 | 82.882 | 74 |
| 17 | මොණරාගල | 159.648 | 116.434 | 73 |
| 18 | රත්නපුර | 132.930 | 95.135 | 72 |
| 19 | කෑගල්ල | 181.362 | 129.110 | 71 |
| 20 | මඩකලපුව | 77.999 | 53.753 | 69 |
| 21 | අම්පාර | 129.309 | 88.800 | 69 |
| 22 | ත්‍රිකුණාමලය | 335.248 | 229.822 | 69 |
| 23 | යාපනය | 232.050 | 158.984 | 69 |
| 24 | මන්නාරම | 115.444 | 74.813 | 65 |
| 25 | වව්නියාව | 244.262 | 155.534 | 64 |
| 26 | මුලතිව් | 165.456 | 104.136 | 63 |
| 27 | කිලිනොච්චි | 131.306 | 78.714 | 60 |
| | මුළු එකතුව | **3191.516** | **2385.750** | **75** |


ණය අයකිරීම - 2013
2500
2000
1500
1000
500
0
348.908
396.855
536.970
581.749
607.957
651.077
728.177
870.563
898.775
811.464
1159.882
1731.243
2199.306
2001
2002
2003
2004
2005
2006
2007
2008
2009
2010
2011
2012
2013
වර්ෂය
රු.මි

## නාගරික නිවාස සාප්පු / වාරික සහ කුලී අයකිරීම්

**ක්‍රියාකාරිත්වය - 2013**

රු.මි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රමාණය අයවැය | අයකිරීම් | % | 2013.12.31 දිනට හිඟ |
|---|---|---|---|---|---|
| 1. | ප්‍රධාන කාර්යාලය | 21.079 | 15.780 | 74.86 | 4.625 |
| 2. | කොළඹ නගර (උතුර) මාලිගාවත්ත | 43.553 | 21.962 | 50.43 | 38.602 |
| 3. | කොළඹ නගර (දකුණ) මැනින් ටවුන් | 41.064 | 29.796 | 72.56 | 38.611 |
| 4. | කොළඹ දිස්ත්‍රික්කය | 36.875 | 17.259 | 46.80 | 27.672 |
| 5. | ගම්පහ | 42.195 | 20.752 | 49.18 | 29.171 |
| 6. | මහනුවර | 6.522 | 10.421 | 159.78 | 9.941 |
| 7. | මාතර | 9.519 | 3.153 | 33.12 | 13.182 |
| 8. | කල්මුණේ / අම්පාර වාණිජ ගොඩනැගිලි | 2.112 | 1.366 | 64.68 | 1.331 |
| | **එකතුව** | **202.919** | **120.489** | | **163.135** |

## තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස වැඩ සටහන් සඳහා සහභාගිවන නිවාස හිමියන්ගේ සංනිවේදන අවශ්‍යතා සපුරාලීම සඳහා තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාසය 2013 වසරේදී විවිධ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාසය පහත සඳහන් ඒකකයන් සමඟින් ක්‍රියාත්මක කෙරේ.

- තොරතුරු හා ප්‍රචාරක ඒකකය
- සෙවණ මාධ්‍ය සේවය
- මුද්‍රණ ඒකකය
- පුස්තකාලය

## තොරතුරු හා ප්‍රචාරක ඒකකය

2013 වසරේදී තොරතුරු හා ප්‍රචාරක ඒකකය පහත සඳහන් වැඩකටයුතු ක්‍රියාත්මක කරන ලදී.

- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජනසෙවණ නිවාස හා ජනාවාස සංවර්ධන මෙහෙයුමට අදාළ මාධ්‍ය ආවරණ කටයුතු හා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය තුලින් මහජනතාව දැනුවත් කිරීම.
- ජනසෙවණ ජාතික නිවාස හා ජනාවාස සංවර්ධන මෙහෙයුමට අදළ ව අධිකාරිය විසින් දිස්ත්‍රික්ක 25 තුලම නිවාස ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදි. එමෙන්ම නගමු පුරවර වැඩසටහන යටතේ පැරනි මහල් නිවාස ක්‍රම අලුත්වැඩියා කිරීම් ද ආරම්භ කර ඇති අතර එයින් කිහිපයක් විවෘත කල අතර, එම සියළු උත්සව වෙනුවෙන් අවශ්‍ය පහත සඳහන් සේවා සහ පහසුකම් ලබා දීම.

I. ප්‍රචාරක හා උත්සව සැලසුම්
II. සියළු පෙර මුද්‍රණ චිත්‍ර සටහන් (Art Works)
III. නාම පුවරු, ප්‍රචාරක පුවරු, වේදිකා පසුතල තොරණ, බැනර්, ධජ, පතාක කොඩි කණු
IV. වේදිකා, මහජන ආවරණ, පුටු, ශබ්ද විකාශන යන්ත්‍ර, මල්ටි මීඩියා ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ තිර
V. පුවත්පත් දැන්වීම් සහ පෝස්ටර්
VI. ආරාධනා පත්‍ර, හිමිකම් ප්‍රදන පත්‍ර, හිමිකම් සහතික, ඔප්පු කවර
VII. සමරු තිළිණ සහ සමරු ඵලක

- 2013 ලෝක ජනාවාස දින උත්සවය මොරටුව සොයිසාපුර මහල් නිවාස සංකීර්ණයේදී 2013.10.07 දින පැවැත්වීම. ඒ යටතේ පහත සඳහන් කටයුතු ඉටුකරන ලදි.

I. පාසල් සිසුන් සඳහා දීප ව්‍යාප්ත චිත්‍ර. රචනා සහ පොස්ටර් තරගාවලිය සංවිධානය කිරීම.
II. චිත්‍ර,රචනා,පෝස්ටර් තරගාවලියේ ජයග්‍රාහකයන් සඳහා සම්මාන සහ සහතික පත් නිර්මාණය කිරීම.
III. ලෝක ජනාවාස දින ප්‍රධාන උත්සවය සංවිධානය කිරීම.
IV. ප්‍රධාන උත්සවයේ වේදිකාව, වේදිකා පසුතලය, ප්‍රවේශ තොරණ නිර්මාණය සහ අලංකරණ කටයුතු

- 2013 දැයට කිරුළ ඇතුළු ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා සහභාගිවීම හා ඒ සඳහා අවශ්‍ය ප්‍රචාරක වැඩ කොටස් ඉටු කිරීම.

## සෙවණ මාධ්‍ය ඒකකය

- 2013 වසරේදී සෙවණ මාධ්‍ය සේවය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඇතුළු ආයතනවල විවිධ පුවත්පත් දැන්වීම් පළකිරීම සිදු කරන ලදී.
- 2013 වසරේදී සෙවණ මාධ්‍ය සේවයෙහි වාර්ෂික ඇස්තමේන්තුගත ලාභය රු. මිලියන 3.00 කි. 2013 දෙසැම්බර් දක්වා ලැබූ ආදායම රු. මිලියන 11.91 ක් වන අතර ලාභය රු. මිලියන 1.59 කි.
- සෙවණ මාධ්‍ය සේවයේ සියළු ඉපැයීම් සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය. නමින් වු වෙනම ගිණුමකට බැරකරනු ලබන අතර, මෙම අරමුදල් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා යොදාගනු ලැබේ.

## සෙවණ මාධ්‍ය සේවය

### පුවත්පත් දැන්වීම්

2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආදායම් සහ ලාභ

| මාසය | ආදායම රු. | ලාභය රු. |
|---|---:|---:|
| ජනවාරි | 576,208.80 | 78,030.00 |
| පෙබරවාරි | 1,323,683.68 | 177,533.25 |
| මාර්තු | 901,920.20 | 121,215.00 |
| අප්‍රේල් | 1,685,490.37 | 226,835.82 |
| මැයි | 621,576.80 | 84,135.00 |
| ජූනි | 1,013,452.00 | 136,882.50 |
| ජූලි | 1,141,637.30 | 152,001.00 |
| අගෝස්තු | 566,824.02 | 76,020.00 |
| සැප්තැම්බර් | 2,240,994.62 | 292,487.63 |
| ඔක්තෝබර් | 781,086.80 | 104,948.30 |
| නොවැම්බර් | 794,580.64 | 107,223.00 |
| දෙසැම්බර් | 262,086.20 | 35,265.00 |
| **එකතුව** | **11,909,541.43** | **1,592,576.50** |

2013 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ලාභය - රු. මි. 3.00




2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආදායම් සහ ලාභ

## මුද්‍රණ ඒකකය

- ජපන් රජයෙන් ලැබුණු ප්‍රදානයක් වන මෙම මුද්‍රණ ඒකකය බලපිටිය, පියගම ආදර්ශ ගම්මානයෙහි 1987 වර්ෂයේ ස්ථාපිත කරනු ලැබූහ. 1994 වසරේදී එය මාළිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයට රැගෙන එන ලදී.
- 2002 වසරේ ජුනි මාසයේදී මෙම මුද්‍රණ ඒකකය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වෙත මාරුකරනු ලැබූ අතර, තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාසය යටතේ ස්ථාපිත කරනු ලැබූහ.
- දැනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සියලුම මුද්‍රණ කටයුතු මෙමගින් සිදු කරනු ලබයි එහෙත් සියලු මුද්‍රණ අවශ්‍යතාවන් ඉටුකිරීමට මෙම මුද්‍රණ ඒකකයේ ධාරිතාව ප්‍රමාණවත් නොවේ.

## පුස්තකාලය

1989 වර්ෂයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පුස්තකාලය ආරම්භ වූ අතර, මෙමගින් විවිධ ක්ෂේත්‍ර වලට අදාල තොරතුරු රැසක් බෙදා හරිනු ලබයි. වර්තමානය වන විට මෙම පුස්තකාලයේ 8000 කට අධික ප්‍රමාණයක ග්‍රන්ථ එකතුවක් ඇත. මෙහිදී ප්‍රධාන වශයෙන් අරමුණු කොට ගෙන ඇත්තේ නිවාස හා ඒ ආශ්‍රිත විෂය කරුණු රැස්කර ගැනීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිළධාරීන්හට සහාය වීම යන්න පදනම් කොට ගෙනය. මෙහි පාඨකයන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිළධාරීන් සහ උපාධි අපේක්ෂකයන් වන අතර, විශේෂ අවසර ඇතිව පාසැල් ළමුන්හටද මෙම පුස්තකාලය භාවිතා කිරීමේ හැකියාවක් ඇත.

පුස්තකාල ග්‍රන්ථ එකතුවේ නිවාසිකරණය පිළිබඳ ග්‍රන්ථ සමුදායක් පවතින අතර, ඒ ආශ්‍රිත වූ අත්පොත් ප්‍රමාණයක්ද ඇත. විෂයට අනුබද්ධව හා සාමාන්‍ය දැනුම වර්ධනය කර ගැනීමෙහිලා වාර ප්‍රකාශන (විෂයට අනුබද්ධව හා සාමාන්‍ය කියවීමට), රජයේ ප්‍රකාශන (පනත් හා සැසි වාර්තා, පාර්ලිමේන්තු විවාද, ගැසට්), ශ්‍රී ලංකාවේ හා බ්‍රිතාන්‍ය ප්‍රමිති එකතුවක්ද වේ

මෙම පුස්තකාලය නිවාස ආශ්‍රිත ගෘහ නිර්මාණ ශිල්පය, ඉංජිනේරු විද්‍යාව, කළමණාකරණය, ප්‍රමාණ සමීක්ෂණ, දුප්පත්කම තුරන් කිරීම, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව ආදී ක්ෂේත්‍ර වලට අයත් උසස් ගණයේ ග්‍රන්ථ වලින් යුක්තවන අතර, සාමාන්‍ය කියවීම හා බුදු දහම පිළිබඳ ග්‍රන්ථ එකතුවක් ද ඇත. තවද, තෝරාගත් විෂයන් කිහිපයක පුවත්පත් කැපුම් එකතුවක් ඇති අතර, මෙම පුස්තකාලය මගින් දැනුම සොයා යන්නන්ට මහඟු අවස්ථාවක් ලබා දේ.

## තොරතුරුතාක්ෂණ

රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වයන් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ කර මහජනතාවට නිවැරදි හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ ඊ-රාජ්‍ය සංකල්පයට අනුව යමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ද එහි බොහෝ කටයුතු තොරතුරු හා සංනිවේදන තාක්ෂණය හා සම්බන්ධ කරමින් පවතියි. මෙම කාර්යය සඳහා පූර්ණ තාක්ෂණික හා න්‍යායාත්මක දැනුම ලබාදෙනු ලබන්නේ අප අධිකාරියේ තොරතුරු තාක්ෂණ අංශයයි.

දැනටමත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය හා සෑම දිස්ත්‍රික් කාර්යාලයකටම පරිගණක හා උපාංග ලබාදී අන්තර්ජාල සේවාව සහ විද්‍යුත් තැපැල වැනි සංනිවේදන ක්‍රම හඳුන්වා දීම තුලින් එම කාර්යාලවල කටයුතු වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට පහසුකම් සලසා ඇත. කළමණාකාරිත්වයට අවශ්‍ය තොරතුරු සහ දත්ත එසැනින් ලබාගැනීමටත් ඔවුන් වෙත ඉහළ කළමණාකාරිත්වය විසින් ගන්නා තීරණ හා උපදෙස් දන්වා යැවීමට දිස්ත්‍රික් කාර්යාල 26 හා ප්‍රධාන කාර්යාලය අතර මනා සම්බන්ධතාවයක් තොරතුරු තාක්ෂණය මඟින් ගොඩනගා ඇත.

එයට අතිරේකව තාක්ෂණ අංශය විසින් පහත දක්වා ඇති සේවාවන් පවත්වාගෙන යනු ලබයි.

### 01. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙබ් පිටුව සංවර්ධනය කර යාවත්කාලීන කිරීම.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය යනු එහි දැක්ම හා ක්‍රියාකාරකම් පිළිබඳ සේවකයින්ට, ශ්‍රීලාංකික ජනතාවට මෙන්ම නිවාස සංවර්ධනය ගැන උනන්දුවක් දක්වන ලෝවැසි ජනාතාවට ද මනා අවබෝධයක් ලබාදෙන පරිඝණක අංශය මඟින් ක්‍රියාත්මක වන ප්‍රබල මාධ්‍යයකි.

පසුගිය වසර තුල පරිඝණක අංශය මඟින් ක්‍රියාත්මක වන වෙබ් අඩවිය මඟින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල සහ උප කාර්යාල පිළිබඳ තොරතුරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක නිවාස වැඩ සටහන් හා සේවාවන් පිළිබඳ තොරතුරු, නිවාස ණය වැඩ සටහන් පිළිබඳ තොරතුරු, නිවාස ආධාර ලැබිය යුතු පුරවැසියන් පිළිබඳ තොරතුරු, ඉදිකෙරෙමින් පවතින නිවාස යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු සහ විකිණීමට සූදානම් කර ඇති නිවාස පිළිබඳ තොරතුරු සහ නිවාස අධිකාරියෙහි පුවත් ඇතුලත් ඉතා වැදගත් තොරතුරු සිංහල හා ඉංග්‍රීසි භාෂා මාධ්‍ය මගින් ක්‍රමවත් ලෙස නිතිපතා යාවත්කාලීන කර සැපයීමට අවශ්‍ය කටයුතු පරිඝණක අංශය මඟින් සිදුකරමින් පවතින බව සඳහන් කල හැක.

ඉදිරි වසර තුල මෙම වෙබ් අඩවිය මඟින් ලබාදෙන මහජන සේවාවන් පුළුල් කිරීමත්. එමෙන්ම දෙමළ භාෂා මාධ්‍යයෙන් එම තොරතුරු එළිදැක්වීමටත් බලාපොරොත්තුවෙන් සිටී.

### 02. පරිඝණක හා දෘඩාංග නඩත්තු කිරීම

අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලයන්හි පරිඝණක ජාලගතකිරීම් 80%ක් පමණ සම්පූර්ණ කර ඇත. නිවාස අධිකාරිය සතුව පරිඝණක 300 ක් පමණත්, මුද්‍රණ යන්ත්‍ර 115 ක් හා UPS 175 ක් පමණ දැනට භාවිතයේ ඇත. වගකීම් කාලය ඉක්මවූ පරිඝණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, UPS සහ අනෙකුත් උපාංග හා ජාලගත දෝෂ නිවැරදි කිරීම තොරතුරු තාක්ෂණ අංශය මඟින් සිදු කරනු ලබන අතර, වගකීම් කාලය නොඉක්මවූ පරිගණක හා උපකරණ නඩත්තු කිරීම සඳහා අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කරනු ලබයි.

මීට අමතරව පරිඝණකවල මෙහෙයුම් පද්ධතියේ සහ අනෙකුත් මෘදුකාංග නඩත්තුව හා වෛරස් මඟින් පරිඝණක හා දත්ත ආරක්ෂා කරගැනීම සඳහා පහසුකම් මෙම අංශය මඟින් ලබාදෙන අතර, මෙම සේවාවන් බාහිර ආයතන මගින් ලබාගන්නේ නම් ඒ සඳහා දැරීමට සිදුවන විශාල පිරිවැය අවම කර ගැනීමට තොරතුරු තාන්ෂණ අංශය මඟින් ලබාදෙන සේවාවන් නිසා හැකිවී ඇත.

## 03.නව පරිඝණක වැඩ සටහන් නිර්මාණය හා නඩත්තු කිරීම්

ප්‍රධාන කාර්යාලයේ ආපදා ණය වැඩ සටහන, අතිකාල ගෙවීමේ වැඩ සටහන, සභාපති කාර්යාලයට අදාල මහජන ඉල්ලීම් තොරතුරු පරිගණකගත කිරීමේ වැඩ සටහන, පොලී රහිතව සේවකයන් වෙත නිකුත් කරන කෙටි ණය, අධිකාරිය සතු නිශ්චල දේපළ කළමනාකරණය නිසි අයුරින් පවත්වාගෙනයාම සඳහා ක්‍රියාවට නංවන ලද ඉඩම් මෙහෙයුම් වැඩ සටහන උදෙසා පරසණක වැඩ සටහනක් නිර්මාණය කර එමගින් සමස්ථ අධිකාරියට අයත් නිවාස හා ඉඩම්වල දත්ත ඇතුලත් කර නිවැරදි තොරතුරු ලබාගත හැකිවන පරිදි පරිසණක වැඩ සටහන් නිර්මාණය කර ඇත.

අලෙවි අංශයට අයත් පෙර විකුණුම් නිවාස ක්‍රමයන් පිලිබඳ විස්තර ලබාගත හැකි පරිදි සියළු දත්ත ඇතුලත් කලහැකි ආකාරයට සම්පාදනය කරන ලද පරිසණක වැඩ සටහන මඟින් ඉල්ලුම්කරුවන්ගේ සියළු විස්තර පරිඝණකගත කර අවශ්‍ය තෝරාගැනීම් කඩිනමින් සිදුකිරීමට පහසුකම් සලස්වා ඇත.

සෙවන මාධ්‍ය අංශය මඟින් සිදුකරන දැන්වීම් පලකිරීමට අදාලව පරිසණක වැඩසටහන නිර්මාණය කිරීම සහ එහි මුදල් ලැබීම් ගිණුම් අංශය ද ඒකාබද්ධ කර පවත්වාගෙන යාමට හැකිවන පරිදි මෙම වැඩ සටහන නිර්මාණය කර ඇත.

දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීමට අවශ්‍ය සියළු දත්ත දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගෙන අවශ්‍යතාවය අනුව ඒ ඒ දත්ත උපයෝගී කරගනිමින් ප්‍රගති වාර්තා සකස් කිරීම හා ඒ සඳහා විවිධ අංශවල සිටින තොරතුරු තාක්ෂණ සේවයෙහි නියුතු නිලධාරීන් මෙහෙයවීම හා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු තොරතුරු තාක්ෂණ අංශය මඟින් සිදු කරනු ලබයි.

## 04.නිවාස ණය පරිඝණක වැඩ සටහන

උතුරු නැගෙනහිර ද ඇතුලත්ව සියළු දිස්ත්‍රික් කාර්යාල මගින් 1984 සිට ලබාදී ඇති නිවාස ණය හා රජයේ නිලධාරීන්ට ලබාදෙන උපහාර ණය පිළිබඳ තොරතුරු පරිසණකගත කිරීම හා තොරතුරු යාවත්කාලීන කිරීමේ කටයුතු නිතිපතා සිදුකරනු ලබයි.

ඒ අනුව සියළු ණයකරුවන්ගේ තොරතුරු, ණය ලබාදීම් හා ණය ලැබීම් පිළිබඳ තොරතුරු පරිසණකගත කර ඇත. ඒවායෙහි දත්ත සංරක්ෂණ කටයුතු කෙරෙන්නේ පරිසණක අංශය මඟිනි.

ප්‍රධාන කාර්යාලයේ සහ අනිකුත් දිස්ත්‍රික් කාර්යාලවලට අවශ්‍ය පරිසණක හා පරිසණක උපාංග මිලදී ගැනීමේ කටයුතු සඳහා අවශ්‍ය පිළිවිතරයන් හා ප්‍රසම්පාදන කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරන බැවින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් පරිසණක හා උපාංග මිළදි ගැනීමේ කටයුතු නිසි තත්ව පාලනයකින් යුතුව සිදුකරනු ලබයි.

## 05. Call Centre මධ්‍යස්ථානය පිහිටුවීම

උපහාර ණය වැඩ සටහන යටතේ සිටින ණයලාභීන්ගෙන් ණය අයකර ගැනීම සඳහා නවීන පහසුකම් සහිත Call Centre මධ්‍යස්ථානයක් හඳුන්වාදි ඇති අතර එමගින් ණයලාභීන් සමඟ දුරකථනයෙන් සම්බන්ධවී අවශ්‍ය තොරතුරු ලබාදීමට සහ පසුවිපරම් කිරීමට අවශ්‍ය සියළු පහසුකම් මෙම Call Centre මධ්‍යස්ථානය හරහා හඳුන්වා දී තිබෙන අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබාදීමට කටයුතු කර ඇත.

ඉහත කරුණ අනුව තොරතුරු තාක්ෂණ අංශය සැමවිටම උත්සාහ ගනුයේ රජයේ ඊ-රාජ්‍ය ප්‍රතිපත්ති අනුගමනය කරමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සියළුම සේවාවන් තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් මහජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණ ඇතිවය. නුදුරු අනාගතයේදී මීටත් වඩා තොරතුරු හා සංනිවේදන තාක්ෂණය භාවිතා කරමින් ඉහල සේවාවක් ලබාදීමේ අරමුණින් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙලක් මේවනවිටත් සැකසෙමින් පවතී.

## සීමාසහිත ඕෂන්වීව් ඩිවොලප්මන්ට් පුද්ගලික සමාගම

### හැඳින්වීම

අංක 94/340/006 සහ 1994.02.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බම්බලපිටිය ටවර් ගොඩනැගිල්ල කළමනාකරණය කිරීම සඳහා ද, දේපළ සංවර්ධන කටයුතු කිරීම සඳහා ද, නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා එක්ව හවුල් ව්‍යාපාර සමාගමක් ලෙස ස්ථාපිත කර ඇත.

ඒ අනුව 1996 ජනවාරි 01 වැනි දින ඕෂන්වීව් සංවර්ධන සමාගම ආරම්භ කරනු ලැබීය.

ජනසෙවණ නිවාස දසලක්ෂයේ ජාතික ප්‍රතිපත්තියට සවිය දෙන රාජ්‍ය සමාගමක් ලෙස විශ්වාසය හා වගකීමත්, පුද්ගලික ආයතනයක් ලෙස කාර්යක්ෂමතාවයත් පෙරදැරි කරගත් මෙම සමාගම අද වන විට නිවාස වෙළඳපලෙහි පැහැදිලි වෙනසක් ඇති කරමින් නිවාස අවශ්‍යතාවය සපුරාලීමට ඉදිරිපත්ව සිටී.

### දැක්ම

- ශ්‍රී ලංකාවේ දේපළ සංවර්ධන වෙළඳපොළ තුළ රජයට අනුබද්ධ දේපළ සංවර්ධන සමාගමක් ලෙස දායකත්වය ලබාදීම.

### මෙහෙවර

- ගැනුම්කරුවන්ගේ අවශ්‍යතා මත පදනම්ව, තරඟකාරී මිල ගණන් යටතේ, අංගසම්පූර්ණ පහසුකම්වලින් සමන්විත තනි නිවාස ඒකක මෙන්ම සහාධිපත්‍ය නිවාස දේපළද, සපයා දෙමින් දේශීය දේපළ සංවර්ධන වෙළඳපොළට සහායවීම.

### අරමුණු

- දේපළ සංවර්ධනය
- දේපළ කළමනාකරණය
- ඉදිකිරීම් හා නඩත්තු කටයුතු
- දේපළ බදුදීම
- ඉඩම් හා දේපළ විකුණුම්

### ඕෂන්වීව් ඩිවොලොප්මන්ට් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| ජගත් පෙරේරා මහතා | - සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ |
| ප්‍රශාන්ත ඩයස් මහතා | - අධ්‍යක්ෂ |
| ඉත්තෑකන්දේ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ | - අධ්‍යක්ෂ |
| සිරිනිමල් පෙරේරා මහතා | - අධ්‍යක්ෂ |
| අතුල ද සිල්වා මහතා | - අධ්‍යක්ෂ |
| නිහාල් ප්‍රනාන්දුමහතා | - අධ්‍යක්ෂ |
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | - එකවුන්ට් සිස්ටම් පුද්ගලික සමාගම |

## සීමාසහිත ඕෂන්වීව් ඩිවෙලප්මන්ට් සමාගමේ කාර්ය මණ්ඩලය

**2013 වර්ෂයේ දී සමාගමේ සමස්ථ කාර්ය මණ්ඩලය පහත පරිදිවේ.**

| | |
|---|---|
| විධායක කාර්ය මණ්ඩලය | - 08 |
| විධායක නොවන කාර්ය මණ්ඩලය | - 16 |
| නඩත්තු අංශයේ කාර්ය මණ්ඩලය | - 22 |
| | 46 |

## කළමණාකාරිත්වයේ ප්‍රගති සමාලෝචනය

### ඩ්‍රීම් හවුස් නිවාස ව්‍යාපෘතිය

- මෙම ව්‍යාපෘතිය මධ්‍යම පාන්තික ශ්‍රී ලාංකිකයන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම පිණිස මූලිකවම ක්‍රියාත්මක වන අතර දේශීය මෙන්ම විදේශීය පාරිභෝගිකයන් වෙතද වගකීම් සහගත සේවාවක් සලසනු ඇත. නිවසක් සැලසුම් කිරීමේ සිට ඉදිකිරීම අවසන් වන තෙක් පූර්ණ වගකීම් දැරීමටද, බැංකු ණය ලබාගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීමටද සමාගම ඉදිරිපත්වේ. ඉදිකරනු ලබන නිවාස ඉංජිනේරු අංශයේ නිපුණතා ඇති පුද්ගලයින්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි. මේ වන විට කහතුඩුව හා මත්තේගොඩ යන නගර කේන්ද්‍ර කර ගනිමින් ව්‍යාපෘති දෙකක ඉදිකිරීම් සිදුකරමින් පවතී.

### කහතුඩුව හරිත කැදැල්ල නිවාස ව්‍යාපෘතිය

- මෙම ව්‍යාපෘතිය ඉඩම් ඒකක 38 කින් සමන්විත වන අතර මේ වන විට නිවාස 11 ක වැඩ අවසන් කර ඇති අතර, එම නිවාස අලෙවි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. මීට අමතරව තෝරාගත් ඉඩම් කැබලි 10 ද අලෙවි කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. සියළු යටිතල පහසුකම්වලින් සමන්විත මෙම ව්‍යාපෘතිය 2015 වසර නිමවීමට පෙර අවසන් කිරීමට සැලසුම් කොට ඇත.

### මත්තේගොඩ හරිත කැදැල්ල නිවාස ව්‍යාපෘතිය

ඉහල පාන්තික නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස ඇරඹී මෙම නිවාස යෝජනා ක්‍රමයේ යෝජිත දෙමහල් නිවාස සංඛ්‍යාව 5 කි. මේ සඳහා 2013 වර්ෂය අවසානය වනවිට වැය කල මුදල රු.මි. 27.62 කි. මෙම නිවාස ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතය.

### 2014 ඉදිරි සැලසුම්

- ටවර් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු
    - නිවාස ඒකකවල අභ්‍යන්තර අලංකරණය
    - ඉදිරිපස ආලින්දයේ නවීකරණය
    - ටවර් ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක පිළිසකර කිරීම් සිදුකිරීම.
- කහතුඩුව නිවාස ව්‍යාපෘතියේ නිමකිරීම අවසන් කරන ලද නිවාස 11 අලෙවි කටයුතු සිදුකිරිම හා තෝරාගත් ඉඩම් කැබලි 10 ක් අලෙවි කිරීම.
- මත්තේගොඩ නිවාස ව්‍යාපෘතිය වැඩ අවසන් කිරීම.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා පරිපාලිත සමාගම 2013 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

| | සටහන් | 2013 ජා.නි.ස.අ | 2013 සමූහය<br>රු. ශත | 2012 සමූහය<br>රු. ශත | 2013 අයවැයගත ජා.නි.ස.අ<br>රු. ශත |
|---|---|---|---|---|---|
| **(අ) වත්කම්** | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| ස්ථාවර වත්කම් | | | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | (02) | 564,790,605.63 | 564,790,605.63 | 591,086,885.10 | 604,775,000.00 |
| මෝටර් රථ | (03) | 93,122,846.94 | 106,158,679.94 | 137,713,764.91 | 126,394,000.00 |
| ලී බඩු සහ සවිකිරීම් | (03) | 15,629,484.47 | 16,900,322.47 | 16,185,067.18 | 20,258,000.00 |
| උපකරණ | (03) | 30,442,277.79 | 33,564,223.79 | 53,878,766.10 | 61,278,000.00 |
| දේපළ ආයෝජනයන් | | | 1,939,000,000.00 | 1,847,000,000.00 | |
| | | 703,985,214.83 | 2,660,413,831.83 | 2,645,864,483.29 | 812,705,000.00 |
| **II සංවර්ධන වත්කම්** | | | | | |
| ඉඩම් අත්පත් කර ගැනීම | | 536,058,236.06 | 536,058,236.06 | 311,616,159.27 | 361,215,000.00 |
| ඉඩම් සංවර්ධනය | | 12,916,213.62 | 12,916,213.62 | | |
| නිවාස ණය වැඩ සටහන | (04-13) | 11,269,345,565.54 | 11,269,345,565.54 | 8,223,615,898.37 | 11,124,555,000.00 |
| ණය වැඩ සටහන ජා.නි.දෙ | | 1,554,885.05 | 1,554,885.05 | 1,554,885.05 | |
| කුලී මිලදී ගැනීම් නිවාස වැඩසටහන - ජා.නි.ස.අ | | 253,058,391.22 | 253,058,391.22 | 267,288,345.39 | 240,560,000.00 |
| වාරික පදනම මත නිවාස විකිණීම | | 926,426,136.42 | 926,426,136.42 | 1,028,106,690.28 | 1,089,606,000.00 |
| වාරික පදනම මත ඉඩම් විකිණීම | | 62,739,644.08 | 62,739,644.08 | 8,664,544.80 | 31,298,000.00 |
| කුලී මිලදී ගැනීම් නිවාස ව්‍යාපෘතිය - ජා.නි.දෙ | | 31,267.00 | 31,267.00 | 86,955.00 | |
| මාණ්ඩලික නිවාස වැඩ සටහන | | 154,254,248.49 | 154,254,248.49 | 171,826,632.29 | 171,827,000.00 |
| | | 13,216,384,587.48 | 13,216,384,587.48 | 10,012,760,110.45 | 13,019,061,000.00 |
| **III ආයෝජන - දිගුකාලීන** | (14- 1) | 455,653,703.34 | 335,133,334.34 | 335,133,334.34 | |
| **ජංගම වත්කම්** | | | | | |
| සෘජු ඉදිකිරීම් වැඩ සටහන | (15) | 333,474,911.41 | 333,474,911.41 | 222,447,689.52 | 233,697,000.00 |
| තොග | (16) | 60,857,682.17 | 241,211,253.17 | 168,528,246.50 | 127,647,000.00 |
| කොන්ත්‍රාත්කරුවන් සඳහා අත්තිකාරම් | | 82,286,736.56 | 82,286,736.56 | 131,479,244.54 | 152,461,000.00 |
| ලැබිය යුතු පොලිය | (17) | 6,199,210.46 | 6,199,210.46 | 1,589,047.56 | 1,589,000.00 |
| ණය ගැතියෝ | (18) | 1,681,264,562.44 | 1,732,525,148.44 | 2,320,294,457.17 | 2,381,198,000.00 |
| තැන්පතු සහ අත්තිකාරම් | (19) | 649,643,447.30 | 649,643,447.30 | 527,113,624.34 | 620,883,000.00 |
| ආයෝජන - කෙටිකාලීන | (14-11) | 540,602,563.86 | 573,030,669.86 | 128,639,378.44 | 150,000,000.00 |
| මුදල් සහ බැංකු ශේෂ | (20) | 139,062,008.66 | 145,985,059.66 | 133,702,530.73 | 3,276,000.00 |
| | | 3,493,391,122.86 | 3,764,356,436.86 | 3,633,794,218.80 | 3,670,751,000.00 |
| **මුළු වත්කම්** | | **17,869,414,628.51** | **19,976,288,190.51** | **16,627,552,146.88** | **17,502,517,000.00** |
| **(ආ) යෙදවුම් සම්පත්** | | | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | **50,000,000.00** | **50,000,000.00** | **50,000,000.00** | **50,000,000.00** |
| ආරම්භක ප්‍රාග්ධනය | | 40,000,000.00 | 40,000,000.00 | 40,000,000.00 | 40,000,000.00 |
| ප්‍රාග්ධන සංචිත - විදේශ ආධාර | | 131,682,601.02 | 131,682,601.02 | 131,682,601.02 | 131,682,000.00 |
| - දේශිය ආධාර | (21) | 18,358,581,851.68 | 18,358,581,851.68 | 17,241,346,343.26 | 18,350,745,000.00 |
| | | 18,530,264,452.70 | 18,530,264,452.70 | 17,413,028,944.28 | 18,522,427,000.00 |
| එකතුකලා/අඩුකලා - සමුච්චිත අතිරික්තය /(හිඟ) | | (11,602,434,872.72) | (10,507,754,547.72) | (10,329,999,147.66) | (11,531,071,000.00) |
| | | 6,927,829,579.98 | 8,022,509,904.98 | 7,083,029,796.62 | 6,991,356,000.00 |
| සුළු කොටස් හිමියන්ගේ අයිතිය | | - | 928,649,126.00 | 890,004,470.00 | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂික අරමුදල | | 34,854,162.38 | 34,854,162.38 | 13,568,131.44 | 25,568,000.00 |
| ණය | (22) | 6,714,922,424.42 | 6,714,922,424.42 | 3,970,991,458.67 | 5,572,764,000.00 |
| | | 13,677,606,166.78 | 15,700,935,617.78 | 11,957,593,856.73 | 12,589,688,000.00 |
| **ජංගම වගකීම්** | | | | | |
| ණය හිමියෝ | (23) | 1,609,032,563.69 | 1,688,659,179.69 | 1,471,528,497.19 | 1,633,475,000.00 |
| ණය සඳහා ජංගම වගකීම් | (24) | 1,272,069,317.94 | 1,272,069,317.94 | 1,223,726,867.56 | 1,264,236,000.00 |
| තැන්පතු | (25) | 780,832,414.77 | 780,832,414.77 | 1,474,591,401.56 | 1,524,377,000.00 |
| වෙන් කිරීම් | (26) | 529,874,165.33 | 533,791,660.33 | 500,111,523.84 | 490,741,000.00 |
| | | 4,191,808,461.73 | 4,275,352,572.73 | 4,669,958,290.15 | 4,912,829,000.00 |
| **මුළු ප්‍රාග්ධනය සහ වගකීම** | | **17,869,414,628.51** | **19,976,288,190.51** | **16,627,552,146.88** | **17,502,517,000.00** |

මෙම මූල්‍ය වාර්තා සැකසීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

| | | |
|---|---|---|
| **එස් ඒ ජයන්ත සමරවීර** | **ඒ ඩබ් දයානන්ද** | **ඊ ඒ ඩී එස් එදිරිසිංහ** |
| **සභාපති** | **උප සභාපති** | **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)** |

A. W. DAYANANDA
Vice Chairman
National Housing Development Authority
COLOMBO-02.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා පරිපාලිත සමාගම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | | **2013** | | **2012** | | **2013 අයවැයගත** |
|---|---|---|---|---|---|---|
| | **සටහන්** | **රු ශත** | **රු ශත** | **රු ශත** | **රු ශත** | **රු ශත** |
| **(ඒ) ආදායම්** | [27] | 325,157,009.06 | | 185,424,499.82 | | 284,677,000.00 |
| විකුණුම් පිරිවැය | [28] | 33,436,022.13 | | 13,362,872.42 | | - |
| දල ලාභය | | 291,720,986.93 | | 172,061,627.40 | | 284,677,000.00 |
| **(බී) අනෙකුත් ආදායම්** | | | | | | |
| කුලිය | [29] | 60,827,857.89 | | 51,042,511.55 | | 67,412,000.00 |
| පොලිය | [30] | 1,173,490,320.07 | | 846,251,159.18 | | 1,108,653,000.00 |
| වාහන කුලියට දීම | | 138,536.66 | | 695,626.11 | | 1,750,000.00 |
| යන්ත්‍ර සූත්‍ර කුලියට දීම | | 934,564.41 | | 672,451.88 | | |
| දඩ සහ අධිභාරය | | 15,950,035.90 | | 17,333,781.07 | | 13,798,000.00 |
| වාහන විකුණුම් | | 1,321,000.50 | | 42,906.90 | | 8,924,000.00 |
| සෙවණ මාධ්‍යය | | 1,265,628.83 | | - | | 1,500,000.00 |
| සෙවණ ආධාර ලැබීම් | | 65,287,230.50 | | - | | 123,335,000.00 |
| වක්‍ර මෙහෙයුම් | [31] | 84,100,991.16 | | 114,074,393.38 | | 133,781,000.00 |
| ආපසු නොගෙවන තැන්පතු | [32] | 440,714.49 | | 165,250.00 | | 644,000.00 |
| ආධාර - සහාධිපත්‍ය කළමනාකරණ | | 245,265,465.02 | | 228,669,752.01 | | 1,000,000,000.00 |
| | | | 1,940,743,332.36 | | 1,431,009,459.48 | 2,744,474,000.00 |
| **(සී) වක්‍ර සංවර්ධන වියදම්** | | | | | | |
| අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | | 400,000.00 | | 380,000.00 | | 576,000.00 |
| පුද්ගල පඩිනඩි | [33] | 959,263,877.22 | | 836,198,772.30 | | 1,029,515,000.00 |
| ගමන් වියදම් | [34] | 30,591,032.94 | | 28,868,438.75 | | 34,004,000.00 |
| සැපයුම් | [35] | 69,179,015.94 | | 72,306,839.64 | | 65,775,000.00 |
| නඩත්තු වියදම් | [36] | 300,155,085.50 | | 311,429,082.02 | | 1,071,573,000.00 |
| ගිවිසුම්ගත සේවා | [37] | 73,160,139.56 | | 74,456,508.86 | | 93,411,000.00 |
| මූල්‍යමය වියදම් | [38] | 602,228,413.36 | | 349,014,992.61 | | 494,679,000.00 |
| වක්‍ර මෙහෙයුම් වියදම් | [39] | 29,584,889.74 | | 19,367,371.51 | | 39,132,000.00 |
| ස්ථාවර වත්කම් ක්ෂයවීම් | | 43,495,888.66 | | 41,518,198.86 | | 90,327,000.00 |
| සෙවණ මාධ්‍ය ආදායමට වැඩි වියදම | | - | | 874,715.40 | | - |
| සෙවණ ආධාර වියදම් | | 65,287,230.50 | | - | | 123,335,000.00 |
| | | | 2,173,345,573.42 | | 1,734,414,919.95 | 3,042,327,000.00 |
| (ඩී) අතිරික්තය/(හිඟ)කාලසීමාව සඳහා(ඒ- බී) | | | **(232,602,241.06)** | | **(303,405,460.47)** | **(297,853,000.00)** |
| (ඊ) ඉදිරියට ගෙන ආ සමුච්චිත අතිරික්තය/(හිඟ) | | | (11,369,832,631.66) | | (11,066,427,171.19) | - |
| (ජී) ඉදිරියට ගෙන ගිය සමුච්චිත අතිරික්තය/(හිඟ) | | | **(11,602,434,872.72)** | | **(11,369,832,631.66)** | **(297,853,000.00)** |

## ගිණුම් ප්‍රතිපත්ති

සටහන 1

2013.12.31 නෙන් අවසන් වර්ෂය සඳහා වැදගත් වූ ගිණුම් ප්‍රතිපත්ති.

### 1. පිලිගත් මූලික ගිණුම්

**1.11 ගිණුම්**

පිලිගත් ගණකාධිකරණ මූලධර්මවලට සහ රාජ්‍ය අංශයේ ගණකාධිකාරි ප්‍රමිති කමිටුවේ ගිණුම් ප්‍රමිතීන් අඛණ්ඩව අනුගමනය කරමින් ගිණුම් ප්‍රකාශ සකස් කර ඇත.

**1.12 ශේෂ පත්‍රය පිළියෙළ කිරිමෙන් පසු සිදුකල ගණුදෙනු**

ශේෂ පත්‍ර දිනයට පසු සිදුකල සියළුම ප්‍රමාණාත්මක ගණුදෙනු සැලකිල්ලට ගෙන තිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය සංශෝධන සිදුකර තිබුණි.

**1.13 අඛණ්ඩ පැවැත්ම ප්‍රතිපත්තිය**

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම ප්‍රතිපත්තිය මත පිළියෙළකර තිබූ අතර එමගින් සාමාන්‍යපරිදි කටයුතු කරගෙනයන අතරතුරේදි වත්කම් උපලබ්ධියෙන් බැරකම් පියවීමට අධිකාරියට හැකිවනු ඇත.

### 2. වත්කම් සහ ඒවා අගයකිරීමේ පදනම

**2.1 දේපල, යන්ත්‍ර සහ උපකරණ**

ස්ථාවර වත්කම් අදාල පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර දක්වා ඇත. මෙම වත්කම් භාවිතයට සුදුසු තත්වයට ගෙන ඒමට දරන ලද වියදම් සමඟ මිළදි ගැනුම් පිරිවැය සඳහන් කර ඇත.

**2.2.1 ක්ෂය කිරිම්**

මිළදි ගත්,ඉදිකල හෝ අත්පත් කරගත් වර්ෂයේ සිට ක්ෂය කිරීම් කරනු ලැබේ.

2.2.2 ක්ෂය ප්‍රතිපාදන පිරිවැය මත පහත සඳහන් අනුපාතයන් අනුව කරනු ලැබේ. (ක්ෂය කිරීම් වාර්ෂික පදනම මත කරන බැවින් අර්ධ වාර්ෂික ගිණුම්වල ක්ෂය කිරීම් පෙන්වා නොමැත.

| | | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
|---|---|---|
| 2.2.2.1 | ඉඩම් සහ ගොඩනැගිලි | පිරිවැයමත 2.5% |
| 2.2.2.2 | ලීබඩු, සවිකිරීම් සහ අර්ධ ස්ථිර ඉදිකිරීම් | පිරිවැයමත 20% |
| 2.2.2.3 | යන්ත්‍ර සහ උපකරණ | පිරිවැයමත 20% |
| 2.2.2.4 | රථ වාහන | පිරිවැයමත 20% |

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල සම්පූර්ණයෙන් ක්ෂය වූ වාහන සඳහා නාමික අගයක් ලෙස රු.1000/- ස්ථාවර මිලක් නියම කර ඇත.

### 3. තොග

3.1 අවසන් තොගය භෞතික සත්‍යාක්ෂණය මත පදනම් වී ඇති අතර ප්‍රථමයෙන් ගත් භාණ්ඩ ප්‍රථමයෙන් බැහැර කිරීමේ ක්‍රමය මත අගය කර ඇත.

3.2 නැතිවීම් හා අලාභහානි සත්‍ය පිරිවැය මත හෝ ආදේශිතයේ අගය යන දෙකින් වැඩි අගය මත ගණනය කරනු ලැබේ.

3.3 නිමකරන ලද නිවාසවල අගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගය මත තොගයට මාරු කරනු ලැබේ.

## 4. බැරකම් සහ වෙන්කිරීම්

4.1 ශේෂ පත්‍රයේ ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් ඉල්ලන විට ගෙවිය යුතු සහ ශේෂ පත්‍ර දින සිට වසරක් ඇතුලත ගෙවිය යුතු ඒවා වේ.

## 5. අසම්භාව්‍ය බැරකම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති 08 අනුව පහත සඳහන් බැරකම් අනාවරණය වේ.

5.1 ජාතික නිවාස සංවර්ධන අධිකාරියට එරෙහිව නඩු 30 ක් විභාග වෙමින් පවතින අතර ඇස්තමේන්තු ගත වන්දි මුදල රු. මිලියන 62.456 කි.
නඩු විභාගයන් සඳහා 10% ප්‍රතිපාදනයක් සකස් කර ඇත.

## 6. ආදායම් වාර්තාව

**6.1 කුළී**

කුළී නිවාස යෝජනා ක්‍රමයන්ගෙන් ලැබෙන කුළී පුනරාවර්තන ආදායම් ලෙස සලකනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති 18 අනුව මෙම වත්කම් ක්ෂය කරනු ලැබේ. කුළී නිවාස විකිණීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

**6.2 බොල් සහ අඩමාණ ණය වෙන් කිරිම**

ගිණුම්වල පහත සඳහන් වෙන්කිරිම් කර ඇත.

6.3 වෙන් කිරිම් ප්‍රතිශත නිවාස ණය වයස් විශ්ලේෂණ අනුව සපයා ඇත.

| ණයගැති වයස් විශ්ලේෂණ | | ප්‍රතිශතය |
|---|---|---|
| මාස | 0 - 24 | 10% |
| මාස | 24 - 36 | 20% |
| මාස | 36 - 48 | 30% |
| මාස | 48 - 60 | 50% |
| මාස | 60 ට වැඩි | 100% |

6.4 පහත සඳහන් ණය ගැතියන් සඳහා බොල් සහ අඩමාණ ණය සඳහා වෙන් කිරිම් ණය මුදලේ කාලය ගැන නොසිතා සිදු කර ඇත.

| | |
|---|---|
| වාරික පදනම මත නිවාස විකුණුම් | 20% |
| නාගරික/ග්‍රාමීය නිවාස කුළී | 20% |
| ඉඩම් ණයගැතියෝ | 20% |
| සුළුණයගැතියෝ (දුම්රිය ව්‍යාපෘතිය හැර) | 20% |

මාළිගාවත්ත දුම්රිය ව්‍යාපෘතියෙන් ලබාගන්නා මුදල ඉඩම් වන්දි සඳහා හිලව් කිරීමට කටයුතු කරනු ලැබේ. මේ හේතුව නිසා මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැත.

**6.5 පොළී ගෙවීම්**

ප්‍රමාද වූ ඉඩම් වන්දි සඳහා පොළී ගෙවීම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

**6.6 පොදුකාර්ය පිරිවැය අන්තර්ගත කිරිම**

නාගරික නිවාස ඉදිකිරීම් වැඩසටහනේ පෙර විකුණුම්, පුනස්ථාපන සහ වෙරළබඩ ව්‍යාපෘති සම්බන්ධයෙන් වැයකර ඇති ඍජු පොදුකාර්ය පිරිවැය 1997 වසරේ සිට සත්‍ය වියදම් පදනම මත ව්‍යාපෘතීන් වලට අන්තර්ගත කරන ලදී.

**6.7 අයභාර වියදම්**

කාර්යක්ෂමතාවයෙන් යුතුව ව්‍යාපාරය සහ ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යාම සඳහා යොදවන ලද සියළු වියදම් අවුරුද්දේ ලාභයට ගලපනු ලැබේ.

**6.8 ප්‍රාග්ධන වියදම්**

ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම, පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා දරණු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

## 7. බදුකරණය

දේශීය ආදායම් පනතෙහි සඳහන් ප්‍රමාණයන් අනුව බදු ගණනය කරනු ලැබේ.

ආදායමෙන් ප්‍රාග්ධන ලැබීම් සඳහා ගැලපීම් සංශෝධනය කිරීමෙන් පසු බදු ගෙවීමේ වගකීම අධිකාරියට පැවරී ඇත.

## 8. නිවාස විකුණුම්

| වානිජ ගොඩනැගිලි | 36,019,600.38 | 29,633,708.50 |
| බදු කුලී | 10,612,739.94 | 6,394,889.68 |
| සංචාරක බංගලා කුලී | 1,929,652.62 | 2,023,512.56 |
| | **60,827,857.89** | **51,042,511.55** |

### සටහන (30) පොලී ආදායම්

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ආපදා ණය | 6,021,331.65 | 4,939,311.86 |
| වාහන ණය | 1,147,764.04 | 894,521.59 |
| නිවාස විකුණුම් වාරික මත පොලී | 23,365,129.95 | 26,072,578.46 |
| ඉඩම් විකුණුම් වාරික මත පොලී | 4,743,964.41 | 5,952,220.37 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ණය පොලී | - | 61,143.06 |
| නිවාස දශ ලක්ෂයේ ණය පොලී | 22,518.62 | 1,552.71 |
| නිවාස පහලොස් ලක්ෂයේ ණය පොලී | 1,027.04 | 106,518.80 |
| නව නිවාස මූල්‍ය ක්‍රමය යටතේ ණය පොලී | 68,008.55 | 151,127.86 |
| භාණ්ඩාගාර බිල්පත් පොලී | 36,477,782.09 | 41,551,581.81 |
| දිරිපියස ණය මත පොලී | 1,119,784.26 | 2,381,666.73 |
| ගමනැගුම වැඩසටහන මත පොලී | 101,689,015.15 | 107,660,983.50 |
| ජනසෙවන වැඩසටහන මත පොලී I 12%(බැංකු) | 101,357,756.30 | 100,118,619.71 |
| භාණ්ඩාගාර අරමුදල සහ අභ්‍යන්තර උත්පාදන ණය | 404,044,436.79 | 274,762,571.53 |
| ජනසෙවන වැඩසටහන මත පොලී II 10% (බැංකු) | 425,888,409.31 | 186,942,333.77 |
| සේවක නිවාස ණය | 7,102,818.84 | 8,587,961.99 |
| ධීවර නිවාස ණය පොලී හා වතු නිවාස ණය පොලී | 3,295,560.18 | 2,812,513.51 |
| ණය වැඩසටහන් | 56,282,882.88 | 82,675,075.54 |
| අනෙකුත් පොලී | 862,130.01 | 578,876.38 |
| | **1,173,490,320.07** | **846,251,159.18** |

### සටහන (31) වකු මෙහෙයුම් ආදායම්

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| නිවාස ණය සම්බන්ධව සේවා ගාස්තු | 37,452,705.83 | 56,149,134.91 |
| නිවාස පැවරුම් ගාස්තු | 8,703,012.77 | 13,699,918.42 |
| පරිපාලන ගාස්තු | 7,160,994.60 | 8,626,333.67 |
| ලියකියවිලි පොත්පත් සහ වෙනත් දෑ වියදම් | 2,552,019.89 | 2,732,292.43 |
| ප්‍රයෝජනයට ගත නොහැකි අයිතම් විකුණුම් | 3,970,675.13 | 2,392,604.30 |
| පරිශ්‍ර කුලියට දීම | 6,653,733.00 | 6,438,859.65 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙන් ලැබූ ලාභාංශ | 8,045,000.00 | - |
| නිවාසවලට වන්දි ගෙවීම | - | 24,000,000.00 |
| රක්ෂණ වන්දි ලැබීම් | 304,259.98 | - |
| හිමිකම් නොපෑ ටෙන්ඩර් තැන්පතු හා රඳවාගත් මුදල් | 5,796,443.38 | - |
| ලී බඩු කුලියටදීම | 18,750.00 | 35,250.00 |
| වන්දි සඳහා වැඩිපුර වෙන්කිරීම් | 167,650.79 | - |
| උපදේශන ගාස්තු ලැබීම් | 3,275,745.79 | - |
| | **84,100,991.16** | **114,074,393.38** |

## සටහන (32) ආපසු නොගෙවන තැන්පතු

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ටෙන්ඩර් ගාස්තු | 440,714.49 | 165,250.00 |
| | **440,714.49** | **165,250.00** |

## සටහන (33) කාර්යය මණ්ඩල පඩිනඩි

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| වැටුප් හා වේතන | 453,429,970.70 | 434,780,234.84 |
| අතිකාල | 37,763,715.05 | 37,622,320.77 |
| වෙනත් දීමනා | 80,249,403.71 | 61,983,272.97 |
| ජීවන වියදම් දීමනා | 161,544,611.16 | 135,983,132.71 |
| දිරි දීමනා | 19,680,102.15 | 15,646,402.09 |
| ප්‍රසාද දීමනා | 2,461,709.00 | 2,409,916.93 |
| සේවක අර්ථසාධක අරමුදලට දායකවීම | 83,258,334.92 | 56,622,164.00 |
| සේවක භාරකාර අරමුදලට දායකවීම | 20,777,202.58 | 14,335,669.98 |
| වන්දි | 589,850.00 | 66,075.00 |
| නිවාඩු දීමනා ගෙවීම් | 2,404,106.52 | 2,343,333.23 |
| පුහුණු හා ශිෂ්‍යත්ව | 1,870,943.08 | 1,544,949.52 |
| විවේක නිවාඩු සඳහා මුදල් ගෙවීම | 12,292,259.26 | 12,250,692.76 |
| සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය | 33,214.40 | 20,103.20 |
| සේවක වෛද්‍ය යෝජනා ක්‍රමය | 6,438,761.47 | 6,517,406.39 |
| සංග්‍රහ වියදම් | 2,580,985.75 | 3,368,273.74 |
| වෛද්‍ය වාර්තා ගාස්තු | 124,291.05 | 154,222.00 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 73,610,286.42 | 50,330,981.02 |
| තොග සමීක්ෂණ මණ්ඩල දීමනා | 154,130.00 | 219,621.15 |
| | **959,263,877.22** | **836,198,772.30** |

## සටහන (34) ගමන් වියදම්

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ගමන් වියදම් - දේශීය | 29,084,153.10 | 27,157,120.87 |
| ගමන් වියදම් - විදේශීය | 1,506,879.84 | 1,711,317.88 |
| | **30,591,032.94** | **28,868,438.75** |

## සටහන (35) සැපයුම්

| | 2013 රු. ශත | 2012 රු. ශත |
|---|---|---|
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 31,595,557.20 | 26,031,328.98 |
| මෝටර් වාහන සඳහා ඉන්ධන | 26,055,443.41 | 23,118,309.05 |
| ප්‍රවාහන හා යන්ත්‍ර උපකරණ කුලී | 584,624.50 | 570,554.92 |
| සෞඛ්‍ය සනීපාරක්ෂක හා වෙනත් සේවා | 1,203,192.62 | 1,186,432.01 |
| මුද්‍රණ ගාස්තු | 1,779,668.39 | 1,872,645.73 |
| පුවත්පත් සහ සඟරා | 1,033,256.61 | 1,144,939.19 |
| නිළඇඳුම් | 1,681,891.60 | 171,010.95 |
| සුභ සාධක සේවා මගින් තේ සැපයීම | 4,601,344.29 | 4,047,519.59 |
| සුභ සාධන | 322,511.83 | 508,269.50 |
| නාම පුවරු සහ විවෘත කිරීමේ උත්සව | 321,525.49 | 13,655,829.72 |
| | **69,179,015.94** | **72,306,839.64** |

## සටහන (36)නඩත්තු වියදම්

| | 2013 රු. ශත | 2012 රු. ශත |
|---|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහ | 15,602,680.88 | 34,547,435.81 |
| යන්ත්‍ර උපකරණ සහ කාර්යාල උපකරණ | 6,868,162.36 | 6,748,430.16 |
| මෝටර් රථ | 16,287,516.52 | 14,075,451.83 |
| ලී බඩු | 165,040.88 | 134,020.00 |
| නිවාස යෝජනා ක්‍රම | 13,570,047.30 | 24,685,628.82 |
| සංචාරක බංගලා වියදම් | 2,396,172.54 | 2,568,363.39 |
| සහාධිපත්‍ය කළමනාකරණ | 245,265,465.02 | 228,669,752.01 |
| | **300,155,085.50** | **311,429,082.02** |

## සටහන (37) ගිවිසුම්ගත සේවා

| | Rs | Rs |
|---|---|---|
| ටෙන්ඩර් ලියකියවිලි ගාස්තු | 45,600.75 | 79,516.25 |
| මෝටර් රථ කුලී | 4,865,213.88 | 3,522,139.19 |
| දුරකථන | 9,719,636.11 | 9,017,467.05 |
| විදුලිය | 13,578,807.30 | 14,845,459.64 |
| ජලය | 3,353,047.61 | 2,940,467.63 |
| කාර්යාල ගොඩනැගිලි කුලී | 1,533,280.00 | 1,398,000.00 |
| වරිපනම් | 8,684,639.53 | 7,971,423.99 |
| ප්‍රචාරනය | 4,567,824.96 | 6,599,988.46 |
| නීති ගාස්තු | 4,138,736.01 | 2,734,229.32 |
| තැපැල් ගාස්තු | 11,635,552.42 | 8,580,418.88 |
| රක්ෂණය | 4,415,567.66 | 5,543,998.14 |
| බලපත්‍ර ගාස්තු. | 1,588,725.00 | 1,687,319.00 |
| තොරතුරු හා ප්‍රචාරක | 5,033,508.33 | 9,536,081.31 |
| | **73,160,139.56** | **74,456,508.86** |

## සටහන (38) මූල්‍ය වියදම්

| | 2013 | 0 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| විගණන ගාස්තු | 1,728,600.00 | 500,000.00 |
| බැංකු ගාස්තු | 3,255,430.79 | 1,514,973.01 |
| මුද්දර ගාස්තු | 204,467.33 | 246,664.00 |
| කුලී නිවැසියන්ට සහන | 3,260,236.66 | 7,167,768.32 |
| ජනාධිපති අරමුදල් පොලී | 29,250,000.00 | 29,250,000.00 |
| භාණ්ඩාගාර ණය පොලී | - | 31,250.00 |
| කොමිස් ගෙවීම් - ණය එකතු කිරීම් | 57,337,244.72 | 62,029,530.18 |
| කොමිස් ගෙවීම් - කුලී එකතු කිරීම් | 3,454,630.56 | 3,181,187.49 |
| බොල් හා අඩමාන ණය | 25,258,311.69 | 2,050,129.99 |
| දඩ හා අධිභාර | - | 28,786.87 |
| පොලී ගෙවීම - කොමර්ෂල් බැංකුවේ දිරිපියස ණය සඳහා | 4,531,109.46 | 5,151,769.87 |
| උපහාර බැංකු ණය පොලී ගෙවීම | 442,614,251.41 | 209,323,137.22 |
| පොලී ගෙවීම - වෙනත් ණය | 4,647,028.10 | 5,482,795.07 |
| මැනුම් / තක්සේරු වියදම් | 3,059,399.65 | 2,852,998.75 |
| වෙනත් වන්දි | - | 6,413,268.87 |
| රඳවාගත් බදු | 3,218,144.32 | 798,268.70 |
| ජාතිය ගොඩනැගීමේ බදු | - | 36,745.77 |
| ආර්ථික සේවා ගාස්තු | 2,469,840.44 | 4,878,541.64 |
| හර බදු | 2,323.00 | 26,550.33 |
| වැට් | 13,168,663.23 | 7,562,667.78 |
| නිවාස දේපල උපරිම සමාලෝචන මණ්ඩල වියදම් | 1,137,750.00 | 410,458.75 |
| නිවාස වන්දි | 3,600,000.00 | - |
| දේපල උපරිම තක්සේරු මණ්ඩල වියදම් | - | 77,500.00 |
| උපදේශන ගාස්තු | 30,982.00 | - |
| | **602,228,413.36** | **349,014,992.61** |

## සටහන (39) වක්‍ර මෙහෙයුම් වියදම්

| | 2013 | 0 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ජංගම කාර්යාල වියදම් | - | 120,969.00 |
| දිස්ත්‍රික් නිවාස කමිටු වියදම් | 1,293,701.00 | 1,220,194.60 |
| ප්‍රදර්ශන වියදම් | 442,484.23 | 8,224,353.09 |
| මහජන සම්බන්ධ ක්‍රියාකාරිකම් | 22,660,177.16 | 9,469,282.82 |
| අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීම | 78,545.00 | 332,572.00 |
| දැයට කිරුළ වියදම් | 5,109,982.35 | - |
| | **29,584,889.74** | **19,367,371.51** |

**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ පාලිත සමාගම**

**ශුද්ධ වත්කම්/හිමිකාරත්වය වෙනස්වීමේ ප්‍රකාශය - 2013.12.31 දිනට**

රු.මි.

| | ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | අයභාර සංචිත | රඳවාගත් අතිරික්ත /හිඟ | එකතුව | සුළුකොටස් හිමියන්ගේ අයිතිය ඕ.වී.ඩී.සී. | ශුද්ධ වත්කම්/ හිමිකාරත්වය එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2012.01.01 දිනට ශේෂය | 40.000 | 17,373.029 | | (10329.999) | 7083.030 | 890.004 | 7973.034 |
| පෙර කාලපරිච්ඡේදය ගැලපීම් | | | | (11.990) | (11.990) | (12.397) | (24.387) |
| 2012.12.31 දිනට නැවත ශේෂය | 40.000 | 17373.029 | | (10341.989) | 7071.040 | 877.607 | 7948.647 |
| 2013 වර්ෂයේ ශුද්ධ වත්කම්/හිමිකාරත්වය වෙනස්වීම | | 1117.235 | | | 1117.235 | - | 1117.235 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත/හිඟ | | | | (165.765) | (165.765) | 51.042 | (114.723) |
| 2013.01.01 දිනට ශේෂය ඉදිරියට ගෙන ගිය | 40.000 | 18490.264 | | (10507.754) | 8022.510 | 928.649 | 8951.159 |

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ පාලිත සමාගම
## 2013 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | | 2013 | 2012 |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | රු.මි. | රු.මි. |
| **ආදායම් බදුවලට පෙර අතිරික්තය / හිඟ** | | | | |
| | ජා.නි.ස.අධිකාරිය | (232.602) | | (303.405) |
| | ඕ.වී.ඩී.සී.සමාගම | 122.063 | (110.539) | 106.040 |
| **මුදල් නොවන සංසරණ** | | | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | ජා.නි.ස.අධිකාරිය | 73.610 | | 50.331 |
| | ඕ.වී.ඩී.සී.සමාගම | 0.659 | | 0.467 |
| ක්‍ෂය වෙන්කිරීම් | ජා.නි.ස.අධිකාරිය | 43.496 | | 41.518 |
| | ඕ.වී.ඩී.සී.සමාගම | 6.465 | | 9.453 |
| ආධාර යටතේ වාහන සඳහා ක්‍ෂය වෙන්කිරීම් | | 25.788 | | |
| අඩමාන ණය - ජා.නි.ස.අධිකාරිය | | 25.258 | | 2.050 |
| අඩමාන ණය කපා හැරීම - ඕ.වී.ඩී.සී සමාගම | | 1.050 | | - |
| ලීබඩු සහ සවිකිරීම්, ලියා හැරීම - ඕ.වී.ඩී.සී සමාගම | | - | | 1.524 |
| භාණ්ඩාගාරයේ බිල්පත් ආයෝජන ප්‍රතිලාභ - ඕ.වී.ඩී.සී සමාගම | | 0.003 | | - |
| අවසන් නොවූ උසාවි නඩු සඳහා වෙන්කිරීම් - ජා.නි.ස. අධිකාරිය | | (0.168) | | 6.413 |
| ඕ.වී.ඩී.සී.සමාගමේ පාරිතෝෂික ගැලපීම් | | - | | (3.167) |
| දේපළ ආයෝජන ප්‍රතිලාභ - ඕ.වී.ඩී.සී සමාගම | | (89.061) | 87.100 | (117.013) |
| | | | (23.439) | |
| ස්ථාවර වත්කම් විකුණුම් ආදායම් | | (1.321) | | (0.172) |
| ආයෝජන ආදායම් | | (36.478) | | (41.613) |
| පොලී ලැබීම් - ඕ.වී.ඩී.සී සමාගම | | (5.660) | | (4.215) |
| ලාභාංශ ලැබීම් | | (8.045) | (51.504) | - |
| මෙහෙයුම්වලින් ලද ලාභය කාරක ප්‍රාග්ධනයට පෙර | | | (74.943) | (251.789) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් | | | | |
| වැඩිවීම්/ අඩුවීම් කෙරීගෙන යන වැඩ | | (183.710) | | (77.237) |
| වැඩිවීම්/ අඩුවීම් අනෙකුත් ලැබීම් | | 472.871 | | 96.097 |
| වැඩිවීම්/ අඩුවීම් ගෙවීය යුතු වියදම් | | (432.071) | | 122.612 |
| වැඩිවීම්/ අඩුවීම් වෙන්කිරීම සඳහා | | 0.985 | (141.925) | (0.270) |
| මෙහෙයුම් කටයුතුවලින් මුදල් ඉපැයීම් | | | (216.868) | (110.587) |
| පාරිතෝෂික ගෙවීම් | | | (41.805) | (37.425) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් | | | (258.673) | (148.012) |
| ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය | | | | |
| සුළු කොටස් හිමියන්ගේ අයිතිය | | - | | (13.375) |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | (22.691) | | (158.035) |
| වැඩිවීම/අඩුවීම සංවර්ධන වත්කම් | | (3,193.664) | | (3,315.047) |
| දේපල පිරියත උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 1.325 | | 0.364 |
| දේපල ආයෝජනයන්වල එකතුව - ඕ.වී.ඩී.සී සමාගම | | (2.939) | | (6.471) |
| පොලී ලැබීම් - ජා.නි.ස.අධිකාරිය | | 36.478 | | 41.613 |
| පොලී ලැබීම් - ඕ.වී.ඩී.සී සමාගම | | 5.660 | | 4.215 |
| ඕ.වී.ඩී.සී සමාගමේ ආයෝජයනයන් කල් පිරීමට ලද ශුද්ධ වටිනාකම | | (9.963) | | (20.471) |
| ලාභාංශ ලැබීම් | | 8.045 | | - |
| පාරිතෝෂික අරමුදල | | 21.286 | (3,156.463) | 4.726 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදූ මුදල් | | | (3,415.136) | (3,610.493) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | | | |
| ආධාර ලැබීම් | | 1588.113 | | |
| ආධාර ගෙවීම් | | (470.878) | 1117.235 | 2232.779 |
| ණය ලැබීම් | | 3009.022 | | |
| ණය ගෙවීම් | | (265.091) | 2743.931 | 1437.653 |
| මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන්ගේ ශුද්ධ වැඩිවීම | | | 446.030 | 59.939 |
| කාල පරිච්ඡේදය ආරම්භක දිනට මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන් | | | 205.703 | 145.764 |
| කාල පරිච්ඡේදයේ අවසාන දිනට මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන් | | | 651.733 | 205.703 |

මුදල් ප්‍රවාහ වාර්තාවට සටහන්

මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන්

අතැති මුදල් බැංකු ශේෂ මූල්‍ය වෙළඳපොලේ මුදල් ආයෝජන

පහත සඳහන් මූල්‍යමය වගන්ති මුදල් ප්‍රවාහ වාර්තාවේ මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන්ට අයත් වේ.

| | 2013 | 2012 |
|---|---|---|
| අතැති මුදල් සහ බැංකු ශේෂ | 145.985 | 133.703 |
| කෙටි කාලීන ආයෝජන | 505.748 | 72.000 |
| | 651.733 | 205.703 |

## දිස්ත්‍රික් කාර්යාල පිහිටීම



## දිස්ත්‍රික් කාර්යාල
නම් හා ලිපිනයන්

1. දිස්ත්‍රික් කාර්යාලය - කොළඹ නගර (උතුර)
ලිපිනය : පරිසරමාවත, මාළිගාවත්ත,
කොළඹ 10
දුරකථනය - 011 2445546
ෆැක්ස්- 011 2435146
ඊමේල් - dmccity@nhda.lk

2. දිස්ත්‍රික් කාර්යාලය -කොළඹ නගර (දකුණ)
ලිපිනය : අංක.280/ 11, ඇල්විටිගල
මහල්නිවාස, කොළඹ 08
දුරකථනය - 0112679857
ෆැක්ස් - 0112669753
ඊමේල් - dmmtown@nhda.lk

3. දිස්ත්‍රික් කාර්යාලය - කොළඹ දිස්ත්‍රික් කාර්යාලය
ලිපිනයඃඅංක 190, හොරණපාර, කොට්ටාව
දුරකථනය - 011 2178226
ෆැක්ස් - 011 2178224
ඊමේල් - dmcolombo@nhda.lk

4. දිස්ත්‍රික් කාර්යාලය - ගම්පහ
ලිපිනය : වලව්වත්ත, ගම්පහ
දුරකථනය - 033 2226017
ෆැක්ස් -033 2234265
ඊමේල් - dmgampaha@nhda.lk

5. දිස්ත්‍රික් කාර්යාලය - කළුතර
ලිපිනය :03 වනමහල, මහලේකම් කාර්යාලය,කළුතර
දුරකථනය - 034 2222298
ෆැක්ස් - 034 2222298
ඊමේල් - dmkalutara@nhda.lk

6. දිස්ත්‍රික් කාර්යාලය - මහනුවර
ලිපිනය : යටිනුවර වීදිය, මහනුවර
දුරකථනය - 081 2234967
ෆැක්ස් - 081 2223139
ඊමේල් - dmkandy@nhda.lk

7. දිස්ත්‍රික් කාර්යාලය - මාතලේ
ලිපිනය : කච්චේරි සංකීර්ණය, මාතලේ
දුරකථනය -066 2222134
ෆැක්ස් -066 2222134
ඊමේල් - dmmatale@nhda.lk

8. දිස්ත්‍රික් කාර්යාලය - නුවරඑළිය
ලිපිනය : හාවාඑළිය, නුවරඑළිය
දුරකථනය - 052 2222925
ෆැක්ස් - 052 2222925
ඊමේල් - dmnelia@nhda.lk

9. දිස්ත්‍රික් කාර්යාලය - ගාල්ල
ලිපිනය : ඊකෝට්ස් ගොඩනැගිල්ල,කොටුව,ගාල්ල
දුරකථනය - 091 2234373
ෆැක්ස් - 091 2234232
ඊමේල් - dmgalle@nhda.lk

10. දිස්ත්‍රික් කාර්යාලය - මාතර
ලිපිනය : දුම්රියපොළපාර, මාතර
දුරකථනය - 041 2222986
ෆැක්ස් - 041 2229257
ඊමේල් - dmmatara@nhda.lk

11. දිස්ත්‍රික් කාර්යාලය - හම්බන්තොට
ලිපිනය : අංක 42, අළුත් පාර, හම්බන්තොට
දුරකථනය - 047 2222013
ෆැක්ස් - 047 2222013
ඊමේල් - dmhambantota@nhda.lk

12. දිස්ත්‍රික් කාර්යාලය - යාපනය
ලිපිනය : නුවර පාර, යාපනය
දුරකථනය - 021 2222039
ෆැක්ස් - 021 2222039
ඊමේල් - dmjaffna@nhda.lk

13. දිස්ත්‍රික් කාර්යාලය - මන්නාරම
ලිපිනය : පල්ලිමොනපාර, ඔප්පුකුලම්, මන්නාරම
දුරකථනය - 023 2222315
ෆැක්ස් - 023 2222141
ඊමේල් - dmmannar@nhda.lk

14. දිස්ත්‍රික් කාර්යාලය - මුලතිව්
ලිපිනය : නුවරපාර (A 9), මාන්කුලම් (මුලතිව්)
දුරකථනය - 021 2060033
ෆැක්ස් - 021 2060022
ඊමේල් - dmmulativu@nhda.lk

15. දිස්ත්‍රික් කාර්යාලය - මඩකලපුව
ලිපිනය : කල් අඩි, මඩකලපුව
දූරකථනය - 065 2224473
ෆැක්ස් -065 2227310
ඊමේල් - dmbatticaloa@nhda.lk

16. දිස්ත්‍රික් කාර්යාලය - අම්පාර
ලිපිනය : ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අම්පාර
දූරකථනය - 063 2222045
ෆැක්ස් - 063 2222045
ඊමේල් - dmampara@nhda.lk

17. දිස්ත්‍රික් කාර්යාලය - ත්‍රිකුණාමලය
ලිපිනය : විදුලිබලාගාර මාවත, ත්‍රිකුණාමලය
දූරකථනය - 026 2222162
ෆැක්ස් - 026 2222503
ඊමේල් - dmtrinco@nhda.lk

18. දිස්ත්‍රික් කාර්යාලය -කුරුණෑගල
ලිපිනය : අංක 05, මිහිඳු මාවත, කුරුණෑගල
දූරකථනය - 037 2222014
ෆැක්ස් - 037 2222014
ඊමේල් - dmkurunegala@nhda.lk

19. දිස්ත්‍රික් කාර්යාලය - පුත්තලම
ලිපිනය : ගම් උදාව,ආණමඩුව
දූරකථනය - 032 2263427
ෆැක්ස් - 032 2263425
ඊමේල් - dmputtalam@nhda.lk

20. දිස්ත්‍රික් කාර්යාලය - අනුරාධපුර
ලිපිනය : බණ්ඩාරනායක මාවත, අනුරාධපුරය
දූරකථනය - 025 2222558
ෆැක්ස් - 025 2222649
ඊමේල් - dmanuradhapura@nhda.lk

21. දිස්ත්‍රික් කාර්යාලය -පොලොන්නරුව
ලිපිනය : පුලතිසිගම, හිඟුරක්ගොඩ
දූරකථනය - 027 2246362
ෆැක්ස් - 027 2246362
ඊමේල් - dmpolonnaruwa@nhda.lk

22. දිස්ත්‍රික් කාර්යාලය -බදුල්ල
ලිපිනය : සායන පාර, බදුල්ල
දූරකථනය - 055 2222113
ෆැක්ස් - 055 2223163
ඊමේල් - dmbadulla@nhda.lk

23. දිස්ත්‍රික් කාර්යාලය -මොණරාගල
ලිපිනය : දිස්ත්‍රික් කාර්යාලය, මොණරාගල
දූරකථනය - 055 2276202
ෆැක්ස් - 055 2276202
ඊමේල් - dmmonaragala@nhda.lk

24. දිස්ත්‍රික් කාර්යාලය -රත්නපුරය
ලිපිනය : නව නගරය, රත්නපුරය
දූරකථනය - 045 2228724
ෆැක්ස් - 045 2228996
ඊමේල් - dmrathnapura@nhda.lk

25. දිස්ත්‍රික් කාර්යාලය - කෑගල්ල
ලිපිනය : අඹන්පිටිය, ගලිගමුව නගරය, කෑගල්ල
දූරකථනය - 035 2229737
ෆැක්ස් - 035 2229737
ඊමේල් - dmkegalle@nhda.lk

26. දිස්ත්‍රික් කාර්යාලය - කිලිනොච්චිය
ලිපිනය : 155, A9 පාර, කිලිනොච්චිය
දූරකථනය - 021 2285757
ෆැක්ස් - 035 2229737
ඊමේල් - dmkilinochchi@nhda.lk

27. දිස්ත්‍රික් කාර්යාලය - වවුනියාව
ලිපිනය : පාර්ක් මාවත, වවුනියාව
දූරකථනය - 024 2222214
ෆැක්ස් - 024 2222050
ඊමේල් - dmvavuniya@nhda.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. EH/D//NHDA/1/ 13 /8 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 27 April 2015

ඊඑච්/ඩී/එන්එච්ඩීඒ/1/13/8 2015 අප්‍රේල් මස 27 දින

සභාපති

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

## ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මුල්‍ය ප්‍රකාශන අධිකාරිය සහ එහි පරිපාලිතයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මුල්‍ය ප්‍රකාශන සහ අධිකාරිය සහ එහි පරිපාලිතයේ 2013 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1979 අංක 17 දරන නිවාස සංවර්ධන අධිකාරියේ පනතේ 29.1 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2014 නොවැම්බර් 26 දින නිකුත් කරන ලදී.

### 1.2 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීමවේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මුල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මුල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මුල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කල මතය

### තත්ත්වාගණනය කල මතය - අධිකාරිය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මුල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතයවේ.

### තත්ත්වාගණනය කල මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 සහ 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මුල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතයවේ.

## 2.2 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 49 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වුවත් බැංකුවේ කටයුතුවලට ප්‍රමාණවත් බලපෑමක් කිරීමට අධිකාරියට නොහැකිවීම හේතුවෙන් බැංකුවේ අවසන් මුල්‍ය ප්‍රකාශන අධිකාරියේ ගිණුම් සමඟ ඒකාබද්ධ කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින්, එහි සමූහයේ වත්කම්, වගකීම් සහ ස්කන්ධය ඒකාබද්ධ මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුළත් කර තිබුණද, ඒ පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශනයට සටහන් ලෙස දක්වා නොතිබුණි.

(ඇ) සමූහය වෙනුවෙන් පිළියෙල කරන ලද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයක් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) සම්බන්ධිත පාර්ශවයන් සහ සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - අධිකාරිය

### 2.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කර ප්‍රමිත අංක 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

(අ) මූල්‍ය ප්‍රකාශනවල මුහුණතෙහි පෙන්නුම් කරනු ලබන සියළුම සංරචකයන්ට අදාලව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකල යුතුවුවත් අධිකාරිය විසින් රු.මිලියන 131.68 ක විදේශ ප්‍රදාන සම්බන්ධව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ප්‍රසිද්ධ කරනු ලබන තොරතුරුවල හෙළිදරව් කළ යුතු පහත සඳහන් දෑ අධිකාරිය විසින් හෙළිදරව් කර නොතිබුණි.

(i) අධිකාරිය පිහිටි ස්ථානය, නෛතික ස්වභාවය හා එය ක්‍රියාත්මක වන කලාප

(ii) අධිකාරියේ මෙහෙයුම්වල ස්වාභාවය සහ එහි ප්‍රධාන කටයුතුවල විස්තර

(iii) අධිකාරියේ මෙහෙයුම් පාලනය කිරීමට අදාලවන ව්‍යවස්ථාව පිළිබඳ යොමුව

### 2.3.2 මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.3 අනුව තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට ආගණනය කළයුතු වුවත්, අවසන් තොගයේ ඇති රු.මිලියන 20.97 ක් වූ නිවාස 04 ක වර්තමාන ශුද්ධ උපලබ්ධි අගය තක්සේරු කිරීමකින් තොරව 2009 වර්ෂයේ තක්සේරු වටිනාකමට දක්වා තිබුණි.

(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 6.4 අනුව හිඟ හිටි නිවාස ණය ශේෂය හැරුණු විට අනෙකුත් සියළුම ණයගැතියන්ගේ හිඟ හිටි ණය මුදලින් සියයට 20 ක ප්‍රතිශතයක්, වයස් විශ්ලේෂණය සැලකිල්ලට නොගෙන, බොල් හා අඩමාන ණය සඳහා වෙන්කිරීම සිදුකරන නමුත් වයස් විශ්ලේෂණය සලකා බැලීමේ දී රු.මිලියන 846.39 ක් වූ මුළු ණය ශේෂය වර්ෂ 05 කට වඩා හිඟ හිට ඇති බැවින් එම ප්‍රතිපත්තිය ණය අයකරගැනීමේ අවදානම පාදක කරගෙන කරන ලද්දක් බව විගණනයේදී පිළිගැනීමට නොහැකි විය. තවද උක්ත ප්‍රතිපත්තියට අනුව එකී ණයගැතියන් වෙනුවෙන් රු.මිලියන 200.80 ප්‍රතිපාදනයක් කළයුතු වුවද ගිණුම්වල කරන ලද ප්‍රතිපාදනය රු. 140.67 ක් විය.

(ඇ) ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 6.4 අනුව මාළිගාවත්ත දුම්රිය දෙපාර්තමේන්තු (සීජීආර්) නිවාසව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.මිලියන 58.12 ක් ගෙවිය යුතු ඉඩම් වන්දි වෙනුවෙන් හිලව් කරනු ලබන බව දක්වා තිබුණද ඊට අදාල විස්තරාත්මක ණය ශේෂ ලැයිස්තුව සහ ගෙවිය යුතු ඉඩම් වන්දිවලට අදාල විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒ වෙනුවෙන් කළයුතු අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට විගණනයේදි නොහැකිවිය.

(ඈ) ගිණුම් ප්‍රතිපත්ති 10.1.1 අනුව නිවාස අරමුණක් වෙනුවෙන් වන්දි ගෙවීමකින් තොරව

අත්පත් කරගන්නා ඉඩම්වල ඇස්තමේන්තු වෙළඳපල අගය අදාල ඉඩම් ගිණුම්වල පෙන්විය යුතුවුවත්, එලෙස ගිණුම්ගත නොකිරීම මත විකුණු ඉඩම්වල ඇස්තමේන්තුගත වෙළඳපල වටිනාකම ඉඩම් විකුණුම් පිරිවැයට ඇතුළත්ව නොතිබීම ඉඩම් විකුණුම් දළ ලාභ අනුපාතය අසාමාන්‍ය ලෙස ඉහළයාමට හේතුවී තිබුණි. නිදසුනක් ලෙස සමාලෝචිත වර්ෂයේ ඉඩම් විකුණුම් පිරිවැටුම වූ රු.මිලියන 259.67 ට අදාල විකුණුම් පිරිවැය රු.මිලියන 3.93 ක් වූයෙන් දළ ලාභ අනුපාතය සියයට 98 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි.

### 2.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නිවාස යෝජනා ක්‍රමවල තවදුරටත් ඉතිරිවී තිබුණ ඉඩම් කැබලි හා නිවාස යෝජනා ක්‍රම සඳහා ලබාගෙන තිබුණු /පවරාගෙන තිබුණු ඉඩම් හෙක්ටයාර් 943 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) පෙර විකුණුම් නිවාස වැඩසටහනට අදාලව සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 18.51 ක වැඩ අවසන් නිවාසවල පිරිවැය පමණක් නිවාස තොගයට මාරුකර ඇතත් ඊට අදාල ඉඩම්වල වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි. මේ හේතුවෙන් නිවාස තොගයේ හා අත්පත්කරගත් ඉඩම්වල වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය වී නොතිබුණි.

(ඇ) අධිකාරියේ කාර්යාල ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් කට්ටි 29 කට අදාල වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.1,353,185 ක් වූ වැට් බදු වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) අධිකාරිය විසින් රඳවාගත් ජල්තර නිවාස ව්‍යාපෘතියේ නිවාස දෙකක වටිනාකම වූ රු.මිලියන 3.42 ක් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ගෙවිය යුතු ශේෂයක් ලෙස නොව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ප්‍රසාද කොටස් වටිනාකම රු.මිලියන 276.5 ක් ප්‍රාග්ධන සංචිතයක් ලෙස දක්වනවා වෙනුවට දේශීය ප්‍රධාන ලෙස දක්වා තිබුණි.

(උ) අධිකාරිය විසින් ජල්තර නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.මිලියන 17.65 ක් වූ වගකීම ප්‍රාග්ධන සංචිත යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඌ) ණය එකතු කරන්නන්ට ගෙවූ කොමිස්, විගණන ගාස්තු, බොල් හා අඩමාණ ණය වැනි මූල්‍ය වියදම් නොවන රු.මිලියන 117.73 ක් වෙනත් වියදම් මූල්‍ය වියදම් තුල ඇතුලත් කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම රු.මිලියන 520.22 ක් ජංගම නොවන වගකීම් යටතේ දැක්විය යුතු වුවත් එම වටිනාකම ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඒ) පශු සම්පත් මණ්ඩලයෙන් ගලහ වතු නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබී තිබුණු රු.මිලියන 13.31 ක් අදාල කාර්යය අවසන් කර වර්ෂ 05 ඉක්මවා තිබියදීත් ගිණුම්වල අවශ්‍ය ගැලපීම් නොකර වෙනත් ආධාර ගිණුමක් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඔ) බදු නිවාස හා නාගරික නිවාස යෝජනා ක්‍රමවල ඔප්පු ලබාදුන් නිවාසවල වටිනාකම ගණනය කර එය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම 2006 වර්ෂයේ සිටම නිවැරදිව නිරූපනය වී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී නිවාස යෝජනා ක්‍රම 08 කට අදාලව එලෙස ඉඩම් ඔප්පු ලබා දුන් නිවාස ඒකක ගණන 85 ක් විය.

(ඕ) 2005 වර්ෂයේදී උතුරු නැගෙනහිර ප්‍රදේශවලදී අස්ථානගත වූ රු.1,940,000 ක් වටිනා මෝටර් වහන 13 ක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් වෙන්කිරීම් ගිණුම්වල කර නොතිබුණි.

## 2.3.4 පැහැදිලි නොකල වෙනස්කම් හා නොසැසඳු ගිණුම්

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් ඊට අදාල උපලේඛනවල සඳහන් ශේෂයන් සමඟ සසඳා නොතිබුණු අතර ඒ අතර රු.මිලියන 10.39 ක වෙනසක් පහත දක්වා ඇති පරිදි නිරීක්ෂණය විය.

| අයිතමය | ගිණුම් අනුව | උපලේඛන අනුව | වෙනස |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| මහජන බැංකුව (උපහාර ණය වැඩ සටහන 2013) | 762.77 | 763.29 | 0.52 |
| ලංකා බැංකුව (උපහාර ණය වැඩ සටහන 2011) | 1,127.40 | 1,126.90 | 0.50 |
| මන්නාරම තුරියපල්ලිවාසල් ඉඩමේ වටිනාකම | 0.08 | - | 0.08 |
| රත්නපුර - නොතාරිස්වත්ත ඉඩමේ වටිනාකම | 19.41 | 10.20 | 9.20 |
| කොළඹ- බ්ලූමැන්ඩල් ඉඩමේ වටිනාකම | - | 0.09 | 0.09 |
| **එකතුව** | **1,909.66** | **1,900.48** | **10.39** |

(ආ) අධිකාරිය දිස්ත්‍රික් කාර්යාල සමඟ කටයුතු පවත්වා ගෙන ගිය ජංගම ගිණුම් අතර රු.431,700 ක් වූ වෙනස නිරවුල් කර නොතිබුණි.

## 2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අත්පත් කරගත් ඉඩම්වල වටිනාකම රු.මිලියන 212.07 ක් සහ රු.මිලියන 3.55 ක් වටිනා එකතු කළ අගය මත බදු විෂයයන්ට අදාල විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වසර අවසානයට මුළු ණයගැති ශේෂය වූ රු.මිලියන 3,656.48 කින් වසර 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ලැබිය යුතු ශේෂවල එකතුව රු.මි.2,406.6

ක් වූ අතර එය මුළු වටිනාකමින් සියයට 66 ක් විය. මෙම ණය මුදල් අයකර ගැනීමට අධිකාරිය ප්‍රමාණවත් පරිදි ක්‍රියා කර ඇති බවක් විගණනයේදී නිරීක්ෂණය නොවිණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරුවන්ට, වෙනත් බාහිර පාර්ශවයන්ට සහ නිලධාරීන්ට ලබාදුන් එකතුව රු.මිලියන 82.89 ක් වූ අත්තිකාරම් වලින් අදාල කාර්යය නිමවී වසර 02 කට වැඩි කාලයක් ඉකුත් වූ රු.මිලියන 80.24 ක් පියවා ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ණය හිමි වටිනාකම රු.මිලියන 1,609 ක් ව තිබූ අතර එයින් අවුරුදු 02 ත් අවුරුදු 05 ත් අතර ණය හිමි වටිනාකම රු.මිලියන 29.2 ක් ද වර්ෂ 05 කට වැඩි ණය හිමි වටිනාකම රු.මිලියන 1,057.26 ක් ද විය. මෙම ණය නිරවුල් කිරීමේ කිසිදු වැඩ පිළිවෙලක් විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ඈ) වෙනත් ආයතන 04 කින් ව්‍යාපෘති සඳහා ලබාගත් ණය සඳහා ගෙවිය යුතු හිග ණය වාරික රු.මිලියන 713.84 ක් හා හිග ණයපොළී රු.මිලියන 512.02 ක් දීර්ඝ කාලයක සිට නිරවුල් කර නොතිබුණු අතර එම හිග ණය හා පොළී ගෙවා නිදහස්වීමේ මූල්‍ය සැලැස්මක් ද දක්නට නොවීය.

(ඉ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ඉඩම් වන්දි වටිනාකම රු.මිලියන 324 ක් වූ අතර අධිකාරිය භුක්තිය භාරගත් දිනට වර්ෂ 05 කට වැඩි කාලයක සිට ගෙවිය යුතු ඉඩම් වන්දි වටිනාකම වූ රු.මිලියන 100 නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.මිලියන 6.28 ක සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙන් ලැබිය යුතු අත්තිකාරම් වටිනාකම සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී නොතිබුණි. එහෙත් ශේෂ සනාථ කරගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කරන ගැලපීම් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(උ) එක්සත් එමීර් රාජ්‍යයේ රෙඩ්ක්‍රසන්ට් සමාජය වෙත 1998 වර්ෂයේ දී නිවාස 60 කින් සමන්විත නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා අධිකාරිය විසින් ඇත්නාවල වත්තෙන් ලබා දී තිබූ පර්චස් 726.35 ක ඉඩම වෙනුවෙන් අධිකාරියට ලැබිය යුතු රු.5,297,604 ක මුදලින් රු.1,882,604 ක් අයකර ගැනීමට අධිකාරිය සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට සමත් වී නොතිබුණි.

(ඌ) 2001 වර්ෂයේ සිට පැවත එන රු.774,515 ක නැති වූ මුදල් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(එ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඔරුගොඩවත්තේ පිහිටි ඉඩමක ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම වෙනුවෙන් 2005 වර්ෂයේදී අධිකාරිය විසින් රු.මිලියන 39.9 ක් දැරීමෙන් පසුව එහි ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණ නමුත් එම මුදල තවදුරටත් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඒ) යාපනය දිස්ත්‍රික් කාර්යාලය විසින් සමුපකාර ණයදෙන සමිති නිවාස ණය ක්‍රමය (ටී.සී.සී.එස්) යටතේ ලබාදුන් රු.5,965,000 ක් වටිනා නිවාස ණය 1,468 කට අදාල ණය ලිපිගොනු අස්ථාන ගතවීම හේතුවෙන් එම ණය නැවත අයකරගැනීමේ හැකියාවක් අධිකාරියට නොමැති බව තහවුරු කරගෙන ඇතත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2013 වර්ෂය තුළදී ද ගෙන නොතිබුණි.

## 2.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත xiv වන පරිච්ඡේදය 114 වන වගන්තිය හා 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | උපයනවිට ගෙවීම් බදු අදාල නිළධාරීන්ගේ වැටුපෙන් අඩුකර ගෙවිය යුතු වුවද එසේ නොකර අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.117,300 ක මුදලක් බදු සඳහා ගෙවීම් කර තිබුණි. |
| (ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 555.07 ක් පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට බාහිරව කරන ලද ආයෝජනයේ වටිනාකම රු.මිලියන 34.85 ක් පමණක් විය. |
| (ඇ) 1971 අංක 38 දරන මුදල් පනත 11 (බී) වගන්තිය | මුදල් ආයෝජනය කිරීමේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගතයුතු වුවද අධිකාරිය විසින් කරන ලැබූ රු.මිලියන 540.6 ක ආයෝජන සම්බන්ධයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 | වාහන 11 කට අදාලව සිදුවූ අනතුරු සඳහා රු.457,234 ක අලහහානි හා අලාභහානි ඇස්තමේන්තු නොකල වාහන අනතුරු 12 කට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) උපහාර ණය නිකුත් කිරීමේ උපදෙස් මාලාවේ 7:3 සහ 7:4:1 වගන්තිය | ඉදිකරනු ලබන හෝ වැඩි දියුණු කරනු ලබන නිවස පිහිටි ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ණයකරුට හෝ කලත්‍රයාට තිබිය යුතු වුවත්, ණයලාභියාට නීත්‍යානුකූල අයිතියක් නොමැති වෙනත් පාර්ශවයකට අයිති ඉඩම්වල පිහිටි නිවාස වැඩිදියුණු කිරීම සඳහා අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකුට රු.975,000 ක ණය ලබා දී තිබුණි. |
| (ඊ) 2013 ජූනි 17 දිනැති අංක 13/0463/517/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | රාජ්‍ය සේවකයින්හට හා මධ්‍යම පාන්තිකයන්ට මිලදී ගැනීමට හැකි සාධාරණ මිලකට පෙර විකුණුම් පදනම මත වූ නිවාසවල මිල තීරණය කළයුතුවුවද අධිකාරිය විසින් එම නිවාස ඒකක මිල පහළ හෝ මධ්‍යම ආදායම්ලාභීන්ට මිලදී ගැනීමට නොහැකි ඉහළ අගයට තක්සේරු කර තිබුණි.<br>උදාහරණ - කොළඹ පාමංකඩ කවිරත්න පෙදෙසේ ඉදිකරන නිවසක වටිනාකම රු.මිලියන 33.2 ක් වූ අතර ඇල්විටිගල අදියර V යටතේ ඉදිකරන නිවසක වටිනාකම රු.මිලියන 15 ක් පමණ වී තිබුණි. |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3. 1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.232,602,241 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.303,405,460 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලය රු.73,803.219 කින් වර්ධනය වී තිබුණු අතර ඌනතාවය සියයට 23 කින් අඩුවීමකි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සැසඳීමේදි ණය පොළී ආදායම රු.327,239,161 කින් ඉහළ යාම, ඉඩම් හ නිවාස විකුණුම් ආදායම රු.139,732,510 කින් ඉහළ යාම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට මූලිකවම හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම් සියයට 19 කින් වැඩිවී තිබුණි.)
ii. නිවාස සහ ඉඩම් විකුණුම් ලාභ පිළිවෙලින් සියයට 42 කින් සහ 50 කින් ඉහළ ගොස් තිබුණි.
iii. සහාධිපත්‍ය දේපළ අළුත්වැඩියා කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 245.27 මත ආදායම සියයට12 කින් ඉහළ ගොස් තිබුණි.
iv. අධිකාරිය විසින් බැංකු ණය සඳහා පොලීගෙවීම මත මූල්‍ය වියදම පෙර වසරට සාපේක්ෂව සියයට 72 ඉහළ ගොස් තිබුණි.
v. සමාලෝචිත වසරේ ශුද්ධ අලාභය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක් විය.
vi. සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ජංගම අනුපාතය 1:1.12 ක්ද ක්ෂණික වත්කම් අනුපාතය 1:1.29 ක් ද වී තිබුණි. එබැවින් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන ඌනතාවයක් අධිකාරියට තිබූ බව ඉන් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ,

(අ) ජනසෙවන විරුගම්මාන, විසිරි නිවාස, උපහාර නිවාස ණය හා සසුනෙන් සෙවන නිවාස වැඩ සටහන්වල වැඩ නිමකරන ලද ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 1 ත් සියයට 15 ත් අතර ප්‍රමාණයක පැවතුණි.

(ආ) "සහශ්‍ර ලංකා" (ආයෝජන ව්‍යාපෘති, රාජ්‍ය පෞද්ගලික දායකත්ව නිවාස) ව්‍යාපෘතිය යටතේ නිවාස යෝජනා ක්‍රම 14 ක රු.මිලියන 22,369 ක් වටිනා නිවාස ඒකක 3,152 ක් ඉදිකිරීමට සැලසුම් කල ද, වැඩ ආරම්භ කල නිවාස යෝජනා ක්‍රම ගණන 02 ක් වූ අතර රු.මිලියන 1,196.5 ක් වටිනා නිවාස යෝජනා ක්‍රම 02 ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට එක් නිවාසයක්වත් ඉදිකිරීම අවසන් කර නොතිබුණි.

(ඇ) සහශ්‍ර ලංකා නිවාස වැඩසටහන (ඍජු ඉදිකිරීම් හා නැවත පදිංචි කිරීම්)

i. නිවාස ඒකක 60 ක් රු.මිලියන 250 කින් සෑදීමට සමාලෝචිත වර්ෂයේ දී සැලසුම් කලද කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේ ප්‍රමාදය මත ඉන් කිසිදු නිවාස ඒකකයක වැඩ ආරම්භ කර නොතිබුණි.

ii. 2011 වර්ෂයේදී වැඩ ආරම්භ කරන ලද හා සමාලෝචිත වර්ෂයේදී වැඩ නිම කිරීමට සැලසුම් කල යක්කල සියනෑ උයන නිවාස ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන්හට මුදල් ගෙවීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 49 ක් පමණ විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වන්දි ගෙවිය යුතු ඉඩම්, ඉඩම් අත්කරගැනීමේ පනතේ 38(අ) වගන්තියට අනුව අධිකාරිය විසින් භුක්තිය භාරගෙන තිබුණු නමුත් ගැටළු සහගත තත්ත්වයන් මත ඇතැම් ඉඩම් අධිකාරියට පවරා ගැනීමට විශාල කාලයක් ගත වී තිබුණු අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගෙවිය යුතු වන්දි මුදල රු.41,958,932 ක් වූ අතර ඒ සඳහා ගෙවිය යුතු හිඟ පොලිය රු.52,221,612 ක් විය.

(ආ) නිවාස යෝජනා ක්‍රම ඉදිකිරීමට ප්‍රථම අදාල පළාත් ආයතන මගින් නිවාස සැලසුම් අනුමත කරවා නොගෙන නිවාස ඉදිකිරීම හේතුවෙන් සමාලෝචිත වසර අවසානයට නිවාස යෝජනා ක්‍රම 26 ක නිවාස ඒකක 1,986 කට අදාල අනුකූලතා සහතික ලබාගැනීම ප්‍රශ්නකාරී වී තිබුණි. එම හේතුව නිසා නිවාස යෝජනා ක්‍රමයන්ට අදාල නිවාස, නිවාස හිමියන්ට පැවරීමක් සිදුකර කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකිවීම නිසා එම නිවාස යෝජනා ක්‍රමවල නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු තවදුරටත් අධිකාරියටම කරගෙන යාමට සිදුවී තිබුණි. ඒ අනුව එවැනි නිවාස යෝජනාක්‍රමවල නඩත්තු කටයුතු වෙනුවෙන් රු.මිලියන 13.57 ක් ද අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.මිලියන 245.6 ක් ද සමාලෝචිත වර්ෂයේදී වැය කිරීමට අධිකාරියට සිදු වි තිබුණි. මූලිකව අවධානය යොමු වියයුතු කරුණු කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු නොකිරීම මෙයට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවුල් 507 කට සූර්ය බල පද්ධති ලබාදිම සඳහා 1989 - 1994 වසරවලදී ලබා දී තිබූ ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවීමට ඇති රු.4,104,961 ක් වූ ශේෂය අයකර ගැනීමට නිශ්චිත වැඩ පිළිවෙලක් අධිකාරියට නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) මහනුවර මහ නගර සභාව සතු ඉඩමක අධිකාරිය විසින් ඉදිකර තිබූ නිවාස 32 කින් සමන්විත මහයියාව නිවාස ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 20 ක ඉදිකිරීම් පිරිවැයක් දරා තිබුණද ඊට අදාල මුදල් මහනුවර මහ නගර සභාවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට අධිකාරිය සමත් වී නොතිබුණි.

(ඉ) 2010 වර්ෂයේ සිදුකරන ලද ඉඩම් සමීක්ෂණ වාර්තාව අනුව අධිකාරියට අයත් ඉඩම් හෙක්ටයාර් 645.66 ක් හඳුනාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් අනවසර පදිංචි ඉඩම් හෙක්ටයාර් 208.75 ක් ඇති බවට හඳුනාගෙන තිබුණි. එමෙන්ම උතුර පළාතට අයත් දිස්ත්‍රික්ක 05 ක ඉඩම් පිළිබඳව සමීක්ෂණයක් ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකර නොතිබුණි.

(ඊ) පිරිවැය රු. මිලියන 22.52 ක් වූ වෙන්කළ නිවාස 11 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට වෙන්කර තිබුණ ද ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් අයකර ගැනීමට තිබූ වටිනාකම වූ රු.මිලියන 47.66 ක් අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඌ) 1991 වර්ෂයේදී සියයට 15 ක වාර්ෂික පොළී ප්‍රතිශතයකට ජනාධිපති අරමුදලින් ලබාගත් රු.මිලියන 250 ක ණය මුදලින් ගෙවීමට එකඟ වූ රු.මිලියන 195 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට අධිකාරිය අසමත් වී තිබුණි. විධිමත් පරිදි ණය වාරික නොගෙවීම මත එදිනට හිඟ ණය සහ පොළී ශේෂය රු.මිලියන 286.66 ක් විය. තවද, එසේ වුවද ගෙවිය යුතු ඉහළ පොළී ප්‍රතිශතය අඩුකර ගැනීමටද අධිකාරිය කිසිදු උත්සාහයක් දරා ඇති බවක් විගණනයේදී නිරීක්ෂණය නොවිනි.

(ඌං) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී නිවාස කුලී ආදායම් වශයෙන් රු.මිලියන 22.61 ක් රැස්කර තිබුණ අතර ඉකුත් වර්ෂයට අනුරූපී ආදායම රු.මිලියන 38.98 ක් විය. එලෙස අඩු ආදායම් තත්ත්වයක් පෙන්නුම් කිරීමට හේතුව බදු කුලී ආදායම් වර්තමාන තක්සේරුවට අනුගත වන ලෙස සංශෝධනය නොකිරීම, පාරිසරික සාධක සැලකිල්ලට ගෙන ඊට ගැලපෙන විවිධාංගීකරණය වූ ගාස්තු ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම වැනි දෑ හේතු වී තිබුණි.

## 4.4 බදු කළමනාකරණයේ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 නොවැම්බර් 07 දිනැති හා අංක 409032877 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට අදාලව අධිකාරියට එවන ලද ලිපියට අනුව අධිකාරියේ එකතු කල අගය මත බදු අංකය යටතේ 2009 හා 2010 වර්ෂවලට අදාලව ගෙවිය යුතු රු.මිලියන 15.33 ක බදු මුදල සහ ඊට අදාල රු.මිලියන 7.12 ක දඩ මුදල ගෙවීමට හෝ නිරවුල් කර ගැනීමට 2014 ඔක්තෝබර් 31 දක්වාම අධිකාරිය පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 22.45 ක විලම්භිත බදු බැරකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නැවත අයකර ගැනීමට හෝ හිලව් කරගැනිමට කටයුතු කර නොතිබූ 2003,2004 සහ 2005 යන වර්ෂවලට අදාලව වැඩිපුර ගෙවන ලද රු. මිලියන 14.38 ක වැට් බදු මුදල් තවදුරටත් ලැබිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණි.

## 4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අධිකාරියේ මූලික කාර්ය වනුයේ ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුරක්ෂිත නිවසක් හිමිකරදීම වුවත් ඒ සම්බන්ධව කටයුතු කිරීමේ දී පහත සඳහන් දුර්වලතා අනාවරණය වූ බැවින් කළමනාකරණයේ අවධානය ඒ කෙරෙහි යොමු වී නොමැති බව නිරීක්ෂණය විය.

(අ) 93 වත්ත නිවාස ව්‍යාපෘතියේ රු.6,195,522 ක් වටිනා නිවසක් වෙනුවෙන් 2005 ජනවාරි 19 දින රු.1,000,000 අත්තිකාරම් මුදල් ලබාගෙන තිබුණද ඒ සඳහා විකුණුම් ගිවිසුමකට එළඹ ඉතිරි මුදල් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) අධිකාරියට අයත් හෝමාගම ජල්තර සහ දියවන්නා ගාර්ඩින්ස් යන නිවාස යෝජනා ක්‍රමවල නිවාස 02 ක් නිවාස බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයෙන් බැහැරව කිසිදු ගිවිසුමකින් තොරව පුද්ගලයින් තිදෙනෙකු වෙත අත්තිකාරම් මුදලක් හෝ ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට පදිංචිය සඳහා නිදහස් කොට තිබුණි.

(ඈ) මහනුවර දිස්ත්‍රික් කාර්යාලය විසින් නිවාස ඒකක 16 කින් සමන්විත ගලහ නිවාස යෝජනා ක්‍රමය සඳහා 1998 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා රු.මිලියන 2.67 ක් වියදම් දැරීමෙන් පසු එහි ඉදිකිරීම් කටයුතු නතර කර 2004 වර්ෂය දක්වාම ඒ සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් නොයොදා අකර්මන්‍යව තිබීම හේතුවෙන් ඒවා අනවසර පදිංචිකරුවන් විසින් බලහත්කාරයෙන් අත්කර ගෙන මේ දක්වාම එහි පදිංචි වී ඇත.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් වාර්තා අනුව රු.2,135,939 ක් වටිනා නොවිසඳුණු බැංකු සටහන් 11 ක් ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල 07 ක තිබුණද ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වතු නිවාස වැඩ සටහන සඳහා ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් 2008 වර්ෂයේදී ලැබුණු රු.756,785 ක මුදලක් අධිකාරිය විසින් මිල්ලකන්ද සහ ප්‍රොසෙස්ටර් යන වතු නිවාස ව්‍යාපෘති සඳහා වැවිලි මානව සංවර්ධන භාරය වෙත මුදාහැර තිබුණද එම අංශ විසින් අදාල ව්‍යාපෘති සමාලෝචිත වසර අවසානවන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. එහෙත් ඒ පිළිබඳ කිසිදු පසුවිපරමක් අධිකාරිය විසින් කර නොතිබුණි.

(ඊ) වසර 04 කට පෙර නිමකර තිබූ නිවාස 13 ක් හා සාප්පු 08 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විකිණීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

නාගරික සංවර්ධන අධිකාරියට අයත් රත්නපුරයේ පිහිටි ගල්කඩුවවත්ත නැමති ඉඩම අත්පත් කර ගැනීම වෙනුවෙන් 2000 අප්‍රේල් 19 දින ලබාගත් තක්සේරුව මත රු.මිලියන 8.69 ක මුදලක් 2012 මාර්තු 20 දින ගෙවා තිබුණ ද ලබාගත් මෙම තක්සේරුව වර්ෂයකට පමණක් සීමාවන බැවින් හා අදාල ගෙවීම කිරීමට අධිකාරියට වර්ෂ 12 ක කාලයක් ගතවූ බැවින් එකී ඉඩමේ 2012 වර්ෂයට අදාල නව තක්සේරු වටිනාකම වන රු.මිලියන 145 ක් ගෙවන ලෙසට නාගරික සංවර්ධන අධිකාරිය දන්වා තිබුණි. එහෙත් එම ඉඩම පවරා ගැනීම හෝ අත්හැරීම පිළිබඳව අවසන් නිගමනයකට 2014 දෙසැම්බර් 31 දින වන විටත් අධිකාරිය එළඹ නොතිබුණි.

## 4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2008 සිට 2012 දක්වා වර්ෂවලට අදාල විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති පරිදි ඩාර්ලි පාරේ පිහිටි අක්කර 01 පර්චස් 26.5 කින් යුත් ඉඩම නිවාස සංවර්ධන අධිකාරිය සහ පෞද්ගලික සමාගමක් සමඟ එළඹි බද්ධ ව්‍යාපාර ගිවිසුමකට අනුව නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා වෙන්කර තිබුණ ද එම බද්ධ ව්‍යාපාර ගිවිසුම 2014 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එකී ඉඩම 2008 වර්ෂයේ සිට නිෂ්කාර්යව තිබුණි.

## 4.7 ණය පාලනය

සමාලෝචිත වර්ෂය අවසානයට නිවාස ණයවැඩ සටහනේ ණයගැති ශේෂය හා ප්‍රාග්ධන ශේෂය පිළිවෙලින් රු.මිලියන 2,531.53 ක හා රු.මිලියන 11,269.34 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පිළිවෙලින් රු.මිලියන 2,412.31 ක් හා රු.මිලියන 8,223.61 ක් විය.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වසර තුල සත්‍ය අයකිරීම් රු.මිලියන 2,385.75 ක් වූ අතර එය අයවැයගත අයවීම් ප්‍රමාණයෙන් සියයට 74 ක් විය.

(ආ) අධිකාරිය විසින් අයවැයගත ණය අයකිරීම් ප්‍රමාණය තීරණය කිරීමේ දී සැලකිල්ලට භාජනය කර ඇත්තේ මුළු ණයගැති ශේෂයෙන් සියයට 73 ක් වන ණයගැති සංඛ්‍යාවක් වන බැවින් එය ණය කළමනාකරණ පද්ධතියේ දුර්වලතාවයක් විය.

(ඇ) සමාලෝචිත වසර තුල අක්‍රීය ණයගැති සංඛ්‍යාව මුළු ණයගැති සංඛ්‍යාවෙන් සියයට 78 ක් පමණ විය.

(ඈ) ණය එකතු කිරිමේ කොමිස් සඳහා රු.මිලියන 57.34 ක පමණ පිරිවැයක් දරා තිබුණද මුළු ණයගැති වටිනාකමින් වසර 03 ට වැඩි ණය වටිනාකම සියයට 76 ක් පමණ වී ඇති අතර ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දි සමාලෝචිත වසරේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 5.8 ක් විය.

(ඉ) උපහාර ණය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය රාජ්‍ය බැංකුවලින් මුදල් ණයට ලබා ගෙන තිබූ අතර පොලියත් සමඟ මාසික ණය වාරික (අධිකාරියට නිසි පරිදි ණය මුදල් අය නොවුවද) අධිකාරිය විසින් නියමිත දිනට බැංකු වෙත ගෙවීමට ගිවිස ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණයලාභීන් විසින් අධිකාරියට ගෙවීම් හිඟ හිටි රු.මිලියන 125.19 ක් අධිකාරියේ අරමුදල්වලින් බැංකු වෙත ගෙවා තිබුණි.

## 4.8 අධිකාරියේ සම්පත් වෙනත් රාජ්‍ය ආයතන වෙත පැවරීම

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදයේ විධානයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයට රේඛීය අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජකාරි සඳහා යොදවන ලද නිලධාරීන්/ සේවකයින් 19 දෙනෙක් වෙත ගෙවා තිබුණ වැටුප රු.මිලියන 6.41 ක් විය. ඊට අමතරව රේඛීය අමාත්‍යාංශය වෙත වාහන 06 ක් ද ලබා දී තිබුණි.

(ආ) වෙනත් රාජ්‍ය ආයතනවල රාජකාරි කටයුතුවල යොදවා ඇති අධිකාරයේ සේවකයන් හා නිලධාරීන් වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට අධිකාරියට අයවීමට ඇති මුදල රු.මිලියන 71.84 ක් විය. එයින් රු.මිලියන 18.43 ක් වර්ෂ 02 කට වැඩි කාලයක් ගතවී තිබූ අතර තවත් රු.මිලියන 46.69 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවී නොමැති බව නිරීක්ෂණය විය

## 4.9 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ මානව සම්පත් සැලැස්මට අනුව අනුමත කාර්ය මණ්ඩලය 2,493 ක් ලෙස සඳහන් වුවද 2013 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 1,375 ක් විය. එහෙත් එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 2,307 ක් වූ බැවින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සමස්ථ සේවකයින් 932 ක් සේවයේ යොදවා ඇති බව නිරීක්ෂණය විය. මෙම අතිරික්ත කාර්ය මණ්ඩලය තුළ දෛනික දීමනා ගෙවීමේ පදනම මත බඳවාගත් නිලධාරීන් 476 ක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 42 ක් ද විය.

(ආ) 2003 ජූනි 03 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තියට පටහැනිව නිලධාරීන් 24 දෙනෙකු මාස 01 සිට අවුරුදු 07 දක්වා කාලයක් වැඩ බැලීම සහ රාජකාරි ආවරණය කිරීම සඳහා යොදවා තිබුණි.

## 5. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

(අ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව ඒ ඒ වර්ෂය අවසානයට සංයුක්ත සැලැස්මේ කාර්යයන් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය හා ක්‍රියාත්මක නොවුණු හා මන්දගාමී අංශ පිළිබඳ ඇගැයීම් කර ඉදිරි ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාවක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් 2013-2017 කාල පරිච්ඡේදය වෙනුවෙන් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දුර්වලතාවයක් ලෙස ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බව හඳුනාගෙන ඇතත් සමාලෝචිත වර්ෂයේ අවසානයට පුරප්පාඩුව පැවති අත්‍යාවශ්‍ය වෘත්තීයවේදීන් ගණන 08 ක් පමණ විය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට අනුව නිවාස ඒකක 40,169 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වසර අවසාන වන විට නිවාස ඒකක 21,290 ක් හෙවත් සියයට 53 ක් ලඟා කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇතැම් දිස්ත්‍රික් කාර්යාල වර්ෂ කිහිපයකින්ම විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) වාර්ෂික විගණන වැඩ සටහනෙහි ඇතළත් කාර්යභාරයන් තුළ කාර්ය සාධන විගණනයට ප්‍රමාණවත් අවධානයක් යොමුව නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 48 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසානයට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 21 ක් විය.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5.5 වාර්ෂික වාර්තා

අධිකාරිය විසින් 2012 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

අධිකාරිය සතු ලිබර්ටි ප්ලාසා සංචාරක බංගලාව ඕවීඩීසී ආයතනයට විකිණීමේ දී රජයේ තක්සේරුවක් ලබා නොගෙන අධිකාරියේ තක්සේරුකරුගේ තක්සේරුව මත පමණක් පිහිටා කටයුතු කර තිබුණි. නමුත් මෙම දේපළට අදාලව පසුව ලබාගත් රජයේ තක්සේරුකරුගේ තක්සේරුව රු.11,520,000 ක් වුවද, ඕවීඩීසී ආයතනය විසින් ගෙවූ මුදල රු.9,000,000 ක් විය. මේ සම්බන්ධයෙන් 2012 නොවැම්බර් 23 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡාවට ලක් වූ අතර එම කාරක සභා රැස්වීම් නියෝගයට අනුව අයථා ගණුදෙනුවට සම්බන්ධ වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගන්නා ලෙස දන්වා තිබුණද 2014 සැප්තැම්බර් 30 දින වන විටත් එලෙස කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) කොන්ත්‍රාත් පාලනය සහ ප්‍රගති සමාලෝචනය
(ආ) අත්තිකාරම්
(ඇ) ඉන්වෙන්ට්‍රි පාලනය
(ඈ) ගිණුම්කරණය
(ඉ) මානව සම්පත් කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)